

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயற்திறன் அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2023

වාරිමාර්ග අමාත්‍යාංශය
நீர்ப்பாசன அமைச்சு
Ministry of Irrigation

වැය ශීර්ෂ - 198

වාරිමාර්ග අමාත්‍යාංශය

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

අන්තර්ගතය

වැය ශීර්ෂ අංකය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය

පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01
පරිච්ඡේදය 02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	07
පරිච්ඡේදය 03	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	88
පරිච්ඡේදය 04	කාර්යසාධන දර්ශක	94
පරිච්ඡේදය 05	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	95
පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	99
පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	101

ඇමුණුම්

ඇමුණුම I	වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති
ඇමුණුම II	ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන්
ඇමුණුම III	විගණකාධිපතිවරයාගේ වාර්තාව (වාරිමාර්ග අමාත්‍යාංශය)

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

වාරිමාර්ග අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය පිණිස සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබන අමාත්‍යාංශයකි.

කෘෂිකාර්මික සංවර්ධනය තුළින් රටෙහි ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම උදෙසා වාරි ජලය සැපයුමත්, ඉන් ඔබ්බට යමින් පානීය, කාර්මික හා විදුලි උත්පාදන යන බහුවිධ අරමුණු ඔස්සේ ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණයත් තුළින් සිය කාර්යභාරය වඩාත් පුළුල් කිරීමට කටයුතු කර ඇති වාරිමාර්ග අමාත්‍යාංශය කාර්යක්ෂම ලෙස එම කාර්යයන් ඉටු කිරීම සඳහා තවදුරටත් කටයුතු කරයි.

ඒ අනුව, මධ්‍යම හා මහා වාරි කලාප ආශ්‍රිතව ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් ඔස්සේ ගොවි ප්‍රජාව සවිබල ගැන්වීමත්, ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් එහි ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පවත්වා ගැනීමත් සඳහා විවිධ වැඩසටහන් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවිණි.

වාරිමාර්ග අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමෙහිලා අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අනුබද්ධිත ආයතන වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග කළමනාකරණ අංශය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) සහ මහවැලි උපදේශක සේවා කාර්යාංශය (MCB) මඟින් මහඟු දායකත්වයක් ලැබිණි.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1. දැක්ම

> ‘‘තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම’’

1.2.2. මෙහෙවර

> ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් බහුවිධ අවශ්‍යතා ඉටුකරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවත්ම සැලසීම

1.2.3. අරමුණු

i. රටේ සියලු ජල පරිභෝජන හා බලශක්ති අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ජල සම්පත සංවර්ධනය හා කළමනාකරණය

ii. ඉඩම් හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

iii. ගංගා ද්‍රෝණි හා ජල මූලාශ්‍ර සංරක්ෂණය මගින් ජලයේ ගුණාත්මක බව හා තිරසාර බව ආරක්ෂා කිරීම.

iv. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අවශ්‍ය වාරි ජල හා කෘෂිකාර්මික උපදේශන පහසුකම් සැලසීම

v. සියලු ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය ආරක්ෂිත ගෘහස්ත ජල සැපයුමක් තහවුරු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම

vi. පාරිසරික සමතුලිතතාව හා සංවර්ධනය සඳහා අවශ්‍ය ජල පහසුකම් සැලසීම

vii. වාරි පද්ධති ආශ්‍රිත ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ තිරසාර බව තහවුරු කිරීම

viii. කර්මාන්ත, සංචාරක සේවා අංශ වල ජල අවශ්‍යතා සපුරාලීම

ix. ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය

x. මහවැලි විශේෂ ආර්ථික බලප්‍රදේශ මඟින් ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රීය දායකත්වයක් ලබාදීම

1.3. ප්‍රධාන කාර්යයන්

i. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය හා ඇගයීම.

ii. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබාදීම.

iii. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය.

iv. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුළුව වාරිමාර්ග පද්ධති හා ගංගා ද්‍රෝණි කළමනාකරණය

v. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.

vi. වේලි ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම.

vii. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන් කිරීමසඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරීම.

viii. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපාය මාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ix. ගොඩබිමට කරදිය ගලා ඒම වැළැක්වීමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

x. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.

xi. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.

xii. රාජ්‍ය අංශයේ ප්‍රධානතම ඉදිකිරීම් සේවා සැපයුම්කරු ලෙස ප්‍රමිතිගත ඉදිකිරීම් කාර්යයන්හි නිරතවීම.

xiii. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.

xiv. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.


xv. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xvi. ජාතික විදුලිබල සැපයුමෙහි ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරු ලෙස මහවැලි ජලාශ පද්ධති කළමනාකරණය

xvii. දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස මහවැලි විශේෂ බල ප්‍රදේශ හරහා ලබාදෙන දායකත්වය පුළුල් කිරීම

xviii. දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම.

1.4. සංවිධාන සටහන


ලේකම්
වාරිමාර්ග අංශය
මහවැලි අංශය
ජ්‍යෙෂ්ඨ
අතිරේක ලේකම් ශ්‍රී.ලං.ප.සේ. - විශේෂ (03)
අතිරේක ලේකම් ශ්‍රී.ලං.ඉං.සේ. - විශේෂ (03)
අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී.ලං.ඉං.සේ. - විශේෂ (01)
අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී.ලං.ක්‍රු.සේ. – විශේෂ (01)
අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී.ලං.කෘ.සේ. - විශේෂ (01)
ප්‍රධාන මූල්‍ය නිලධාරි ශ්‍රී.ලං.ගණ.සේ. – විශේෂ (01)
අතිරේක ලේකම් ශ්‍රී.ලං.ප.සේ. - විශේෂ (01)
අතිරේක ලේකම් ශ්‍රී.ලං.ඉං.සේ. - විශේෂ (01)
ජෝ. ස.ලේ. ශ්‍රී.ලං.ප.සේ. - I (02)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. - I (01)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ඉ.සේ. - I (06)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍රු.සේ.- I (01)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කෘ.සේ. - I (01)
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. - I (02)
ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී.ල.ග.සේ. - I (01)
ජෝ. ස.ලේ. ශ්‍රී.ලං.ප.සේ. – I (01)
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. - I (01)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ඉ.සේ. - I (01)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍රු.සේ.- I (01)
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කෘ.සේ. - I (01)
සහ.ලේ. ශ්‍රී.ලං.ප.සේ II/III (02)
ස.අ./නි.අ. ශ්‍රී.ලං.ප.සේ. II/III (01)
නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත) (01)
ස.අ./නි.අ. ශ්‍රී.ලං.ඉ.සේ. II/III (09)
ස.අ./නි.අ. ශ්‍රී.ලං.ක්‍රු.සේ. II/III (02)
ස.අ./නි.අ. ශ්‍රී.ලං.කෘ.සේ. II/III (02)
ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. II/III (02)
අභ්‍ය. විගණක ශ්‍රී.ල.ග.සේ. II/III (01)
සම්බන්ධීකරණ ලේකම් - තාවකාලික (01)
සහ.ලේ. ශ්‍රී.ලං.ප.සේ II/III (02)
ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. II/III 01
අභ්‍ය. විගණක ශ්‍රී.ල.ග.සේ. II/III 01
ස.අ./නි.අ. ශ්‍රී.ලං.ඉ.සේ. II/III 02
ස.අ./නි.අ. ශ්‍රී.ලං.ක්‍රු.සේ. II/III 01
ස.අ./නි.අ. ශ්‍රී.ලං.කෘ.සේ. II/III (01)
පරිපාලන නිලධාරී කළ.සේ.නි.සේ. විශේෂ (01)
භාෂා පරිවර්තක - විශේෂ I (02)
තොරතුරු හා සන්නිවේදන තාක්. නිලධාරී I/II (01)
පරිපාලන නිලධාරී කළ.සේ.නි.සේ. විශේෂ (01)
තෘතීයික
සංවර්ධන නිලධාරී I/II/III (111)
සංවර්ධන සහකාර I/II/III (12)
සැලසුම් ශිල්පී I/II/III (01)
ඉංජිනේරු සහකාර (දෙපාර්තමේන්තුගත) I/II/III (01)
කළ. සේවා නිලධාරී I/II/III (26)
තොරතුරු හා සන්නිවේදන තාක්. සහකාර I/II/III (01)
සංවර්ධන නිලධාරී I/II/III (143)
ඉංජිනේරු සහකාර (දෙපාර්තමේන්තුගත) I/II/III (01)
කළ. සේවා නිලධාරී I/II/III (09)
තොරතුරු හා තාක්. සහකාර I/II/III (01)
ද්විතියික
රියදුරු I/II/III (17)
නිශ්චල ඡායාරූප ශිල්පී (දෙපාර්තමේන්තුගත) (01)
ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්. ශිල්පී (දෙපාර්තමේන්තුගත) (01)
සංස්කාරක (දෙපාර්තමේන්තුගත) (01)
කාර්මික (දෙපාර්තමේන්තුගත) (01)
කළ. කාර්ය සහයක I/II/III (22)
රියදුරු I/II/III (08)
කළ. කාර්ය සහයක I/II/III (08)
ප්‍රාථමික

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ අරමුදල්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- වාරිමාර්ග කළමනාකරණ අංශය
- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
- මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව
- මහවැලි උපදේශක සේවා කාර්යාංශය

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම	ආ) දායක නියෝජිතායතනය	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම් (රු. මිලි.)	ඈ) ව්‍යාපෘති කාල සීමාව
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන(MWSIP)	ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා ජනරජය	160,356.00 (සංශෝධිත) (ඇ.ඩො.මි. 976) (ආසියානු සංවර්ධන බැංකුව විසින් සහතික කළ ණය මුදල - ඇ.ඩො.මි. 557.50)	2015 – 2025 ජුනි
උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය (2015 වසරේ සිට දේශීය අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවේ)	ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව	99,100.00 (සංශෝධිත) ඇ.ඩො.මි. 514.06 (මූලස්ථායී - රු.මි. 89,748.00)	2010 මාර්තු - 2024 මාර්තු
මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය	CDB, SFD, KFAED, OFID, GoSL	120,700.00 (ඇ.ඩො.මි. 770.41)	2007 ජනවාරි - 2024 මාර්තු
දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA)	ලෝක බැංකු ණය පහසුකම්	18.600.00 (ඇ.ඩො.මි. 93)	2021 ඔක්තෝම්බර් - 2026 ඔක්තෝම්බර්
ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින්ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)	හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය	10,416.00 ඇ.ඩො.මි. 52.08 (ඇ.ඩො 1 = රු. 200)	2017 ජුනි - 2024 ජුනි
ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	ලෝක බැංකුව	13,939.30 (ඇ.ඩො.මි. - 45.03)	2021 මැයි - 2025 මැයි

අ) ව්‍යාපෘතියේ නම	ආ) දායක නියෝජිතායතනය	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම් (රු. මිලි.)	ඈ) ව්‍යාපෘති කාල සීමාව
නාච්චාදුව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමේ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා ජනරජය / ජපාන පරිත්‍යාගය (JIID)	156.00	2020 - 2023
නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) GCF Knuckles	හරිත දේශගුණ අරමුදල / ශ්‍රී ලංකා රජය - සම මූල්‍ය දායකත්වය	14692.00 (ඇ.ඩො.මි.48.975)	2023 ජනවාරි - 2029 ජනවාරි

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1. විශේෂ කරුණු හා ප්‍රගතිය

ප්‍රෞඩ වාරි උරුමයකින් සමන්විත ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය නඟා සිටුවීම උදෙසා ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය මඟින් මහඟු පිටු වහලක් ලබා දෙන්නා වූ වාරිමාර්ග අමාත්‍යාංශය ජාතියේ ප්‍රධාන ආහාරය වන "බත" සැපයීම වෙනුවෙන් වූ වී වගාව සඳහා ජලය සැපයීම ඇතුළුව ලංකාවේ සියළු ප්‍රදේශයන් සඳහා විවිධ අවශ්‍යතාවන්ට ජලය සැපයීම සිදු කරනු ලබයි.

එසේම ලංකා භූමිය පුරා පැතිරී ඇති ජලාශ හා වාරිමාර්ග පද්ධති මෙහෙයුම් නඩත්තු හා සංරක්ෂණ කටයුතු වලට අමතරව වාරිමාර්ග පද්ධතින් වැඩි දියුණු කිරිමටද ඉන් ඔබ්බට රටේ පානීය ජල අවශ්‍යතාවය සැපිරීමට හා විදුලිබල උත්පාදනය සඳහා වූ ජලය සැපයීමද වාරිමාර්ග අමාත්‍යාංශයේ කාර්යභාරයකි.

රට තුළ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති අතුරින් උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලස්ථායී වැඩ සංරචකයෙහි වැඩ කටයුතු 2023 වර්ෂයේ මැද භාගයේදී අවසන් වීමට නියමිතව තිබුණද රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ 2024 වර්ෂයේ මැද භාගය දක්වා කාල දිගුවක් ලබා ගැනීමට සිදු වූ අතර ඩයරබා ජලාශයේ වැඩ අවසන් කර ජලයෙන් පිරවීම, උමා ඔය ප්‍රධාන උමගේ වැඩ අවසන් කර ජලය සැපයීම ආරම්භ කිරීම හා විදුලි බලාගාරයේ එක් විදුලි ජනක යන්ත්‍රයක් සක්‍රිය කර ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 60ක විදුලි ධාරිතාවක් එකතු කිරිමට සමත් වීම මෙම ව්‍යාපෘතියේ ජයග්‍රහණයන්වේ.

2020 වර්ෂයේ සිට පැවති ආර්ථික අර්බුදයන්ගේ උච්චතම අවස්ථාවට මුහුණ දීමට 2023 වර්ෂයේදී සිදු වීම හේතුවෙන් බොහෝ ව්‍යාපෘති අවසන් කිරිම හෝ තාවකාලිකව නැවැත්වීමට සිදු විය. අග්‍රාමාත්‍ය ලේකම් මුලසුන දැරූ ජාතික මෙහෙයුම් මැදිරිය මඟින් ගත් තීරණ වලට අනුව අත්‍යාවශ්‍ය ව්‍යාපෘති හා විදේශ ආධාර හෝ විදේශ ණය මත කෙරෙන ව්‍යාපෘති පමණක් තව දුරටත් කරගෙන යන අතර තාවකාලිකව නවත්වන ලද ව්‍යාපෘති රටේ ආර්ථික තත්ත්වය යහපත් වූ වහාම ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ක්‍රියාත්මක කළ යුතු ලෙස හඳුනාගත් පහත සඳහන් ව්‍යාපෘති 2023 වසරේදී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ කිලෝමීටර් 74ක්වූ මිණිපේ වම් ඉවුරු ඇළෙහි ඉදිකිරීම් කටයුතු මුළුමනින්ම අවසන් කර මිණිපේ අමුණ ජනතා අයිතියට පත් කර ඇත. එසේම ආසියානු සංවර්ධන බැංකුව හා රජයේ පොදු එකඟතාව මත උමඟේ දෙවන පස් විදුම් යන්ත්‍රයමඟින් වැඩ ආරම්භ කිරීම ව්‍යාපෘතිය කාර්යක්ෂම වීමට හේතුවක් වී ඇත.

ග්‍රාමීය කුඹුරු හා යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙමින් ගොවි ජනතාවට හා සාමාන්‍ය මහජනතාවට මහඟු සේවයක් සලසන දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA) සහ ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) යන ව්‍යාපෘතීන්ද රටේ සුළු වාරි කර්මාන්තය නඟා සිටුවීමට උරදෙන දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහාවූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) ද ව්‍යාපෘතීන්හි ඉලක්ක සපුරා ගැනීම සඳහා නිරන්තර කාර්යභාරයක් සිදු කරමින් සිටී.

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගතකොට දැක්විය හැකිවේ.

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 160,356.00 (සංශෝධිත වැඩසටහන් පිරිවැය - ඇ.ඩො.මි. 976.00, ආසියානු සංවර්ධන බැංකුව විසින් සහතික කළ ණය මුදල - ඇ.ඩො. මි. 557.50)	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා තීව්‍රතාවය (හෙක්ටයාර)**	ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - ඝන මීටර මිලියන 190 (වසරකට) • වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - ඝන මීටර මිලියන 130 (වසරකට) වගා තීව්‍රතාවය (හෙක්ටයාර) • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 12,300 • වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 13,000 • මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 7,500
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2015 – 2020	**ප්‍රතිලාභීන්**	අදියර 1 (ප්‍රතිලාභීන් ප්‍රමාණය) • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 700,000 • වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 300,000 • මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 62,000
	කාලය දීර්ඝ කිරීම	2020 – 2025 ජූනි		
ප්‍රතිපාදන 2023		රු.මි. 43,000.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි.25,370.00

සමුච්චිත මුල්‍ය ප්‍රගතිය	රු.මි. 92,849.00	**සමස්ථ භෞතික ප්‍රගතිය**	45% (ප්‍රදානය කරන ලද උප ව්‍යාපෘති 12 සහ ප්‍රධාන නොවන වැඩ මත පදනම්ව ව්‍යාපෘති ප්‍රගතිය ගණනය කර ඇත.)
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 24,445.00		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත් පැකේජවල 2023 දෙසැම්බර් 31 වන දින දක්වා භෞතික ප්‍රගතිය පහත පරිදි වේ, ➢ MLBCRP-ICB-1 - වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ එසවීම සමස්ථ ප්‍රගතිය - 96% (2023 ප්‍රගතිය - 13%) ➢ NWPCP-ICB-2 නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම (කි.මී. 5+250 සිට කි.මී.22+300) සමස්ථ ප්‍රගතිය - 91% (2023 ප්‍රගතිය - 14%) ➢ UEC-ICB-2B - කළු ගඟ/මොරගහකන්ද යා කරන කි. මී. 8.8 උමඟ ඉදිකිරීම (කි.මී 0+100 සිට 08+830 km) සමස්ථ ප්‍රගතිය - 90% (2023 ප්‍රගතිය - 8%) ➢ UEC-ICB-2A- ඉහළ ඇළහැර ඇළෙහි කි.මී.27+509 සිට කි.මී.55+600 දක්වා උමඟ ඉදිකිරීම සමස්ථ ප්‍රගතිය - 21% (2023 ප්‍රගතිය - 11%) • පහත කොන්ත්‍රාත් පැකේජය තාවකාලිකව නතරකර ඇත, ➢ NWPCP-ICB-1 මහකිතුල පිවිසුම් උමඟ, මහකිතුල, මහකිරුළ ජලාශ හා මහකිතුල, මහකිරුළ යා කෙරෙන පෝෂක ඇළ මාර්ගය ඉදිකිරීම. - කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් 2023 මැයි 26 දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත්තුව තාවකාලිකව නතරකර ඇත.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• **උතුරුමැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය** ➢ කිලෝමීටර් 9 ක දිගින් යුත් කළුගඟ මොරගහකන්ද හුවමාරු ඇළ කිලෝමීටර 8කින් යුත් උමං මාර්ග දෙකකින්, විවෘත ඇළ මාර්ගයක් ආශ්‍රිත යටිතල පහසුකම් ඉදිකර ජනතා අයිතිය ලබා දීම ➢ කිලෝමීටර් 27.7ක් දිග උමං මාර්ගයක් සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වලින් සමන්විත කිලෝමීටර් 96ක් දිග උතුරුමැද පළාත් ඇළ ඉදිකිරීම. ➢ වාර්ෂික/ඝන මීටර් මිලියන 40 පානීය ජලය - ප්‍රතිලාභ: පවුල් 140,000ක් සඳහා සැපයීම. ප්‍රධාන වැව් 7ක් සඳහා වාරි ජලය සැපයීම • **වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය** ➢ ජලාශ දෙකකින්, කි.මී 10.58 උමං මාර්ග පහකින් සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම්වලින් සමන්විත කිලෝමීටර් 91 ක් දිග වයඹ පළාත් ඇළ ඉදිකිරීම		

	➢ ප්‍රතිලාභ: පවුල් 35,000ක් සඳහා වාර්ෂික/ඝන මීටර් මිලියන 10 පානීය ජලය සැපයීම, ➢ ප්‍රධාන සහ මධ්‍යම වැව් 7ක් සහ කුඩා වැව් 350ක් වයඹ ඇළ ව්‍යාපෘතිය මගින් ජලය සැපයීම • **මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය** ➢ මිනිපේ අමුණ මීටර් 3.5 කින් එසවීම සහ කිලෝමීටර් 74 ක් දිග වම් ඉවුර ඇළ සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කර ගොවි ජනතාවට ලබාදීම. • **පද්ධති කාර්යක්ෂමතාවය සහ ජල නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.** ➢ පද්ධති කාර්යක්ෂමතාව සහ ජල ඵලදායීතාව වැඩිකිරීම සඳහා මහවැලි පද්ධතිය තුල ඇති ගොවිපල වලට පහසුවෙන් අනුගත කළ හැකි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියමු ව්‍යාපෘති නිර්දේශයන් සහිත අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම • **ජල සම්පත් කළමනාකරණය සහ ඵලදායීතාව වැඩිදියුණු කිරීම** ➢ ජල සම්පත් කළමනාකරණය සහ ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා ජාතික වශයෙන් නිර්දේශ සහ ජල සම්පත් කළමනාකරණය, වාරිමාර්ග අංශයේ ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය ශක්තිමත් කිරීම ඇතුළුව ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ මූලධර්ම ශක්තිමත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කර, 2024 වන විට රජය විසින් අනුමත කිරීම • **කෘෂිකාර්මික යෙදවුම් සඳහා ගොවීන්ගේ ප්‍රවේශයට සහායවීම.** ➢ 2022-2023 මහ කන්නය සඳහා ගොවීන්ට අවම වශයෙන් MOP පොහොර මෙ.ටොන් 35,000ක් ලබාදීම. • මහවැලි ඉඩම් හෙක්ටයාර් 15,000ක කෘෂි යෙදවුම් ලබාදීම

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ කෘෂිකර්මික කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ මහවැලි කලාප වල ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ගොවීන් සඳහා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම.

ප්‍රධාන ක්‍රියාකාරකම / ව්‍යාපෘතිය	2023 සඳහා ප්‍රතිපාදන (රු. මිලි.)	දිස්ත්‍රික්ක	ප්‍රගතිය	
			භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු. මිලි.)
මහවැලි පද්ධතියේ B, C, D, G, H සහ හුරුළුවැව කලාපවල ගොවීන් සඳහා කෘෂිකාර්මික යෙදවුම් ලබා දීම.	**604**	අනුරාධපුර පොළොන්නරුව මඩකලපුව මාතලේ		**339.33**

ප්‍රධාන ක්‍රියාකාරකම / ව්‍යාපෘතිය	2023 සඳහා ප්‍රතිපාදන (රු. මිලි.)	දිස්ත්‍රික්ක	ප්‍රගතිය	
			භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු. මිලි.)
• දෙමුහුන් මිරිස් බීජ (කිලෝ ග්‍රෑම් 1000ක්) නිෂ්පාදනය කිරීමට පොලිටනල් 50ක්ලබා දීම.	95	අනුරාධපුර පොළොන්නරුව මඩකලපුව මාතලේ	50න් 33ක් ලබා දී ඇත.	15.82
• ලොකු ඵෑණු මල් බීජ (කිලෝග්‍රෑම් 9,000ක්) නිෂ්පාදනය කිරීමට වැසි ආවරණ 150ක් ලබා දීම.	30		150ක් ලබා දී ඇත.	-
• වියළි මිරිස් මෙට්‍රික් ටොන් 200ක් නිෂ්පාදනය කිරීමට ස්මාර්ට් පැකේජ 600ක් ලබා දීම.	340		600න් 400ක් ලබා දී ඇත.	236.95
• වියළි මිරිස් නිෂ්පාදනය සඳහා දැව ගිනි වියළන යන්ත්‍ර 4ක් ලබාදීම (මහවැලි කලාප B, C, H සහ හුරුළුවැව).	8		4ක් ලබා දී ඇත.	-
• ගොවීන් 921 දෙනෙකුට යල කන්නයේදී මෙට්‍රික් ටොන් 2000ක් නිෂ්පාදනය කිරීම සඳහා ලොකු ඵෑණු බීජ කිලෝග්‍රෑම් 750ක් ලබා දීම.	15		කිලෝ ග්‍රෑම් 750ක් ලබා දී ඇත.	16.55
• බඩඉරිඟු මෙට්‍රික් ටොන් 9,360ක් නිෂ්පාදනය කිරීමේ අරමුණින් ගොවීන් 931ක් සඳහා බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් 4,460ක් (යල කන්නය සඳහා) සහ ගොවියන් 3,788ක් සඳහා බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් 18,940ක් (මහ කන්නය සඳහා) ලබා දීම.	116		බඩඉරිඟු බීජ කිලෝ ග්‍රෑම් 4,460ක් යල කන්නය සඳහා සහ කිලෝ ග්‍රෑම් 18,940ක් මහ කන්නය සඳහා ලබා දී ඇත.	70.01
මහවැලි පද්ධතියේ B, C, D, G, H සහ හුරුළුවැව කලාපවල ගොවීන් සඳහා පශු සම්පත් යෙදවුම් සැපයීම.	**118**	අනුරාධපුර පොළොන්නරුව මඩකලපුව මාතලේ		**7.68**

ප්‍රධාන ක්‍රියාකාරකම / ව්‍යාපෘතිය	2023 සඳහා ප්‍රතිපාදන (රු. මිලි.)	දිස්ත්‍රික්ක	ප්‍රගතිය	
			භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු. මිලි.)
• ගොවීන් 830කට මාසයක් වයසැති කුකුල් පැටවුන් 41,500ක් ලබා දීම.	118	අනුරාධපුර පොළොන්නරුව මඩකලපුව මාතලේ	41,500න් 35,500ක් ලබා දී ඇත.	6.60
• කුකුල් පැටවුන් 41,500 ක් සඳහා වයස් කාණ්ඩ 03ක් යටතේ කුකුළු ආහාර කිලෝග්‍රෑම් 257,300ක් ලබා දීම			257,300න් 74,500 ක් ලබා දී ඇත.	1.08
එකතුව	**722**			**347.21**

2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගතමුදල		රු.මි. 89,748.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල, මොණරාගලසහ හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව (EDBI)	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ත්‍රීව්‍රතාවය (හෙක්ටයාර)**	• පුහුල්පොල වේල්ල - ඝන මීටර මිලියන 0.6 • ඩයරබා ජලාශය - ඝන මීටර මිලියන 0.9 • මුළු වගා ඉඩම්- හෙක්ටයාර් 6,000 දැනට පවතින ඉඩම් - හෙක්ටයාර් 1,500 අලුතින් සංවර්ධනය කළ ඉඩම් - හෙක්ටයාර් 4,500
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	**මූලස්ථායී වැඩ** - 2010 මාර්තු - 2015 මාර්තු	**ප්‍රතිලාභීන්**	• පවුල් 6,000 - පහළ නිම්න සංවර්ධනය • සමස්ථ ජනතාවට - විදුලි බලය නිපදවීම මගින්
	කාලය දීර්ඝ කිරීම	2015 මාර්තු - 2024 මාර්තු		
ප්‍රතිපාදන 2023		රු.මි. 3,600.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි. 5,500.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 80,293.09	**සමස්ථ භෞතික ප්‍රගතිය**	99.66%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 2,714.10		

2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	**මූලස්ථායි වැඩ** • පුහුල්පොල වේල්ල - 99.51% • ඩයරබා ජලාශය - 98.72% • සම්බන්ධිත උමඟ - 99.59% • පෙරආර උමඟ - 99.65% • කැළඹුම් කුළුණ සහ කැළඹුම් ළිඳ - 99.66% • තිරස් පීඩන කුළුණ - 99.75% • බලාගාරය - 98.56% • ප්‍රධාන පිවිසුම් උමඟ සහ අනෙකුත් පිවිසුම් උමං - 99.68% • ස්විච් අංගනය - 99.40% • ප්‍රවේශ මාර්ගය සහ විකල්ප මාර්ග - 98.20% • විදුලි සම්ප්‍රේෂණ මග - 99.80% • පසු ආර උමඟ - 99.85%
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගිනිකොන දිග වියළි කලාපයේ ජල නිඟය සමනය කිරීම සඳහා උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව අතිරික්ත ජලය ඝන මීටර මිලියන145ක් උමාඔය ද්‍රෝණියේ ජල පරිහරණය කරන්නන් හා පරිසරයට බලපෑම් නොකරහරවා යැවීමයි. • මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටයාර 4500 කට ආසන්න ප්‍රමාණයක් සහ දැනට පවතින කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 1500 කට පමණ වාරි ජලය සැපයීමට මෙයින් හැකි වන අතර මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය හා කාර්මික ජල අවශ්‍යතා ඝන මීටර මිලියන 30 ක් ලබා දෙනු ඇත. • මෙගාවොට් 120 ක ධාරිතාවයකින් යුත් භූගත විදුලි බලාගාරය මගින් වාර්ෂිකව ජාතික විදුලිබල පද්ධතියට ගිගාවොට් පැය 290ක විදුලි බලයක් එක් කරයි. • තවද, බදුල්ල දිස්ත්‍රික්කයේ ජල අවශ්‍යතාවය සපිරීම සඳහා වාර්ෂිකව ඩයරබා ජලාශයෙන් සහ පුහුල්පොල ජලාශයෙන් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වෙත ලබාදෙනු ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවලට පානීය ජලය අලිකොටආර ජලාශයෙන් ලබා දෙනු ඇත.

3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 120,700.00	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	මාතලේ, පොළොන්නරුව සහඅනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය,සංවර්ධනය සඳහා සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල, අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ත්‍රීව්‍රතාවය (හෙක්ටයාර)**	• මොරගහකන්ද - ඝන මීටර මිලියන 557.87 • කළුගඟ - ඝන මීටර මිලියන 248.00
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2007 ජනවාරි - 2015 මාර්තු	**ප්‍රතිලාභීන්**	මාතලේ, පොළොන්නරුව සහ අනුරාධපුරය දිස්ත්‍රික්ක වල ජනතාව
	කාලය දීර්ඝ කිරීම	2015 මාර්තු - 2024 මාර්තු		
ප්‍රතිපාදන 2023		රු.මි. 2,250.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි. 1,372.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 119,247.55	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.88%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 2,169.34		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• පහළ නිම්න සංවර්ධන ප්‍රදේශයේ යටිතල පහසුකම්වල ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම. • මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව පහත යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම. ➢ සංචාරක බංගලාවේ ඉතිරි ඉදිකිරීම් කටයුතු ➢ මොරගහකන්ද තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු ➢ මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් කටයුතු		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• ඝන මීටර මිලියන 557ක ධාරිතාවයෙන් යුතු මොරගහකන්ද ජලාශය • ඝන මීටර මිලියන 248ක ධාරිතාවයෙන් යුතු කළුගඟ ජලාශය • **විදුලි උත්පාදනය** - වසරකට ගිගාවොට් පැය 114.5ක ජල විදුලි නිෂ්පාදනයක් සිදු කිරීමට අපේක්ෂිතය. එමඟින් වාර්ෂිකව ඉන්ධන සඳහා පිරිවැය රු.මි. 1,545ක් ඉතිරිවේ. • පොදු පරිහරණය සඳහා ගොඩනැගිලි 465 • කි.මී.276කින් යුත් මාර්ග පද්ධතිය • කි.මී.330කින් යුත් ඇළ මාර්ග පද්ධතිය • කුඩා වැව් 11ක් ස්ථාපිත කිරීම • සුළු වැව් 20ක් ස්ථාපිත කිරීම		

	• **කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 5,000ක අමතර බිම් ප්‍රමාණයක් එක්වීම.** • **රට තුළ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකිරීම.** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ දැනට 100% සිට 154% පමණ වන වගාතීව්‍රතාව 181% දක්වා ඉහළ යනු ඇත. හෙක්ටයාරයකට වී අස්වැන්න වැඩි කිරීම ඇතුළු සෘජු ප්‍රතිලාභ මඟින් වාර්ෂිකව ටොන් 123,000ක අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබා දෙනු ඇත. එමඟින් ලැබෙන වාර්ෂික ශුද්ධ කෘෂිකාර්මික ප්‍රතිලාභ රු.මි. 4,000ක් ලෙස ගණනය කර ඇත. • මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවලට පානීය හා කාර්මික ජල පහසුකම් සැපයීම. • **මිරිදිය ධීවර කර්මාන්තය -** සාමාන්‍ය මත්ස්‍ය නිෂ්පාදන විභවය වසරකට ටොන් 4,700ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර වාර්ෂික ශුද්ධ ප්‍රතිලාභය රු.මි. 940කි. • **රැකියා අවස්ථා වැඩි කිරීම -** පුද්ගලයින් 650ක් සෘජුවම ව්‍යාපෘතියට බඳවා ගනු ලැබේ. මැණික් හා ස්වර්ණාභරණ, හෝටල් කළමනාකරණ හා ස්වයං රැකියා පුහුණු ආදිය පැවැත්වීමෙන්/ සංවිධානය කිරීමෙන් වැඩි තරුණ තරුණියන් පුහුණු කරනු ලැබේ. • **පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම -** වස්ගමුව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය සහ රිවර්ස්ටන් ආදිය සංවර්ධනය කිරීමෙන් පරිසර සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම. • **ගංවතුර පාලනය -** සෝමාවතිය සහ මනම්පිටිය ප්‍රදේශවල ඇති වූ ගංවතුර හානි පාලනය කිරීම

4. දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA)

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 18.600.00	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	සියළුම දිස්ත්‍රික්ක
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකු ණය පහසුකම් / ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ත්‍රීව්‍රතාවය (හෙක්ටයාර)**	• වී ඔය බහුකාර්ය ජලාශය -56 ඝන මීටර මිලියන • ප්‍රධාන වාරිමාර්ග සහ මධ්‍යම මට්ටමේ වාරි පද්ධති වල ඇළවල් සහ නිර්මිත ප්‍රතිසංස්කරණය - හෙක්ටයාර 25,000

ව්‍යාපෘති කාලය	2021 ඔක්තෝම්බර් - 2026 ඔක්තෝම්බර්	**ප්‍රතිලාභීන්**	• කාලගුණ සහ ගංවතුර අනතුරු ඇඟවීම් වැඩි දියුණු කිරීම තුළින් පුද්ගලයින් මිලියන 3.5 ක් • කැළණි ගං ද්‍රෝණියේ ගංවතුර සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ජල යටිතල පහසුකම්වලින් තුළින් පුද්ගලයින් 1,800,000 ක් • ගංවතුර හා නියඟයෙන් ආරක්ෂා වීම නිසා පවුල් 35,000ක ආහාර සුරක්ෂිතතාවය සහතික වීම
ප්‍රතිපාදන 2023	රු.මි. 2,025.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි. 7,119.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 677.43	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	25.6%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 601.00		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ජාතික කාලගුණ පුරෝකතන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ගෘහ නිර්මාණ සැලසුම්, ඇස්තමේන්තුව සකස් කිරීමසහ ටෙන්ඩර් පත්‍රිකා අවසන් කර තිබූ නමුත් ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමේදී මෙම ඉදිකිරීම ආරම්භ කිරීම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ 2025 දී සිදු කිරීමට නියමිතය. • කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ (DOM) හි කාලගුණ විද්‍යා ජාලය නවීකරණය කිරීම සඳහා සැලසුම්, පිරිවිතර සහ ටෙන්ඩර් ලේඛන සකස් කිරීම සඳහා උපදේශන සමාගමක සේවය ලබාගැනීම සඳහා අභිලාෂ කැඳවීම් අවසන් කර, ප්‍රමුඛතා ලැයිස්තුව සඳහා ලෝක බැංකුවේ අනුමැතිය ලබාගෙන ඇත. RFP සකස් කිරීම අවසන් කර ඇත. RFP සඳහා ලෝක බැංකුවේ අනුමැතිය ලැබුණු විගස තෝරාගත් සමාගම් සඳහා නිකුත් කිරීම ඉදිරියේදී සිදු කරනු ලැබේ. • අඹතලේ ලවණ බාධකය ඉදිකිරීමට අභිලාෂ කැඳවීම (EOI) අවසන් කර ඇති අතර ප්‍රමුඛතා ලැයිස්තුව සඳහා ලෝක බැංකුවේ අනුමැතිය ලැබී ඇත. තාක්ෂණික සහ මූල්‍ය යෝජනා ඇගයීම අවසන් කර කොන්ත්‍රාතුව ප්‍රදානය කිරීමට සාකච්ඡා කරමින් පවතී. • වී ඔය බහුකාර්ය ජලාශය සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම්, ඇස්තමේන්තු සහ ටෙන්ඩර් ලේඛන සකස් කිරීම් සඳහා උපදේශක සේවා ආයතනයක් බඳවාගැනීම සඳහා EOI කැඳවීම් අවසන් කර ඇත. ප්‍රමුඛතා ලැයිස්තුවට ලෝක බැංකු අනුමැතිය ලබාගෙන ඇත. RFP නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී.		

	• ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) උපකරණ මිලදී ගැනීමට රු. මිලි. 90 ක් වටිනා කොන්ත්‍රාත් ප්‍රදානය කර උපකරණ සපයා ඇත. • වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ ජල විද්‍යා අංශය විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම් අවසන් කර ඇත. • වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ ජල විද්‍යා අංශයේ කාර්යාල පරිශ්‍රය වැඩි දියුණු කිරීම අවසන් කර ඇත. • වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ ජල විද්‍යා අංශය සඳහා අවශ්‍ය ICT උපකරණ මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර උපකරණ සැපයීම අවසන් කර ඇත. • වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි හදිසි මෙහෙයුම් මැදිරිය පිළිසකර කිරීම සහ සැලසුම් කිරීම සඳහා ICT උපදේශකවරයෙකු බඳවාගෙන ක්‍රමවේදය සහ ඉදිරි සැලස්ම ඉදිරිපත් කර ඇත. • පාරිසරික සහ සමාජ ආරක්ෂණ කළමනාකරණ රාමුව (ESSFW) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව සකස්කර ඇත. ඒඅනුව ESSFW ට අනුගතව දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය සකස්කර ඇත • වී ඔය ප්‍රදේශයේ දැනුවත් කිරීමේ සහ ප්‍රජාව ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මකවේ. මෙමගින් ඉඩම් අත්පත් කරගැනීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම සකස් කෙරේ. • කුඩා සහ මධ්‍යම වාරිමාර්ග යෝජනාක්‍රම වල අවදානමට ලක්විය හැකි ජනතාව සඳහා දේපල ගංවතුරෙන් සහ නියඟයෙන් ආරක්ෂා කිරීම සඳහා ඉක්මන් ප්‍රතිලාභ සහතික කරන හදිසි පිළිසකර කිරීම් සඳහා උප ව්‍යාපෘති 1210 ක් හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම අවසන් කර ඒ සඳහා ලෝක බැංකු අනුමැතිය ලබාගෙන ඇත. උප ව්‍යාපෘති 564 ක් සඳහා ඇස්තුමේන්තු සකස් කිරීම අවසන් කර ඇත. කොන්ත්‍රාත් 362 ක් ප්‍රදානය කර ඇත. • ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ ඒකකය පිහිටුවන ලදී. කාර්ය මණ්ඩලයේ බහුතරයක් බඳවාගැනීම අවසන් කරඇත.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කාලගුණ සහ ගංවතුර අනතුරු ඇඟවීම් වැඩිකිරීම තුළින් මිලියන 3.5 ක ජනතාවක් ආරක්ෂා කිරීමට හැකිවීම. • කැළණි ගං ද්‍රෝණියේ ගංවතුර සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ජල යටිතල පහසුකම් තුළින් 1,800,000 ක ජනතාවකට ප්‍රතිලාභ ලැබීම • කැළණි ගං ද්‍රෝණියේ වාර්ෂික සාමාන්‍ය ගංවතුර හානිය, ඇ.ඩො. මිලියන 78 දක්වා අඩුකිරීම. • පවුල් 35,000 කගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වාරිඉඩම් හෙක්ටයාර 25,000 ක් ගංවතුර හා නියඟයෙන් ආරක්ෂා කිරීම.

ව්‍යාපෘති අරමුණු ප්‍රතිඅරමුණුකරණය (Repurposing) යටතේ ක්‍රියාත්මක ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල හදිසි හා අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය - 2023

දිස්ත්‍රික්කය	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මිලි.)	ප්‍රගතිය	
				භෞතික (%)	මූල්‍ය (රු. මිලි.)
අම්පාර	57	20	78.00	47%	26.16
අනුරාධපුරය	69	31	46.50	48%	20.07
බදුල්ල	52	36	30.00	21%	8.27
මඩකලපුව	24	19	39.00	36%	19.98
කොළඹ	72	25	37.50	3%	6.26
ගම්පහ	68	11	22.50	-	
කළුතර	26	15	18.75	10%	4.70
රත්නපුර	99	22	26.25	12%	4.94
නුවර	14	8	9.00	50%	1.60
මාතලේ	14	9	7.50	35%	4.03
නුවරඑළිය	11	4	6.00	27%	3.94
කෑගල්ල	42	7	6.00	-	
කුරුණෑගල	79	21	30.75	32%	7.76
හම්බන්තොට	50	30	45.15	24%	13.06
මන්නාරම	56	28	41.25	12%	5.91
වවුනියාව	30	27	18.75	21%	13.20
කිලිනොච්චි	17	1	18.00	-	
මුලතිව්	13	1	17.25	-	
යාපනය	18	2	15.00	-	
මොනරාගල	58	37	63.75	52%	7.50
පොළොන්නරුව	153	97	128.25	40%	43.34
පුත්තලම	33	7	37.50	40%	14.01
ත්‍රිකුණාමලය	53	39	46.50	61%	93.84
ගාල්ල	70	35	33.75	12%	6.92
මාතර	56	28	33.00	8%	5.63
එකතුව	**1,234**	**560**	**855.90**		**311.25**

5. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 13,939.30	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	සියළුම දිස්ත්‍රික්ක
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකුව ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 3,667 හෙක්ටයාර 159,571
ව්‍යාපෘති කාලය	2021 මැයි - 2025 මැයි	**ප්‍රතිලාභීන්**	පවුල් 466,404
ප්‍රතිපාදන 2023	රු. මි. 3,000.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු. මි. 4,397.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 3,215.90	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	38.6%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 2,340.00		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	පහත සඳහන් පරිදි වැඩ, භාණ්ඩ සහ උපදේශන ආශ්‍රිත ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්: • ඇළ වේලි ප්‍රතිසංස්කරණ ඇතුළත් වැඩ කොන්ත්‍රාත්තු 27ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලදී. මෙයින් කොන්ත්‍රාත් 06ක් අවසන් කර ඇති අතර කොන්ත්‍රාත් 15ක වැඩක්‍රියාත්මක වෙමින් පවතී. වැඩ කොන්ත්‍රාත් 09ක් ප්‍රසම්පාදන අදියරේ පවතී. • ක්‍රමෝපාය නැවත සකස් කර ක්‍රියාත්මක කිරීම යටතේ කුඩා වේලි සහ ඇළ ප්‍රතිසංස්කරණ පැකේජ 653ක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි පැකේජ 73ක වැඩ දැනටමත් අවසන් කර ඇති අතර 580ක වැඩ ඉදිකිරීම් අවසන් අදියර යටතේ පවතී. • උපදේශන සේවා - මුළු උපදේශන සේවා 21 පැකේජ 8 ක් ක්‍රියාත්මක වෙමින් පවතී.පැකේජ 6ක් ප්‍රසම්පාදන අදියර යටතේ පවතී. උපදේශන පැකේජ 7ක් දැනටමත් අවසන් කර ඇත. • භාණ්ඩ කොන්ත්‍රාත්තු - සම්පූර්ණ පැකේජය 9 ප්‍රසම්පාදන අදියර යටතේ පැකේජ 4කි. පැකේජ 5ක් දැනටමත් අවසන් කර ඇත • උපදේශන නොවන සේවා - මුළු පැකේජ 3 ප්‍රසම්පාදන අදියර යටතේ පැකේජ 2කි.එක් පැකේජයක් ක්‍රියාත්මක වෙමින් පවතී.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• **සමස්ථ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණ** i. අවදානම් සහිත වේලි ප්‍රමාණය 18 සිට 8 තෙක් පහළ නැංවීම ii. වාරි හෝ ජලාපවහන සේවා ලබා දීමතුළින් නවතම/ සංවර්ධිත ප්‍රදේශයන්හි භූමි වපසරිය හෙක්ටයාර් 110,827.86 දක්වා වර්ධනය කිරීම		

	සංරචකය 2 - වාරි යටිතලපහසුකම් ප්‍රතිසංස්කරණය i. වාරි යටිතල පහසුකම් වල ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් සෘජුවම ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 204,276 ක් ඉලක්ක කෙරේ. ii. ප්‍රතිසංස්කරණය කරන ලද වේලි සංඛ්‍යාව 18 ක් ලෙස ඉලක්ක කෙරේ. iii. ප්‍රතිසංස්කරණය කරන ලද ඇළ මාර්ග සංඛ්‍යාව 14 ක් ලෙස ඉලක්ක කෙරේ. **සංරචකය 4 - ව්‍යාපෘති කළමනාකරණය** i. ව්‍යාපෘති ප්‍රගති වාර්තා නිසි කලට ලබා දීම ii. දුග්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය මගින් ඒවා වාර්තා වීමට සාපේක්ෂව සම්මත කාල රාමුවක් තුළ විසඳීම. ප්‍රතිශතයක් ලෙස 80% ක් ඉලක්ක කෙරේ. • මේ වන විට ව්‍යාපෘතියට ඇ. ඩො. මිලියන 25 ක් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට තීරණය කර ඇති අතර ව්‍යාපෘතියේ විෂයය පථය පුළුල් කිරීමටත්, කාල රාමුව දිගු කිරීමටත් කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. ඒ අනුව ඉහත අපේක්ෂිත ප්‍රතිලාභ සංශෝධනයක් කිරීම සඳහා සාකච්ඡා මෙහෙයවමින් පවතී.

ව්‍යාපෘති අරමුණු ප්‍රතිඅරමුණුකරණය (Repurposing) යටතේ ක්‍රියාත්මක ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල හදිසි හා අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය - 2023

දිස්ත්‍රික්කය	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මිලි.)	ප්‍රගතිය	
				භෞතික (%)	මුල්‍ය (රු. මිලි.)
අම්පාර	51	49	225.00	51	56.45
අනුරාධපුරය	44	37	150.00	42	29.12
බදුල්ල	25	15	110.80	50	13.89
මඩකලපුව	34	33	141.70	71	50.91
කොළඹ	10	3	41.70	15	0.42
ගම්පහ	17	17	83.30	15	0.83
කළුතර	8	5	83.30	20	0.83
රත්නපුර	27	19	115.90	19	1.16
නුවර	11	9	41.70	50	6.02
මාතලේ	32	25	83.40	47	22.92
නුවරඑළිය	13	8	83.30	50	2.34
කෑගල්ල	5	3	48.30	30	2.93
කුරුණෑගල	21	19	79.20	54	19.95

දිස්ත්‍රික්කය	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව	2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මිලි.)	ප්‍රගතිය	
				භෞතික (%)	මූල්‍ය (රු. මිලි.)
හම්බන්තොට	35	29	137.50	51	15.76
මන්නාරම	20	19	125.00	55	26.25
වවුනියාව	31	27	150.00	51	44.68
කිලිනොච්චි	10	5	83.30	40	9.00
මුලතිව්	8	8	41.70	60	13.14
යාපනය	34	20	176.70	50	44.16
මොනරාගල	46	28	293.30	24	25.93
පොළොන්නරුව	88	66	331.60	37	29.29
පුත්තලම	12	11	41.70	56	10.92
ත්‍රිකුණාමලය	47	38	239.10	84	93.75
ගාල්ල	14	7	50.80	20	0.51
මාතර	16	9	41.70	25	0.42
එකතුව	**659**	**509**	**3000.00**		**521.57**

6. ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින්ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 10,416.00 (ඇ.ඩො. 1 = රු. 200) ඇ.ඩො.මි. 52.08	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	හරිත දේශගුණ අරමුදල / ශ්‍රී ලංකා රජය - සම මූල්‍ය දායකත්වය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා තීව්‍රතාවය (හෙක්ටයාර)**	සුළු වාරි පද්ධති 325 හෙක්ටයාර 5,000
ව්‍යාපෘති කාලය	2017 ජූනි - 2024	**ප්‍රතිලාභීන්**	1,950,374
ප්‍රතිපාදන 2023	රු.මි. 2,930.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි 2,531.00 විදේශ අරමුදල - රු.මි. 1,836.00 ශ්‍රී ලංකා රජය - රු.මි. 705.00

සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි 7351.60 (අමාත්‍යාංශය - රු.මි 5226.65 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් සෘජු වියදම් - රු.මි 2818.86)	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	82%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2440.10 රු.මි. 2269.60 (වාරිමාර්ග අමාත්‍යාංශය) රු.මි.170.50 (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන)		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• සුළු වාරි පද්ධති 25 ක සැලසුම් සහ ඇස්තමේන්තු සකස්කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර අවසන්කර ඇති අතර සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම ආරම්භ කිරීම සඳහා අනුමැතිය බලාපොරොත්තුව සිටියි. මේ සමඟ ව්‍යාපෘතියෙහි සම්පූර්ණ ඉලක්කගත වැව් 325 හිම ඇස්තමේන්තු සකස් කිරීම සාර්ථක ලෙස නිමා වනු ඇත. • වැව් 32 ක ප්‍රතිසංස්කරණ නිමා කර නිමා වූ වැව් සංඛ්‍යාව 230 දක්වා ඉහළ නංවාගනු ලැබිණි. තවත් වැව් 55 ක ප්‍රතිසංස්කරණ සිදු වෙමින් පවතී. • යටි ගං සංවර්ධන වැඩ කටයුතු - වාර්ෂික ඉලක්කයෙන් 60% නිමා කර ඇත. නිම කළ මුළු වැව් සංඛ්‍යාව 130 ක් වන අතර තවත් වැව් 45 ක යටි ගං සංවර්ධන කටයුතු සිදු වෙමින් පවතී. • ගොවිජන සේවා මධ්‍යස්ථාන 46ක් සහ කොළඹ ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයෙහි ප්‍රධාන කාර්යාලය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ ලබාදීමෙන් දේශීය දැනුම් මධ්‍යස්ථාන ලෙස ශක්තිමත් කිරීම. • සියලුම ව්‍යාපෘති ප්‍රතිලාභීන් දෘශ්‍යමාන කිරීම සඳහා භූ අවකාශීය දත්ත ගබඩාවක් සකස්කිරීම (දැනට දත්ත ඇතුළත් කරමින් පවතී) • වැසි ජල ටැංකි පද්ධති ස්ථාපනය කරනු ලැබූ ස්ථාන ආශ්‍රිතව ආහාර සුරක්ෂිතතා ගෙවතු 100 ක් ඉදි කිරීම / වාණිජ ගොවිතැන් ඒකක 650 ක් / ගෙවතු 350 ක් / ජල කළමනාකරණ මොඩල 35ක් / ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 454 ක බෝග තීව්‍රතාවය වැඩි දියුණු කිරීම. • ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය සමඟ ඒකාබද්ධව දැනට මූල්‍ය අර්බුදය නිසා ඔවුනට නිමා කර ගත නොහැකිව තිබූ පානීය ජල ව්‍යාපෘති 12 ක් සම්පූර්ණ කර ජනතාව අතට පත් කරනු ලැබිණි. • වැසි ජලය රැස්කරීමේ පද්ධති 973 ක් ස්ථාපනය කිරීම සිදු විය (මෙයින් 873ක් ගෘහයන් සඳහා වන අතර ඉතිරි 100 පානීය ජල දුෂ්කරතාවයන් සහිත ග්‍රාමීය පාසල් සඳහාය) • මහා පරිමාණ උසස් පෙරහන් ඒකක 06 ක් ස්ථාපනය කිරීම සහ කුඩා පරිමාණයේ උසස් පෙරහන් ඒකක24ක් ස්ථාපනය කිරීම (ක්‍රියාත්මක වේ)		

	• දැනටමත් ස්ථාපනය කරඇති කෘෂි කාලගුණික දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන, වර්ෂාමාන ගංහා ජල මාපක ආදියෙහි දත්ත රැස් කිරීම සහ ඒ අනුව ජල කළමනාකරණ උපදේශන බෙදා හැරීම • වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ගංවතුර මොඩලය පරීක්ෂා කිරීම, ධාවනය කිරීම සහ පුහුණුව - ආකෘති නිර්මාණය / වලංගු කිරීම සහ පුහුණුව සිදුකරන ලදී. • ග්‍රාමීය වාරිමාර්ගවල ගැඹුර මැනීමේ කෝදු 100 ක් සවිකිරීම සහ වැවේ ජල මට්ටම මැනීමට ගොවීන්ට පහසුකම් සැලසීම. • ව්‍යාපෘතිය මගින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය ගංහා ජල මාපක 23 ක් සඳහා මිනුම් වක්‍ර සකස් කර මී ඔය මල්වතු ඔය සහ යාන් ඔය ගංහා ද්‍රෝණි තුන තුළ ගංවතුර සහ ජල කළමනාකරණයට සහාය වීම සඳහා දත්ත හුවමාරු යාන්ත්‍රණය ස්ථාපනය කිරීම. • ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සහ පාසැල් මට්ටමින් ආපදා අවදානම් සඳහා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 325 ක් වැඩි දියුණු කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් මඟින් මෙම සුළු වාරි පද්ධති වල ඇති හෙක්ටයාර 9750 ක වගා තීව්‍රතාවය 0.8 සිට 1.6 දක්වා වැඩි කර මෙම ප්‍රදේශයේ ජනතාවගේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරු වීමේ හැකියාව නහා සිටුවීම • ප්‍රතිලාභීන් 520,000 ක් කෘෂි දේශගුණික උපදේශණ ලබා දීම තුළින් දේශගුණික විපර්යාසයනට අනුහුරු වීමේ හැකියාව නහා සිටුවීම • දේශගුණයට ඔරොත්තු දෙන, විමධ්‍යගත ජල කළමනාකරණ විසඳුම් වන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම 07ක් පිහිටුවීම, වැඩි දියුණු කළ ජල පිරිපහදු පද්ධති (විශාල පරිමාණ 70ක් සහ කුඩා පරිමාණ 16 ක්) ස්ථාපනය, වැසි ජල රැස්කිරීමේ ටැංකි පද්ධති 4,000ක් ස්ථාපනය සහ පානීය ජල කලමණාකරණ සැලසුම් සකස් කිරීම හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාව 122,715 දෙනෙකුට වසර පුරා සුරක්ෂිත පානීය ජලය සැපයීම • ඵලදායි කාලගුණික තත්ත්ව අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම, කෘෂි කාලගුණ උපදේශන, ජල කලමණාකරණ උපදේශණ බෙදා හැරීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම මගින් ගංවතුර සහ නියඟයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ ඒ සඳහා අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම (ප්‍රතිලාභීන් 450,000 ක්)

7. නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (GCF Knuckles)

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 14,692.00 (ඇ. ඩො1 = රු 300) ඇ.ඩො. මි. 48.975	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මහනුවර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	හරිත දේශගුණ අරමුදල / ශ්‍රී ලංකා රජය - සම මූල්‍ය දායකත්වය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා තීව්‍රතාවය (හෙක්ටයාර)**	හෙක්ටයාර 672,518
ව්‍යාපෘති කාලය	2023 ජනවාරි – 2029 ජනවාරි	**ප්‍රතිලාභීන්**	1,343,216
ප්‍රතිපාදන 2023	රු.මි. 1,245.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි. 1,400.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 26.46	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	1% (ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අවශ්‍ය පූර්ව සැලසුම් සිදු කරනු ලැබිණි)
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 26.46		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවීම (කාර්ය මණ්ඩල බඳවා ගැනීම්) • මූලික පාර්ශවකරුවන්ගේ සාකච්ඡා (පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන 25ක් පමණ හඳුනාගෙන ඇත) හරහා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ සාකච්ඡා මාර්ගයෙන් එකඟතා වලට එළඹීම • ජාතික මෙහෙයුම් කමිටු 3ක් පැවැත්වීම සහ වැඩ සැලසුම් අනුමත කර ගැනීම සටහන: ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2023 දී ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ නමුත් ඒවා නැවත ඇගයීම, ප්‍රමුඛතා සහ අනුපිළිවෙලට සකස් කිරීම සුදුසු බව අමාත්‍යාංශය තීරණය කළ බැවින් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක නොකරන ලදී. එබැවින් 2023 වර්ෂය තුළ ඉහත සඳහන් කළ හේතුව අරමුණු කොට ජාතික, පළාත්, දිස්ත්‍රික් මට්ටමින් අදාල ආයතන සමඟ සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මිලියන 1.3 ක ජනතාවක් (කාන්තාවන් 51.4%) සඳහා විවිධාංගීකරණය වූ, දේශගුණයට ඔරොත්තු දෙන විකල්ප ජීවනෝපාය මාර්ග හඳුන්වා දීම මඟින් ඔවුන් හට දේශගුණික විපර්යයාස වලට අනුහුරු වීමේ හැකියාව වැඩි දියුණු කිරීම. • හෙක්ටයාර 346,000ක් වන කෘෂි පාරිසරික පද්ධති සහ ස්වභාවික පරිසර පද්ධති (උස් බිම් / පහත් බිම් ද ඇතුළුව) දේශගුණික විචල්‍යතා සහ වෙනස්වීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ආරක්ෂා කර ශක්තිමත් කිරීම.		

8. නාච්චාදුව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීමේ අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු. මි. 156.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය / ජපාන පරිත්‍යාගය (JIID)	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ක්‍රීවුතාවය (හෙක්ටයාර) වගා තීව්‍රතාවය**	• සංවර්ධනය වන මුළු බිම් ප්‍රමාණය - හෙක්ටයාර 48 • වගා බිම් ප්‍රමාණය - හෙක්ටයාර 26.5
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2020 - 2021	**ප්‍රතිලාභීන්**	ගොවි පවුල් 44
	කාලය දීර්ඝ කිරීම	2021 - 2023 දෙසැම්බර්		
ප්‍රතිපාදන 2023		රු. මි. 50.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	2023 වසරේදී ව්‍යාපෘතිය අවසන් කරන ලදී.
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු. මි. 79.71	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු. මි. 40.01		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• ඇළ මාර්ගවල කොන්ක්‍රීට් ඇතිරීම, ට්‍රැක්ටර් පැන්නුම්, ජල හැරවුම් නිර්මිත හා ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය • මෙහෙයුම්, නඩත්තු හා ආයතනික සංවර්ධන කටයුතු • ඉඩම්, ජලය හා අස්වනු කාර්යක්ෂමතාවය ඉහළ දැමීමට අදාළ කටයුතු හා පසුවිපරම් ක්‍රියාවලිය		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• ගොවීන් නවීන තාක්ෂණික යන්ත්‍ර සහ තාක්ෂණික ක්‍රම භාවිතයට හුරුකිරීම • නිෂ්පාදන වියදම් 35% කින් අඩුකිරීම • බෝග විවිධාංගිකරණය තුළින් බෝග ඵලදායිතාවය හා භූමි ඵලදායිතාවය ඉහල නැංවීම • ජල කාර්යක්මතාවය 40% සිට 60% දක්වා ඉහළ නැංවීම • ගොවිතැනින් ඈත්වන තරුණ ප්‍රජාව ගොවිතැන කෙරෙහි ආකර්ෂණය කරගැනීම • කෘෂිමාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම • ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරන ලද ඉඩම් වල ආර්ථික වටිනාකම වැඩිවීම.		

9. පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 22,900.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ත්‍රීව්‍රතාවය (හෙක්ටයාර)**	ඝන මීටර මිලියන 209 හෙක්ටයාර 13,472
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2018 - 2022	**ප්‍රතිලාභීන්**	අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල ජීවත්වන ජනතාව
	කාලය දීර්ඝ කිරීම	2022 - 2024		
ප්‍රතිපාදන 2023		රු.මි. 550.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,700.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 1,209.22	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	5.74
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 255.89		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• මැටි (Clay Material) මගින් Cut-off core trench පිරවීම (කිලෝමීටර් 3.6න් කිලෝමීටර් 2.4). • මැටිමගින් මධ්‍ය අගල (Central Core) පිරවීම. • SC මගින් පස් බැම්ම පිරවීම (FSLට පහළින් මීටර් 1.5 ක් දක්වා SC පිරවුම් කිලෝමීටර් 1 ක් සම්පූර්ණ කර ඇත). • දකුණු ඉවුර නිර්මිතයේ ඉදිකිරීම් කටයුතු 85% පමණ නිම කිරීම. • පිටවාන නිර්මිතයේ පාදම කැණීම් 20% ක් පමණ අවසන් කිරීම. • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය සහ පහළ නිම්න සංවර්ධන ප්‍රදේශය සඳහා මිනුම් කටයුතු, මට්ටම් කිරීමසහ BOP නිම කිරීම. • ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 38(a) වගන්තියට අනුව, භුක්තිය පවරා ගැනීමේ කටයුතු කිරීම (මුළු ඉඩම් කැබලි 3,484 න් 2,154 ක ප්‍රමාණයක් පවරාදීම). • වම් ඉවුර (LB) සහ දකුණු ඉවුර (RB) යන වාරි ජලය සැපයිය හැකි ප්‍රදේශ සඳහා පහළ නිම්න සංවර්ධන කටයුතු සැලසුම් කිරීම. • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය 60% ක් පමණ අවසන් කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• **කෘෂිකාර්මික :** වාරි පහසුකම් සඳහා ජලය සැපයීම නව වාරි ප්‍රදේශය - හෙක්ටයාර 810 (වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග) පවතින වාරි ප්‍රදේශය - හෙක්ටයාර 12,416 (යෝධ වැව සහ අකනිමුරිප්පු වැව) වගා කීව්‍රතාවය 1.2 සිට 2.0 දක්වා වැඩි කිරීම.		

	• **ජල සැපයුම :** වවුනියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක සඳහා වාර්ෂික ගෘහස්ත ජල ඉල්ලුම 21 MCM සැපයීම • **බලශක්ති උත්පාදනය:** ජාතික විදුලිබල පද්ධතියට වාර්ෂිකව ගිගා වොට් පැය 4.68 ක ධාරිතාවයකින් යුත් ජල විදුලි බලය උත්පාදනය • **වෙනත් ප්‍රතිලාභ:** ➢ වව්නියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක සඳහා ගංවතුර හානි වැළැක්වීම සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම. ➢ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය ➢ ආයතනික සංවර්ධන සහ ගොවිජන සේවා ශක්තිමත් කිරීම. ➢ විල්පත්තු ජාතික අභය භූමිය අවට භායනයට ලක්ව ඇති වන භූමි ප්‍රදේශ නැවත වන වගා සිදු කිරීම සහ සංරක්ෂණය. ➢ ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ නව නගර සැලසුම් සංවර්ධනය. ➢ සූර්ය බලශක්ති නිපදවීමේ ව්‍යාපෘති හඳුන්වා දීම. ➢ ව්‍යාපෘති කාල සීමාව තුළ ප්‍රදේශවාසීන් සඳහා නව රැකියා අවස්ථා. ➢ ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය. ➢ අභ්‍යන්තර මාර්ග ජාලය වැඩිදියුණු කිරීම. ➢ කෘෂිකර්මාන්තය වෙනුවෙන් නව තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වා දීම.
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	• Clay Material මගින් Cut-off core trench පිරවීම (කිලෝමීටර් 3.6 න් කිලෝමීටර් 0.6) • මැටි මගින් මධ්‍ය අගල(Central Core) පිරවීම සහ SC මඟින් පස් බැම්ම ඉදිකිරීම. • පිටවාන නිර්මිතය ඉදි කිරීම. • වැව් බැම්ම සහ දකුණු ඉවුර වාන් මාර්ගය ඉදිකිරීම • වැව් බැම්මට සහ වාන් මාර්ගයට පිවිසුම් මාර්ගය ඉදිකිරීම • අලුතින් යෝජිත LB සහ RB, වාරි ජලය සැපයිය හැකි ප්‍රදේශ සංවර්ධනය • යෝජිත ජලාශයට යටවන ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ප්‍රදානය • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය • පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම • තන්තිරිමලේ නගර සැලසුම් සහ සංචාරක ප්‍රවර්ධන සැලැස්ම ආදිය අවසන් කිරීම.

*** 2024 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ සපයනු ලැබේ.**

10. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 31,494 ඇ.ඩො. මි. 174	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්කය**	බදුල්ල,මහනුවර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		මූලස්ථායී වැඩ - විදේශීය (අපේක්ෂිත) ප්‍රාරම්භක වැඩ - දේශීය (ශ්‍රී ලංකා ජනරජය)	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ත්‍රීව්‍රතාවය (හෙක්ටයාර) වගා තීව්‍රතාවය**	• ඝන මීටර මිලියන 15.6 • බත්මැඩිල්ල ව්‍යාපාරයේ පවතින හෙක්ටයාර 810 නව හෙක්ටයාර 400 • මිනිපේ වම් ඉවුර ව්‍යාපාරයේ අර්ධ වශයෙන් හෙක්ටයාර 8000
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2018 අගෝස්තු - 2021 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
	කාලය දීර්ඝ කිරීම	2021 දෙසැම්බර් - 2024 දෙසැම්බර්		
ප්‍රතිපාදන 2023		රු.මි. 500.00	**2024 වසර සඳහා මූල්‍ය ප්‍රතිපාදන**	රු.මි. 500.00*
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 647.24	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	9.1%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 61.93		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්		• යාලගමුව මාර්ගය වැඩිදියුණු කිරීම • ඉඩම් අත්පත් කරගැනීම • මූලස්ථායී වැඩ		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• මිනිපේ වම් ඉවුර ඇතුළු හෙක්ටයාර් 400 ක් සඳහා කන්න 2 ක් සඳහා අලුතින් ජලය සැපයීම සහ පවතින හෙක්ටයාර් 810 ක් සඳහා අඛණ්ඩව ජලය සැපයීම • ජල විදුලි උත්පාදනය මගින් වාර්ෂික ගිගා වොට් පැය 51.6 ක් ජාතික විදුලි පද්ධතියට එක්කිරීම. • පානීය ජලය සැපයීම • ධීවර කර්මාන්තය දියුණු කිරීම. • ඌව පරණගම සිට කන්දකැටිය දක්වා මාර්ගය වේල්ල මගින් ඉදිකිරීමෙන් දුර ප්‍රමාණය කි.මී. 70ක් පමණ අඩුවීම. • මහවැලි පද්ධතියට රොන්මඩ එකතුවීම පාලනය කිරීම		
2024 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන		• යාලගමුව මාර්ගය වැඩි දියුණු කිරීම • ඉඩම් අත්පත් කරගැනීම • ඉංජිනේරුමය නිර්මාණකරණය • නැවත වන වගා කිරීම.		

*** 2024 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ සපයනු ලැබේ.**

11. නුවරඑළියේ බැරැක්තැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තුගත මුදල		රු. මි. 230.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	නුවරඑළිය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා ත්‍රීව්‍රතාවය (හෙක්ටයාර) වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 0.12 හෙක්ටයාර 800
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2020 අගෝස්තු - 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 3,000
	කාලය දීර්ඝ කිරීම	2022 - 2024 අගෝස්තු		
ප්‍රතිපාදන 2023		රු. මි. 30.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු. මි. 100.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු. මි. 107.89	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	47.39%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු. මි. 23.89		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• ජලාශයේ රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම. • Drainage inlet ඉදිකිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• වාරි ජලය හෙක්ටයාර් 912 (බැරැක් ප්ලේන් වැව යටතේ හෙක්ටයාර් 101 එළවළු, බෝඹුරු ඇල්ල වැව හෙක්ටයාර් 811 වී සහ එළවළු) • පවුල් 3000කට පානීය ජලය		
2024 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන		• අධික ලෙස මුල් බැස ඇති ඒවා මුලිනුපුටා දැමීම සහ ඉවත් කිරීම • වැවෙහි රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම • රොන්මඩ උගුලක් (silt trap) පෝෂක ඇළෙහි ඉදිකිරීම • පෝෂක ඇළප්‍රතිසංස්කරණය කිරීම • වැව අවට පාංශු සංරක්ෂණ පිළිවෙත් හඳුන්වා දීම(වැව වටා ප්‍රවේශ මාර්ගයක් සැකසීම) • වැවට රොන්මඩ ගලා ඒම වැළැක්වීම සඳහා නව රොන්මඩ උගුල් හඳුන්වා දීම • Drainage inlet ඉදිකිරීම • වේල්ලෙහි සුළු අලුත්වැඩියාවන්සිදු කිරීම • වැව අවට පාංශු බාදනය අවම කිරීම සඳහා භූමි අලංකරණය • මායිම් සලකුණු කර මායිම් ගල් පිහිට වීම		

*** 2024 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ සපයනු ලැබේ.**

12. මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු. මි. 38,500.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මඩකලපුව සහ අම්පාර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා තීව්‍රතාවය (හෙක්ටයාර) වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 18.4 හෙක්ටයාර 10,000
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2021 ජනවාරි - 2030 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	ගොවීන් - 4,500 ගොවීන් නොවන - 1,000
	කාලය දීර්ඝ කිරීම			
ප්‍රතිපාදන 2023		රු. මි. 650.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	*
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු. මි. 906.34	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.88%
2023වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු. මි. 182.05		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• කීනානි වැවෙහි (Level Crossing) ඇතුල්වීම් නිර්මිතයේ 0.5ක ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කළ අතර එම ඉදිකිරීම් අවසන් කර ඇත. • කීනානි වැවෙහි (Level Crossing) පිටවීම් නිර්මිතයේ 0.5ක ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කළ අතර එම ඉදිකිරීම් අවසන් කර ඇත. • මීමින්නාගොල්ල වැවෙහි (Level Crossing) ඇතුල්වීම් නිර්මිතයේ කොටස් ගණන 0.5 ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කළ අතර එම ඉදිකිරීම් අවසන් කර ඇත. • මීමින්නාගොල්ල වැවෙහි (Level Crossing) පිටවීම් නිර්මිතයේ කොටස් ගණන 0.5 ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කළ අතර එම ඉදිකිරීම් අවසන් කර ඇත.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• නව වගා බිම් හෙක්.12,437 කට වාරි ජල පහසුකම් සැපයීම • දිනකට ඝණ මීටර් 10,000 ක් පානීය ජලය ලබා දීම • ධීවර කර්මාන්තය හා සංචාරක කර්මාන්තය මගින් නව ආදායම් උත්පාදනය කිරීම • තෘණ භූමි සංවර්ධනය මගින් දේශීය කිරි නිෂ්පාදනය ඉහල නැංවීම • ජල පැතුරුම් ප්‍රදේශය හා භූ ගත ජල තලය වර්ධනය වීම. ජාතික මෙහෙයුම් මැදිරියේ කැදවුම්කරු/ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ " ජාතික මෙහෙයුම් මැදිරි - රැස්වීම් වාර්තාව " යන මැයෙන් යොමු කල අංක: DPMM/NOR/1-3		

	හා 11.10.2023 දිනැති ලිපියට අනුව ව්‍යාපෘතිය සඳහා අමතර පිරිවැයක් දේශීය මුල්‍යනය හරහා දැරීමට ඇති අපහසුව අවධානයට යොමුකළ කමිටුව අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සංවර්ධනය කරගැනීම සඳහා සුදුසු වානිජ සහකරුවකු රාජ්‍ය, පුද්ගලික හවුල්කාරිත්වය (Public Private partnership) යටතේ සොයාගන්නා ලෙස උපදෙස් දෙන ලදී.

***ජාතික මෙහෙයුම් මැදිරියේ (NOR) තීරණය මත ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත.**

13. "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන

	ව්‍යාපෘතිය	මුළු ඇස්තමේන්තුව (රු.මිලි.)	ව්‍යාපෘති කාලය	2023 වසර සඳහා ප්‍රතිපාදන	2023.12.31 දිනට ප්‍රගතිය	
					මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)	භෞතික ප්‍රගතිය
1	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පේරමඩු වැව වැඩි දියුණු කිරීම	118.00	2021 - 2023	64.79	67.99	86%
2	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැන්ඔය අමුණ ඉදිකිරීම	66.18	2021 - 2023	21.76	66.16	100%
3	අනුරාධපුර පදවිය වාහල්කඩ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු කිරීම (Stage 1 සහ 11)	116.94	2021 - 2023	36.2	83.25	72%

14. ග්‍රාමීය වැව් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය වැඩිදියුණු කිරීම හා වර්ෂා ජලය උපරිම ලෙස රඳවා ගනිමින් නිසි පරිදි කළමනාකරණය කිරීම තුළින් පානීය, කර්මාන්ත, කෘෂිකාර්මික, සංචාරක හා අනෙකුත් ආදායම් උත්පාදන ක්‍රියාවලීන් සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම ඉලක්ක කර ගනිමින් රට පුරා විහිදී ඇති ග්‍රාමීය වැව්, අමුණු හා ඇළ මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආරම්භ කරන ලද "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ ග්‍රාමීය වැව්, අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග 5,000ක් පුනරුත්ථාපනය/ ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ පැවති ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මකවූ අතර 2023 වර්ෂයේදී වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

මෙම ව්‍යාපෘතිය දිවයිනෙහි සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ඊට අතිරේක ව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ද ක්‍රියාත්මක කරන ලදී.මේ සඳහා ගොවි සංවිධාන හා

පොදුජන සංවිධාන වල සහභාගිත්වය ද ලබා ගන්නා ලද අතර, ඉදිකිරීම් කටයුතු වලදී ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉංජිනේරු අංශය, සිවිල් ආරක්ෂක බලකාය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව යන ආයතනවල දායකත්වය ද ලබා ගන්නා ලදී.

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘති තෝරා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන හා ප්‍රදේශවාසීන් සමඟ සම්බන්ධීකරණ කාර්යයන් දිස්ත්‍රික් මට්ටමේදී ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් සිදු කර ඇත.

රටේ පැවති අර්බුදකාරී ආර්ථික තත්ත්වය මත, මෙම ග්‍රාමීය වැව් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත පරිදි ප්‍රතිපාදන වෙන් නොවූ අතර, 2022 වර්ෂයේ දී ජාතික මට්ටමින් ගනු ලැබූ තීරණ හා උපදෙස් මත ඒ වන විටත් ක්‍රියාත්මක කිරීමට තෝරා ගෙන තිබූ වැව් අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග පුනරුත්ථාපන නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු නොකරන ලදී.එමෙන්ම එම අවස්ථාව වන විට යම්තාක් දුරකට ප්‍රතිලාභ අත්කරගත හැකි තත්ත්වයක පැවති ව්‍යාපෘති භෞතික ලෙස වැඩ නිම කරන ලද ලෙස සලකා කටයුතු කරන ලදී. තවදුරටත් ක්‍රියාත්මක කළ නොහැකි මට්ටමේ ව්‍යාපෘති අවලංගු කරන ලදී.

2022 වර්ෂයේදී අවිච්ඡේද වූ වැව් අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති 99 ක් 2023 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම 2023 වර්ෂයේදී පුනරුත්ථාපනය කරන ලද වැව් මැණුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වූ අතර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් සිදු කරන ලද A9 මාර්ගයේ කුරුණෑගල සිට දඹුල්ල හරහා අනුරාධපුර මාර්ගය ආශ්‍රිතව පිහිටි තෝරා ගත් වැව් 09 ක සංවර්ධන කටයුතු සඳහා 2022 වර්ෂයේ සිදු කරන ලද ගෙවීම් වලට අමතරව එම අදාළ වූ බිල්පත් ගෙවීම් ද මෙම ව්‍යාපෘතියට 2023 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන මඟින් සිදු කරන ලදී.

ඒ අනුව 2021-2023 කාල පරාසය තුල රු. මිලියන 12,500ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ග්‍රාමීය වැව්, අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග 5000ක් පුනරුත්ථාපනය/ ප්‍රතිසංස්කරණය/ නවීකරණය කිරීම යටතේ 2023 වර්ෂය අවසානය වන විට වැව්අමුණු හා ආශ්‍රිත ඇළ මාර්ග 1000කට අධික සංඛ්‍යාවක වැඩ නිම කර ඇත. 2023 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම රුපියල් මිලියන 5245.7 කි.

දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිසංස්කරණය සඳහා තෝරා ගෙන ඇති වැව්/ අමුණු ආශ්‍රිත ඇළ මාර්ග භෞතික ප්‍රගතිය

	දිස්ත්‍රික්කය	ක්‍රියාත්මක කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව	2023.12.31 දිනට වැඩ අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව	
			භෞතිකව 100% නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අවසන් කල ලෙස සලකන ලද ව්‍යාපෘති සංඛ්‍යාව
1	අනුරාධපුරය	73	57	7
2	පොළොන්නරුව	35	32	1
3	කුරුණෑගල	113	89	16
4	පුත්තලම	45	38	7
5	ත්‍රිකුණාමලය	51	50	1
6	මඩකලපුව	37	37	0
7	අම්පාර	62	45	14
8	මාතර	103	101	1
9	ගාල්ල	91	84	3
10	හම්බන්තොට	65	47	6
11	බදුල්ල	76	72	4
12	මොණරාගල	43	36	6
13	මහනුවර	113	103	10
14	මාතලේ	35	25	1
15	කෑගල්ල	11	9	2
16	නුවරඑළිය	40	36	4
17	යාපනය	38	16	22
18	කිලිනොච්චිය	10	6	3
19	මන්නාරම	44	22	2
20	මුලතිව්	14	7	5
21	වව්නියාව	24	24	0
22	රත්නපුරය	30	26	4
23	කොළඹ	23	23	0
24	ගම්පහ	36	27	2
25	කළුතර	45	38	2
	එකතුව	**1257**	**1052**	**130**

ක්‍රියාත්මක ආයතන හා මුල්‍ය ප්‍රගතිය - 2023.12.31 දිනට

	ආයතනය	ප්‍රතිපාදන 2023 (රු.)	2023.12.31 දක්වා වියදම (රු.)
1	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	1,782,000,000	174,274,159.04
2	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (A 9 මාර්ගයේ පිහිටි තෝරාගත් වැව් සංවර්ධනය)		180,339,949.44
3	මිනින්දෝරු දෙපාර්තමේන්තුව (උක්ත තෝරාගත් ක්‍රියාත්මක ව්‍යාපෘති ද ඇතුලත් ව සමීක්ෂණ කටයුතු)		8,513,965.16
	එකතුව	**1,782,000,000**	**363,128,073.64**

**අමාත්‍යාංශ ගිණුම් අංශය මඟින් ලබා දී ඇති වියදම් වාර්තාව අනුව තොරතුරු දක්වා ඇත.*

වැව් මැණුම් කටයුතු පිළිබඳ ප්‍රගති සාරාංශය 2023 දෙසැම්බර් 31 දක්වා

දිස්ත්‍රික්කය	වැව් සංඛ්‍යාව	2023 වර්ෂයට පෙර නිම කරන ලද වැව් සංඛ්‍යාව	2023 වර්ෂයේ දී නිම කරන ලද වැව් සංඛ්‍යාව	ක්‍රියාත්මක වෙමින් පවතින	ඉතිරි ව්‍යාපෘති සංඛ්‍යාව	අවලංගු කරන ලද / අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	මිනින්දෝරුවන් සංඛ්‍යාව
මහනුවර	37	10	24	3	0	0	2
පුත්තලම	106	3	13	4	85	1	1
කුරුණෑගල	95	18	37	0	40	0	2
අනුරාධපුර	109	7	11	34	55	2	2
හම්බන්තොට	419	48	61	96	212	0	4
මොණරාගල	422	26	6	18	372	0	1
ත්‍රිකුණාමලය	65	3	11	19	32	0	3
අම්පාර	141	6	5	47	83	0	1
රත්නපුර	24	8	0	16	0	0	0
වව්නියාව	53	0	24	29	0	0	1
එකතුව	**1471**	**129**	**192**	**266**	**879**	**3**	**17**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහා පරිමාණයහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

1. යාන් ඔය ව්‍යාපෘතිය
2. පහළ උඟව ව්‍යාපෘතිය
3. මොරාණ ජලාශය
4. ඇල්ල වැව ජලාශය
5. කුඹුක්කන්ඔය ජලාශය
6. රූගම් කිතුල් ජලාශය (මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය)
7. පොළොන්නරු දිස්ත්‍රික්වාරි සංවර්ධන ව්‍යාපෘතිය
8. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)
9. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
10. ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම
11. කැළණි, මුන්දෙනි ආරු, කළුගඟ, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේව්‍යාපෘතිය
12. මා ඔය, අත්තනගලු ඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීම
13. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම
14. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය
15. හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
16. මහගල්ගමුව පෝෂිත ඇළ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 48,355.30	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර සහ ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 169 නව ප්‍රදේශ හෙක්ටයාර 1515 ඇතුළුව හෙක්ටයාර 8,700
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2012 පෙබරවාරි - 2019 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 9,000
	කාලය දීර්ඝ කිරීම	2019 දෙසැම්බර් - 2024		
ප්‍රතිපාදන 2023		රු.මි. 3,500.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 6,000.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි.39, 376.02	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	92.00
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි.2,484.97		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		ඉස්සන්වැව නව කුඹුරු ඉඩම් සංවර්ධනය, ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය, ත්‍රිකුණාමල කලාපය යටතේ වැව් 07ක් හා පුල්මුඩේ අමුණ ව්‍යාපාරයේ නවීකරණ කටයුතු, ජලාශ සහ වම් ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය යටතේ වන්දි ගෙවීමේ කටයුතු.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• පදවිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ, පුල්මුඩේ අමුණ ව්‍යාපාරයේ හා යාන්ඔය දකුණු ඉවුර ගෝමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මධ්‍ය හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල ජල ගැටලු වලට විසඳුමක් ලබාදීම • අනුරාධපුර හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක සඳහා පානීය ජලය සැපයීම. • පවුල් 7000ට වැඩි ප්‍රමාණයකට සෘජු හා පවුල් 3000ට වැඩි ප්‍රමාණයට වක්‍ර ප්‍රතිලාභ ලබාදීම. • වාහල්කඩ හා ත්‍රිකුණාමලය අතර නව මාර්ග පද්ධතිය තුළින් ගමනා ගමන දුර අවම කරගැනීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		ඉස්සන්වැව සහ ඕමාරකඩ නව කුඹුරු ඉඩම් සංවර්ධනය, ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය, ඉතිරි වන්දි ගෙවීම, ත්‍රිකුණාමල කලාපය යටතේ වැව් 07ක් හා පුල්මුඩේ අමුණ ව්‍යාපාරයේ නවීකරණ කටයුතු, අලිවැට ඉදිකිරීම හා පාරිසරික කළමනාකරණ කටයුතු සහ යලි පදිංචි කිරීමේ ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය		

2. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 1,250.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	වටගල ආර - 0.2 MCM මල්ලිපොත - 1 MCM දෙබර ආර -1.25 MCM පවතින ප්‍රදේශ - හෙක්ටයාර 971 නව ප්‍රදේශ - හෙක්ටයාර 728
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2007 - 2011	**ප්‍රතිලාභීන්**	වටගල ආර - පවුල් 32 මල්ලිපොත - පවුල් 250 දෙබර ආර - පවුල් 72
	කාලය දීර්ඝ කිරීම	2011 - 2023		
ප්‍රතිපාදන 2023		රු.මි. 30.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 776.23	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	91
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 29.54		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		දෙබර ආර පෝෂිත ඇළ ඉදිකිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		නව ඉඩම් හෙක්ටයාර 728ක් සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 971ක් සඳහා දෙකන්නය වගා කිරීමට වාරිමාර්ග පහසුකම් සැලසීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		ජාතික මෙහෙයුම් මැදිරියේ (NOR) තීරණවලට අනුව අවශ්‍ය ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘති කටයුතු නතර කරන ලදී.		

3. මොරාණ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 2,900.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 16 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2012-2015	**ප්‍රතිලාභීන්**	පවුල් 1,300
	කාලය දීර්ඝ කිරීම	2015– 2024		

ප්‍රතිපාදන 2023	රු.මි. 180.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 170.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,726.51	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.11
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 71.18		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	ඉඩම් විධිමත් කිරීම සහ ඉඩම් සංවර්ධනය, නැවත පදිංචි කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින සහ නව ඉඩම් හෙක්ටයාර 570කට වාරි පහසුකම් සැලසීම සහ ගොවි පවුල් 1300කට ප්‍රතිලාභ ලබා දීම. • මොරාණ, මහලුණුක, කුඩා ලුණුක, තිස්සපුර අළුත්කැටියාව සහ යල්වෙල ග්‍රාම නිලධාරී වසම්වල ජනතාවට පානීය ජලය සහ ගෘහාශ්‍රිත ජලය සැපයීම. • මී මැසි පාලනය හා සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවැත්වීම • මිරිදිය ධීවර කර්මාන්තයට අදාලව වැඩසටහන් දියත් කිරීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	ඉඩම් අත්පත් කරගැනීම සහ නැවත පදිංචි කිරීම		

4. ඇල්ල වැව ජලාශය

ඇස්තමේන්තුගත මුදල	රු.මි.1,532.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	රත්නපුර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.91 පවතින ඉඩම් හෙක්ටයාර 456 නව ඉඩම් හෙක්ටයාර 141.6
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021-2024)	**ප්‍රතිලාභීන්**	පවුල් 4,000
ප්‍රතිපාදන 2023	රු.මි. 100.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 500.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 301.84	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	15.51
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 39.70		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රධාන බැම්මේ වම් ඉවුර 80% කින් කැණීම් කටයුතු අවසන් කිරීම. • සොරොව්වේ වැඩ කටයුතු 45% කින් අවසන් කිරීම.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම • වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම සහ වාරිමාර්ග ප්‍රදේශයේ අක්කර 350 කින් පුළුල් කිරීම. • කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් පානීය ජල ඉල්ලුම 7000 m3/දිනකට සැපයීම. • මිරිදිය ධීවර කර්මාන්තයට සහ පාරිසරික අවශ්‍යතාවලට සේවය කිරීම. • ප්‍රදේශයේ CKDU ගැටලුව වැළැක්වීම.
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	• ප්‍රධාන වැව් බැම්මේ කටයුතු 60% කින් අවසන් කිරීම. • සොරොව්වේ වැඩකටයුතු 95% කින් අවසන් කිරීම. • දෙවන සෑදල වේල්ලෙහි කටයුතු 93% කින් අවසන් කිරීම.

5. කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 32,397.30	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 48 හෙක්ටයාර 5,429
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2016 - 2019	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
	කාලය දීර්ඝ කිරීම	2019 - 2023		
ප්‍රතිපාදන 2023		රු.මි. 125.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 521.54	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.05
2023වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 104.35		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		ප්‍රාරම්භක වැඩ 27% කින් නිම කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• වාරිමාර්ග ප්‍රදේශය වැඩි කිරීම. (වාරි ජලය 13,415Ac) • ගෘහස්ථ හා කාර්මික ජලය සැපයීම (වාර්ෂිකව 12MCM). • ගංවතුරපාලනය සඳහා සැලකිය යුතු දායකත්වයක් දැක්වීම. • ජල විදුලි උත්පාදනය (වාර්ෂිකව16.1GWh)		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ අනුව ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත.		

6. මුන්දෙනි ආරු ගංහාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල්)

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 24,141.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර සහ මඩකලපුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය / විදේශීයණය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	රූගම් කිතුල් - ඝන මීටර මිලි.58 මහ ඔය - ඝන මීටර මිලි.80 හෙක්ටයාර 6,500
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2016 - 2021	**ප්‍රතිලාභීන්**	පවුල් 50,000
	කාලය දීර්ඝ කිරීම	2021 - 2027		
ප්‍රතිපාදන 2023		GoSL- රු.මි. 15.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	GoSL- රු.මි. 110.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 362.22	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.29
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 14.99		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		ඉඩම් අත්පත් කරගැනීම 4 වන වගන්තිය		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• කෘෂිකර්මාන්තය හා ගෘහස්ථ කටයුතු යන දෙකටම ජලය ලබාදීමෙන් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම • මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000 කට පානීය ජලය සැපයීම • පහළ නිම්නයේ ගංවතුර අවම කිරීම • ජලාශ දෙකෙහිම මිරිදිය ධීවර කටයුතු වැඩි කිරීම		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		• 16 වගන්තිය දක්වා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු • ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සඳහා කාර්යාල ගොඩනැගිල්ල (මහාඔය) ඉදිකිරීම • මිනුම් කටයුතු (ඉඩම් අත්පත් කරගැනීමේ අවසන් කටයුතු) • ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අධීක්ෂණය, ඇගයීම සහ ප්‍රසම්පාදන කටයුතු • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ මූලික ප්‍රවේශ කටයුතු • පූර්ව සැලසුම් වැඩ		

7. පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 7,000.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	අක්කර අඩි 351,700 (ජලාශ 04)
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2017 - 2021	**ප්‍රතිලාභීන්**	පවුල් 29,790
	කාලය දීර්ඝ කිරීම	2021 - 2024		
ප්‍රතිපාදන 2023		රු.මි. 200.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 700.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 1476.93	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	30.00
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 143.66		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• කවුඩුල්ල දම්සෝපුර ව්‍යාපාරය - ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම • ට්‍රැක් 30හි අක්කර 120කට ජලය ලබා දීම සඳහා FC 01 ඇළ කි.මී. 2.8 දිගු කිරීම. • ඇලහැර කොට්ඨාශයේ B 505 ශ්‍රී කඳුයාය FC 16/1 ඇලෙහි 0+400 සිට 0+425 දක්වා කොටසෙහි පැති බැම්මක් ඉදිකිරීම • ඇලහැර කොට්ඨාශයේ කුමාරඇල්ල අමුණෙහි පහළ බෑවුමෙහි කළුගල් ඇසුරුම යෙදීම • ඇලහැර කොට්ඨාශයේ ට්‍රැක් 30 කොටසේ අක්කර 10 ක කුඹුරු ඉඩම් ප්‍රමාණයකට ජලය ලබාගැනීම සඳහා FC 05 ඇළ මීටර් 164 කින් දීර්ඝ කිරීම. • පොළොන්නරුව කොට්ඨාශයේ ඩී 01 නැගෙනහිර ඇළෙහි වම් ඉවුරෙහි මීටර් 68ක් දිගට පැති බැම්මක් ඉදිකිරීම. • පොළොන්නරුව කොට්ඨාශයේ ඩී 01 නැගෙනහිර FC 04 ඇළෙහි මීටර් 14ක් දිගට පැති බැම්මක් ඉදිකිරීම. • පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය වැව් බැම්මේ 8+550 සිට 8+700 කොටසෙහි පාදමේ කළුගල් බර පැටවුම් නිර්මිතය (Loading berm) ඉදිකිරීම. • අභලවාන වාන් නිර්මිතයේ අරීය දොරටු අළුත්වැඩියා කර කේබල් නැවත යෙදීම • ගිරිතලේ දකුණ ඉවුර ප්‍රධාන ඇළ, D 5 ඇළෙහි හැරවුම් නිර්මිතය පුනරුත්ථාපනය කිරීම. • 11 මින්නේරිය කොට්ඨාශයේ මින්නේරිය කන්තලේ යෝධ ඇළ බැම්මේ 4+087 සිට 4+162 දක්වා කොටසෙහිගේ බියන් රැඳවුම් බැම්ම යෙදීම		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවි පවුල් 29,700කට යල මහ දෙකන්නය වගා කටයුතු සිදුකර ගැනීම සඳහා ජල පහසුකම් සැපයීම
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	• පරාක්‍රම සමුද්‍රය වැව් බැම්ම වැඩිදියුණු කිරීම • පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරයේ ඩි 01 උතුර සහ නැගෙනහිර ඇළවල් වැඩිදියුණු කිරීම හා ඩී 01 ප්‍රධාන ඇළ වැඩිදියුණු කිරීම • මින්නේරිය කොට්ඨාශයේ කවුඩුල්ල වාන් ඇළ වැඩිදියුණු කිරීම (කහඹිලිය වැව). • මින්නේරිය කොට්ඨාශයේ ගිරිතලේ වැවෙහි ජල කාන්දුව පිළිසකර කිරීම • මින්නේරිය ව්‍යාපාරයේ දකුණු ඉවුර ප්‍රධාන ඇළ වැඩිදියුණු කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ දම්සෝපුර FC 7 ඇළ වැඩිදියුණු කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ පහත් මට්ටම් ප්‍රධාන ඇළ වැඩිදියුණු කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ අඹගස්වැව ව්‍යාපාරයේ ඇළවල් වැඩිදියුණු කිරීම සහ මහහල්මිල්ල වැව වාන් ඇළ සහ දියපැන්නුම වැඩිදියුණු කිරීම • ඇලහැර කොට්ඨාශයේ අත්තනකඩවල ට්‍රැක් 41 ඇළ මාර්ගය දීර්ඝ කිරීම • ඇලහැර කොට්ඨාශයේ ඉහකුළුවැව ඇළ මාර්ගය ඉදිකිරීම සහ නැහින්න ව්‍යාපාරයේ ජල පාලකය ඉදිකිරීම

*තෝරාගත් මහා වාරි පද්ධතිවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු යටතේ ප්‍රතිපාදන ලැබිණි.

8. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 2,500.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	- හෙක්ටයාර 3,179
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2017 - 2019	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000
	කාලය දීර්ඝ කිරීම	2019 - 2023		
ප්‍රතිපාදන 2023		රු.මි. 150.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 1,221.21	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	60.64
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 41.08		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• දෙටගමුව වැව ප්‍රතිසංස්කරණය - 98% • ඌරඋල වැව ප්‍රතිසංස්කරණය කිරීම -20%		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• දැනට පවතින හෙක්ටයාර් 3179 ක ඉඩම් සඳහා වාරි පහසුකම් සැපයීම • අත්හැර දැමූ මධ්‍යම පරිමාණ වැව් ප්‍රතිසංස්කරණය කිරීම • නව සහ වැඩිදියුණු කළ තාක්ෂණ ක්‍රම සහ ආදර්ශ පිළිබඳ නියමු අධ්‍යයනය
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	-

9. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 1000.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කොළඹ, ගම්පහ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2018 - 2020	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000ක් පමණ
	කාලය දීර්ඝ කිරීම	2020 - 2024		
ප්‍රතිපාදන 2023		රු.මි. 400.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 670.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 461.54	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	41.95
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 31.01		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• ගංවතුර ආරක්ෂණ බැම්ම පිළිසකර කිරීම හා වැඩිදියුණුකිරීම. • ගංවතුර ආරක්ෂණ නිර්මිත වැඩිදියුණුකිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		කැළණි ගඟ ආශ්‍රිතව පවුල් 15,000කගේ පමණ ජීවිත හා ඔවුන්ගේ දේපළ, කර්මාන්ත, මාර්ග හා යටිතල පහසුකම් ගංවතුරෙන් ආරක්ෂා කිරීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		• ගංවතුර ආරක්ෂණ බැම්ම පිළිසකර කිරීම හා වැඩිදියුණු කිරීම(කැළණි උතුරු බැම්ම). • සුළු ගංවතුර ආරක්ෂණ බැම්ම පිළිසකර කිරීම හා වැඩි දියණු කිරීම. • ගංගා ඉවුරු සංරක්ෂණය • ඉඩම් අත්පත් කරගැනීම සහ වන්දි ගෙවීම.		

10. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 234.63	ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය	ඝන මීටර මිලියන 0.25 හෙක්ටයාර 119
ව්‍යාපෘති කාලය	මූලික ගිවිසුම් කාලය	2018 - 2020	ප්‍රතිලාභීන්	පවුල් 265
	කාලය දීර්ඝ කිරීම	2020 - 2023		
ප්‍රතිපාදන **2023**		රු.මි. 63.00	**2024** වසර සඳහා ප්‍රතිපාදන	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 199.45	සමස්ථ භෞතික ප්‍රගතිය (%)	84.93
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 27.98		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• පිටවාන ඉදිකිරීම • රළපනාව (Rip rap) හා දියපෙරනය (Toe Filter) ඉදිකිරීම. • වම් ඉවුරු සොරොව්ව සහ දකුණු ඉවුරු සොරොව්වඉදිකිරීම • අමුණ (Anicut) ඉදිකිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• හෙක්ටයාර119ක් වගා කිරීම සඳහා යල මහ දෙකන්නයට වාරි ජලය සැපයීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		සංශෝධිත ඇස්තමේන්තුව සහ කාලය දීර්ඝ කිරීමට කැබිනට් අනුමැතිය සඳහා යොමු කර ඇත.		

11. කැළණි, මුන්දෙනි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 2,100.00	ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක	ගාල්ල, මාතර, කළුතර, කොළඹ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය	-
ව්‍යාපෘති කාලය	අවුරුදු 05 (2018 - 2023)	ප්‍රතිලාභීන්	පවුල් 37,000
ප්‍රතිපාදන **202**3	රු.මි. 100.00	**2024** වසර සඳහා ප්‍රතිපාදන	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 491.52	සමස්ථ භෞතික ප්‍රගතිය (%)	24.99

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 96.92
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• කැළණිගඟ, කළුගඟ, ගිංගඟ හා නිල්වලා ගඟ ද්‍රෝණිවල ගංවතුර ආරක්ෂණ බැම්ම පුනරුත්ථාපනය කිරීම. • ගංවතුර බස්නා ඇළ පද්ධති හා ගංවතුර පාලන නිර්මිත අළුත්වැඩියා කිරීම. • නිල්වලා පොම්පාගාර පුනරුත්ථාපනය කිරීම.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගිං ගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,000ක් පමණ ගංවතුරෙන් ආරක්ෂාවීම සහ පවුල් 20,000ක් පමණ ගංවතුර ආපදා වලින් මුදවා ගැනීම. • නිල්වලා ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,060ක් ගංවතුරෙන් ආරක්ෂාවීම සහ පවුල් 12,000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂාවීම. • කළුගඟ ද්‍රෝණියේ කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 200ක් පමණ ආරක්ෂාවීම සහ පවුල් 5,000ක් පමණ ගංවතුර ආපදා වලින් ආරක්ෂාවීම.
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	2024 සඳහා ප්‍රතිපාදන නොමැත

12. මාඔය, අත්තනගලුඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 500.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගම්පහ, කුරුණෑගල, කළුතර, ගාල්ල, පුත්තලම හා කෑගල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	අවුරුදු 01 (2023)	**ප්‍රතිලාභීන්**	එම ගංගා ආශ්‍රිතව ජීවත්වන ජනතාව
ප්‍රතිපාදන 2023	රු.මි.500.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 151.51	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	40
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි 151.51		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• අත්‍යාවශ්‍ය ජලාපවහන ඇළ මාර්ග පිරිසිදු කිරීම සහ ප්‍රධාන ගංඟාවන්හි අවහිරතා ඉවත් කිරීම. • ගංඟාවන්හි අවදානම් ස්ථාන වල ගං ඉවුරු ආරක්ෂණය සහ ගංවතුර බැම්ම ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම • බෙන්තර ගඟෙහි ලවණ බාධක බැම්ම සහ නිර්මිත වැඩිදියුණු කිරීම.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ද්‍රෝණි තුනේ නාගරික ප්‍රදේශවල ගංවතුර හානි අවම කිරීම. • ගංවතුර හානි සඳහා වාර්ෂිකව ගෙවනු ලබන වන්දි මුදල අඩු කිරීම. • වගා හානි සහ ප්‍රදේශයේ ජන ජීවිතයටවන බාධා අවම කිරීම
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	2024 සඳහා ප්‍රතිපාදන නොමැත

13. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 6,000.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 23 හෙක්ටයාර 1078
ව්‍යාපෘති කාලය	අවුරුදු 03 (2021 - 2023)	**ප්‍රතිලාභීන්**	පවුල් 25,000
ප්‍රතිපාදන 2023	රු.මි. 5.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 162.14	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	4.95
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2.74		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	-		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මහ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුද්ගලයින් 25,000කට පානීය ජලය සැපයීම • මහ විලච්චිය ප්‍රධාන වාරි යෝජනා ක්‍රමයේ වගා තීව්‍රතාව 1.57 සිට 2.0 දක්වා ඉහළ නැංවීම • විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වනජීවීන්ට ජලය සැපයීම • මිනිස් අලි ගැටුම් අවම කිරීම • පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම • ඔයාමඩුව ඖෂධ කාර්මික කලාපයට ජලය සැපයීම		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ අනුව ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත.		

14. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 17,914.19	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	අලිකොටආර- ඝන මීටර මිලි6.5 කුඩාඔය- ඝන මීටර මිලියන 22.6 හඳපානාගල - ඝන මීටර මිලියන 14 නව ඉඩම් හෙක්ටයාර 4500 පවතින ඉඩම් හෙක්ටයාර් 1500
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2013 - 2022	**ප්‍රතිලාභීන්**	පවුල්5,700
	කාලය දීර්ඝ කිරීම	2022 - 2024		
ප්‍රතිපාදන 2023		රු.මි. 3,070.00	**2024 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.3,500.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 14,945.28	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	87.05
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 3,067.68		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		• කුඩාඔය ජලාශය ඉදිකිරීම – 100% • හඳපානාගල ජලාශයේ වම් ඉවුරු ඇළ (කි.මී. 11) ඉදිකිරීම – 100% • අලිකොට ආර - කුඩාඔය හරස් ඇළ ඉදිකිරීම – 100% • කුඩාඔය - සිංහලයාගම හරස් ඇළ ඉදිකිරීම – 100% • හඳපානාගල අමුණ – 75% • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව – 100%		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ		• වාර්ෂිකව උමා ඔය ද්‍රෝණියේ සිට කිරිදි ඔය ද්‍රෝණියට ඝන මීටර මිලියන 145 ජලය සැපයීම • නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර් 1500 කට ජලය සැපයීම. • මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30පානීය හා කාර්මික ජලය සැපයීම. • සත්ව ගොවිපල සහ මිරිදිය ධීවර සංවර්ධනය • පුහුණු සහ නුපුහුණු පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා • නවීන තාක්ෂණික දැනුම හුවමාරු කිරීම • කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන		• කුඩාවැව් 16කවැඩ නිමකිරීම • කුඩාඔය ජලාශයේ වැඩ නිමකිරීම • අලිකොට ආර සිට කුඩාඔයට මාරුඇළ (කුඩාඔයට) සහ කුඩාඔය සිංහලයාගම මාරු ඇළ සම්පූර්ණ කිරීම		

15. හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 7,155.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	හෙක්ටයාර්744
ව්‍යාපෘති කාලය	2020 - 2024	**ප්‍රතිලාභීන්**	ලග්ගල පල්ලේගම සහ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගොවි ජනතාව
ප්‍රතිපාදන 2023	රු.මි. 250.00	**2024වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි.250.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 629.81	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	5.93
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 231.00		
2023වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ අනුව, • හිඹිලියාකඩවැව පවත්නා වැව්බැම්ම වැඩිදියුණු කිරීම • 2022 වර්ෂයේ ආරම්භ කළ වත්තේගෙදරවැව සොරොව්ව ඉදිකිරීම සම්පූර්ණ කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වත්තේගෙදර වැව මගින් දැනට පවතින කුඹුරු අක්කර 1300කට හා නව කුඹුරු අක්කර 1010කට යල මහ දෙකන්නයේ ජලය සැපයීම. • යල මහ කන්න දෙකටම වාරි ජලය සැපයීමෙන් බෝග තීව්‍රතාවය 1.00 සිට 2.00 දක්වා වැඩි කිරීම. • ආරක්ෂිත පානීය ජලය සහ ගෘහස්ථ ජලය සැපයීම තුළින් CKD (නිදන්ගත වකුගඩු රෝගය) වැනි සෞඛ්‍යය ගැටළු අවම කිරීම. • ගොවි පවුල්වල ආර්ථික තත්ත්වය ඉහල නැංවීම. • භූගත ජල මට්ටම ඉහළ නැංවීම • අලි මිනිස් ගැටුම් අවම කිරීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	• වත්තේගෙදර වැව, වැව් බැම්මේ ඉදිකිරීම් කටයුතු • වත්තේගෙදර වැව, සොරොව්ව හා පිටවාන ඉදිකිරීම් කටයුතු • හිඹිලියාකඩ වැව වැඩිදියුණු කිරීම		

16. මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 500.00	ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක	කුරුණෑගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය	ඝන මීටර මිලියන 8 හෙක්ටයාර 566
ව්‍යාපෘති කාලය	2014 - 2023	ප්‍රතිලාභීන්	පවුල් 2,000
ප්‍රතිපාදන 2023	රු.මි. 72.00	2024 වසර සඳහා ප්‍රතිපාදන	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 374.99	සමස්ථ භෞතික ප්‍රගතිය (%)	61
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	-		
2023 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	වැඩ බිමෙහි පවතින තත්ත්වයන් අනුව ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	අළුත් හා පවත්නා ඉඩම් හෙක්ටයාර 566ක් සඳහා වාරි ජලය සැපයීම.		
2024 වසර සඳහා යෝජිත වැඩසටහන	ඇස්තමේන්තු සංශෝධනයට අනුව ඉතිරි කටයුතු කරගෙන යාම.		

ශ්‍රී ලංකා මහවැලිඅධිකාරිය

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය

1.1 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු. මි. 3,957.10	ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක	අනුරාධපුර, වව්නියා, මුලතිව්
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය	-
ව්‍යාපෘති කාලය	මූලික ගිවිසුම් කාලය	2012 ජනවාරි - 2018 දෙසැම්බර්	ප්‍රතිලාභීන්	පවුල් 5,700
	කාලය දීර්ඝ කිරීම	2018 දෙසැම්බර් - 2023 දෙසැම්බර්		
ප්‍රතිපාදන 2023		රු. මි. 32.00	2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන	-

සමුච්චිත මුල්‍ය ප්‍රගතිය	රු. මි. 2,545.70	**සමස්ථ භෞතික ප්‍රගතිය**	98%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 10.33		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මාර්ග ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීම - කි.මී. 30 • වැව් පුනරුත්ථාපනය - වැව් 02 • ඇළ පුනරුත්ථාපනය - කි.මී 1.5 • ගොඩනැගිලි ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීම - ගොඩනැගිලි 01 • බිම් කොටස් මැනුම් - කැබලි අක්කර 744 • ඔප්පු ප්‍රදානය - ප්‍රදාන සහ ඔප්පු 1,940ක් සම්පූර්ණ කර ඇත. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන - වැඩසටහන් 83ක් අවසන් කරඇත.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මාර්ග ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය - කි.මී. 422 • තල බෝක්කු 393ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. • ඇළ කි.මී 81ක් ප්‍රතිසංස්කරණය කර ඇත. • වැව් ප්‍රතිසංස්කරණය සහ වාහයක් ඉදිකිරීම් / ප්‍රතිසංස්කරණය කිරීම - වැව් 02 සහ වාහ 131ක් • කැබලි අක්කර 16,698ක් මැනීම. • ප්‍රධාන සහ ඔප්පු 5,412ක් සම්පූර්ණ කර ඇත. • ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් 1,498ක් පවත්වන ලදී. • ගොඩනැගිලි 140ක් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම. • ගොවීන් 5,800ක් සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් ව්‍යාප්ති සේවා.		
2024 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන	ව්‍යාපෘතිය අවසන් කර ඇත.		

1.2 රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 1,086.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර (මහ ඔය / පදියතලාව)
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	-
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2012 ජනවාරි - 2019 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 19,127
	කාලය දීර්ඝ කිරීම	2019 දෙසැම්බර් සිට 2023 දෙසැම්බර්		
ප්‍රතිපාදන 2023		රු.මි. 43.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		රු.මි. 746.27	**සමස්ථ භෞතික ප්‍රගතිය**	100%

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 39.62
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ගෙවතු වගා සංවර්ධන වැඩසටහනයටතේ ගෙවතු 1,500ක් සංවර්ධනය කිරීම. • ජනපදිකයින් සඳහා ඉඩම් ඔප්පු 341ක් ලබා දීම. • සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ණය යෝජනා ක්‍රමය යටතේ 50 දෙනෙකු සඳහා ණය ලබාදීම. • වැව් 02ක් ප්‍රතිසංස්කරණය කිරීම. • ග්‍රාමීය මාර්ග කි.මී. 20ක් මෝටර්ග්‍රේඩර් කිරීම. • ඉඩම් අත්පත් කරගැනීම් සඳහා කට්ටි 24ක් වෙනුවෙන් වන්දි ගෙවීම. • ඉඩම් කට්ටි 600ක් මැනුම් කිරීම. • පානීය ජල පහසුකම් සැපයීම (ප්‍රතිආශ්‍රැති ජල පිරිපහදු යන්ත්‍ර 05ක් ඉදිකිරීම) • කුඹුරු ඉඩම් කට්ටි 178ක් රළු මට්ටම් කිරීම.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවිජවුල් 3,550ක් සඳහා ව්‍යාප්ති සේවාවන් සැපයීම. • මහඔය සහ පදියතලාව කොට්ඨාශවල පොදු/ප්‍රජා ගොඩනැගිලි 76ක් ඉදිකර ඇත. • ග්‍රාමීය මාර්ග කි.මී. 260ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කර ඇත. • ඉඩම් කට්ටි 4,087 ක් මැනුම් කර ඇත. • ඉඩම් අත්පත් කර ගැනීම් වෙනුවෙන් කට්ටි 572ක් සඳහා වන්දි ගෙවා ඇත. • පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා පානීය ළිං 121ක් සහ ජල පිරිපහදු යන්ත්‍ර (RO Filter) 05ක් ඉදිකර ඇත. • සනීපාරක්ෂක වැසිකිලි 840 ක් ඉදිකිරීම සඳහා ආධාර ලබාදී ඇත. • වන ගහනය වැඩි කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් 08ක් පවත්වා ඇත. • ප්‍රජා සංවර්ධන වැඩසටහන් 515ක් පවත්වා ඇත. • කුඩා ව්‍යාපාර/ ව්‍යාවසාය සංවර්ධන වැඩසටහන් 61ක් පවත්වා ඇත. • ආනයනය සීමා කර ඇති බෝග වර්ග හෙක්. 2084ක වගාකිරීම සිදු කර ඇත. • කුඩා වැව් 03ක් සහ අමුණු 03ක් ප්‍රතිසංස්කරණය කර ඇත. ✓ ව්‍යාපෘති ප්‍රදේශයේ මාර්ග පද්ධතිය සංවර්ධනය,සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම,කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු සංවර්ධනය,සත්වපාලන කටයුතු සංවර්ධනය,(දියර කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය), රැකියා විරහිත තරුණ තරුණියන් හට වෘත්තීය පුහුණුව ලබාදී රැකියාගත කිරීම, වාරි ඇළ පද්ධති ප්‍රතිසංස්කරණය, යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රජා ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව, අධ්‍යාපන කටයුතු සංවර්ධනය
2024 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන	ව්‍යාපෘතිය අවසන් කර ඇත.

1.3 මහවැලි කලාපවල අතහැර දැමූ ඉඩම් ප්‍රයෝජනයට ගනිමින් කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 10ක් පිහිටුවීම

ඇස්තමේන්තුගත මුදල		රු.මි. 250.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, පොලොන්නරුව, මාතලේ, බදුල්ල, අම්පාර, මහනුවර, රත්නපුර, හම්බන්තොට, ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය		ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීවිත්‍රතාවය**	-
ව්‍යාපෘති කාලය	**මූලික ගිවිසුම් කාලය**	2023 අගෝස්තු - 2023 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	ගොවීන් 1,093
	කාලය දීර්ඝ කිරීම	2023 දෙසැම්බර් - 2024 දෙසැම්බර්		
ප්‍රතිපාදන 2023		රු.මි. 190.00	**2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන**	රු.මි.100.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය		ගෙවීම්රු.මි. 91.84	**සමස්ථ භෞතික ප්‍රගතිය**	78%
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය		රු.මි. 91.84		
2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන		වැඩසටහන ක්‍රියාත්මක කළ කාලය තුළ (2023 ජූලි සිට දෙසැම්බර් 2023 දක්වා) ප්‍රගතිය • B කලාපයෙහි විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 25 දෙනා තෝරාගෙනමූලික දැනුවත් කිරීම් හා පුහුණු කරප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලදී. • C කලාපයෙහි වැල් දොඩම් නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 62 තෝරාගෙනමූලික දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සිදුකරප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලදි. • D කලාපයෙහි මිරිස් හා එළවළු නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 30 දෙනා තෝරාගෙන මූලික දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සිදුකරන ලදි. • E කලාපයෙහි මිරිස් නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 27 ක් තෝරා අදාළ සියළු පුහුණු හා යෙදවුම් ලබාදී ක්ෂේත්‍රයේ වගාව පිහිටුවා ඇත. • G කලාපයෙහි පලතුරු නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 80 ක් සඳහා පුහුණු හා අදාළ රෝපණ ද්‍රව්‍ය ලබා දී වගාවන් ක්ෂේත්‍රයේ පිහිටුවා ඇත. • H කලාපයෙහි මිරිස් හා වටිනාකමින් වැඩි බෝග නිෂ්පාදන ගම්මානයසහ තැඹිලි නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් පිළිවෙලින් 65 දෙනෙකු සහ 200 දෙනෙකු බැගින් තෝරාගෙන අදාල දැනුවත් කිරීම් හා පුහුණු සිදු කර ඇත. නයි මිරිස් වගාව ආරක්ෂිත ගෘහ 65 ස්ථාපිත කරමින් මේ වන විට අදාළ		

	සැයපුම් ආයතන 2ක් සමග විදේශ වෙළඳපොල වෙත නිකුත් කරමින් පවතී. • H1 කලාපයෙහි බතල හා වැල් දොඩම් නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 32දෙනා තෝරාගෙන පුහුණු කටයුතු සිදුකර සියළු ප්‍රසම්පාදන කටයුතු අවසන් කරන ලදී. සූර්ය පැනලයන් 2 සඳහා තෝරා ගත් ගොවීන් දෙදෙනෙකු සඳහා එය ලබා දී ඇත. • L කලාපයෙහි මිරිස් හා එළවළු නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 14 දෙනා තෝරාගෙන මූලික දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සිදුකරන ලදී. • රඹකැන්ඔය කලාපයෙහිමඤ්ඤොක්කා නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 193 දෙනා තෝරාගෙන ඇති අතර වගාව ස්ථාපනය කරඇත. 2024 අගෝස්තු මස වන විට මේ වන විට ගිවිසුම් ගතව ඇති ආයතනය සමග අපනයන වෙළඳපොල වෙත නිෂ්පාදන යොමු කිරීමට සැලසුම් කර ඇත. • වලව කලාපයෙහි ඇඹුල් කෙසෙල් නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවින් 234 අදාළ වගාවන් පිහිටුවා අපනයන වෙළඳපොල ඉලක්ක කර ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී. වගා ළිං කැපීම, කෙසෙල් කැන් ආවරණ ලබා දීම හා අනෙකුත් සියළු පුහුණු ලබා දීම සිදු කර ඇත. 2024 අප්‍රේල් මස වන විට අපනයන කටයුතු ඇරඹීමට අදාළ ආයතන සමග කටයුතු සැලසුම් කරමින් පවතී. • ආරක්ෂිත ගෘහ 08ක් ඉදිකර ඒ තුළ එළවලු වගාවන් පිහිටුවා ඇත.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• දේශීය වෙළඳපළ මෙන්ම විදේශ වෙළඳපොළ අරමුණු කරගෙන උසස් ගුණත්වයෙන් යුතු මිරිස්, එළවළු, පලතුරු නිෂ්පාදන ගම්මාන 10ක් පිහිටුවීම. • විදේශ වෙළඳපොළ වෙත ආනයනය තුළින් විදේශ විනිමය උපයාගැනීම. • ආනයන ආදේශක බෝග වගාව තුළින් විදේශ විනිමය ඉතිරි කරගැනීම. • කෘෂි කර්මාන්තය මත පදනම් වූ සෘජු හා වක්‍ර රැකියා 2500ක් බිහිවීම. • උසස් තාක්ෂණය භාවිතය සඳහා තවත් ගොවි කණ්ඩායම් පෙළඹවීම.
2024 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන	• මහවැලි බී කලාපයේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ගම්මානය, සී කලාපයේ පැෂන් හා බුලත් ගම්මාන 2 හා වලව කලාපයේ තව දුරටත් ඇඹුල් කෙසෙල් ගම්මාන වැඩසටහන පුළුල් කිරීමට සැලසුම් කර ඇත

පාරිසරික, දේශගුණික, සමාජීය සහ ආර්ථික යන සියලු කරුණු සලකා බලා මෙමවැඩසටහන පහත පරිදි ක්‍රියාත්මක විය

වැඩසටහන	කලාපය	වෙන්කර ඇති ප්‍රතිපාදන (රු. මී.)	මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	අපේක්ෂිත ප්‍රතිලාභීන් ප්‍රමාණය	ලබා ගත් භෞතික ප්‍රගතිය අනුව ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වෙළඳපොළ ඉලක්කය	නිෂ්පාදන වර්ගය
විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ගම්මානය	B	9.2	0.08	25	-	ප්‍රධාන ලෙස අපනයනය	විසිතුරු මසුන්
වැල්දොඩම් නිෂ්පාදන ගම්මානය	C	17.10	-	62	-	ප්‍රධාන ලෙස අපනයනය	නැවුම් පළතුරු/ වැල්දොඩම්
මිරිස් හා එළවළු නිෂ්පාදන ගම්මානය	D	20.5	10.46	30	30	දේශීය වෙළඳපොල	අමු මිරිස් හා වියළි මිරිස්/එළවළු
මිරිස් නිෂ්පාදන ගම්මානය	E	3.0	2.29	20	27	දේශීය වෙළඳපොල	අමු මිරිස් හා වියළි මිරිස්
පළතුරු නිෂ්පාදන ගම්මානය	G	6.45	0.58	145	80	දේශීය හා විදේශීය	කෙසෙල්,ගස් ලබු,පේර
මිරිස් සහ මිල අධික බෝග නිෂ්පාදන/ තැඹිලි නිෂ්පාදන ගම්මාන	H	59.3	43.09	265	65	ප්‍රධාන ලෙස අපනයනය	නයි මිරිස් සහ තැඹිලි
බතල/ වැල්දොඩම් නිෂ්පාදන ගම්මාන	H1	4.21	1	32	2	දේශීය හා විදේශීය	බතල අල/ වැල්දොඩම්
මිරිස් සහ එළවළු නිෂ්පාදන ගම්මාන	L	10.0	4.68	14	14	දේශීය	අමු මිරිස් හා වියළි මිරිස් / එළවළු
මඤ්ඤොක්කා ගම්මාන	RO	10.0	8.99	245	193	විදේශීය	අල සහ පිටි
ඇඹුල් කෙසෙල් නිෂ්පාදන ගම්මාන	UW	50.24	20.67	300	234	ප්‍රධාන ලෙස අපනයනය	නැවුම් කෙසෙල්
එකතුව		**190.0**	**91.85**	**1,093**	**645**	**-**	**-**

2. මහවැලි අධිකාරිය යටතේ සිදුකරන සංවර්ධන කටයුතු

2.1. කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල ප්‍රගතිය

2.1.1 කෘෂි කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

අංක	ප්‍රධාන සංරචකය	කලාපය	ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)	2023.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටො)	%
1	**කෘෂිකාර්මික නිෂ්පාදනය**				
1.1	**බීජ - මහවැලි ගොවිපල**				
	බීජ වී	බී, සී, මොරගහකන්ද, එච්, එල්, වලව, රඹකැන්ඔය,	2380	2295.5	96%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	සියලුම කලාප	24.3	20.5	84%
1.2	**බීජ - ගොවින්**				
	බීජ වී	සියලුම කලාප	7408.5	9804.3	132%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	සියලුම කලාප	2878.83	1922.46	67%

- **ආහාර බෝග නිෂ්පාදනය - වී වගාව**

කලාපය	වාර්ෂික ඉලක්කය (මෙ. ටො.)	2023.12.31 දිනට නිෂ්පාදනය/ප්‍රගතිය (මෙ. ටො.)	%
බී	234,511	235,312	100%
සී	252,068	257,230	102%
ඩී	18,537	20,631	111%
ඊ	23,797	47,363	199%
ජී	58,000	67,814	117%
එච්	187,502	210,702	112%
එල්	16,141	26,558	165%
හුරුළුවැව	65,685	92,237	140%
රඹකැන්ඔය	11,774	14,999	127%
උඩවලව	118,442	148,996	126%
එකතුව	**986,458**	**1,121,842**	**114%**

- **ආහාර බෝග නිෂ්පාදනය - ලොකු ලූණු**

කලාපය	**වාර්ෂික ඉලක්කය (මෙ. ටොං.)**	**2023.12.31 දිනට නිෂ්පාදනය/ප්‍රගතිය (මෙ. ටොං.)**	**%**
බී	1,500	160	11%
සී	1,500	320	21%
ඩී	500	320	64%
ඊ	1,000	0	
ජී	15,000	320	2%
එච්	25,000	1,480	6%
එල්	2,400	0	
හුරුළුවැව	27,000	1,600	6%
රඹකැන්ඔය	900	0	
උඩවලව	0	40	
එකතුව	**74,800**	**4,240**	**6%**

- **ආහාර බෝග නිෂ්පාදනය -** බඩ ඉරිඟු

කලාපය	**වාර්ෂික ඉලක්කය (මෙ. ටොං.)**	**2023.12.31 දිනට නිෂ්පාදනය/ප්‍රගතිය (මෙ. ටොං.)**	**%**
බී	9,880	2,785	28%
සී	13,560	6,640	49%
ඩී	1,005	460	46%
ඊ	2,550	875	34%
ජී	3,050	1,280	42%
එච්	12,320	2,830	23%
එල්	5,600	275	5%
හුරුළුවැව	4,700	2,595	55%
රඹකැන්ඔය	27,815	20,310	73%
උඩවලව	6,650	2,055	31%
එකතුව	**87,130**	**40,105**	**46%**

- **ආහාර බෝග නිෂ්පාදනය - මිරිස්**

කලාපය	වාර්ෂික ඉලක්කය (මෙ. ටො.)	**2023.12.31** දිනට නිෂ්පාදනය/ප්‍රගතිය (මෙ. ටො.)	%
බී	1,820	859	47%
සී	1,830	1,144	63%
ඩී	550	250	45%
ඊ	500	321	64%
ජී	3,900	306	8%
එච්	10,070	,2101	21%
එල්	1,350	396	29%
හුරුළුවැව	4,130	993	24%
රඹකැන්ඔය	725	507	70%
උඩවලව	2,825	2,834	100%
එකතුව	**27,700**	**9,711**	**35%**

- **ආහාර බෝග නිෂ්පාදනය - වෙනත් ක්ෂේත්‍ර බෝග**

අංකය	ප්‍රධාන සංරචක	කලාපය	ඉලක්කය (මෙ. ටො.) වාර්ෂික	**2023.12.31** දිනට ප්‍රගතිය	%
1	**වෙනත් ක්ෂේත්‍ර බෝග**				
	සෝයා	එච්, හුරුළුවැව, රඹකැන්ඔය	12,560	12,202	97%
	උඳු	සියලුම කලාප	7,841	1,093	14%
	කවුපි	සියලුම කලාප	3,569	1,292	36%
	කුරක්කන්	සියලුම කලාප	2,647	1,229	46%
	මුං ඇට	සියලුම කලාප	1,434	1,142	80%
	රට කජු	සියලුම කලාප	11,055	2,661	24%
	තල	සියලුම කලාප	1,065	342	32%
	කහ	සියලුම කලාප	5,839	5,490	94%
	ඉඟුරු	සියලුම කලාප	3,230	3,660	113%
2	**පළතුරු**				
	කෙසෙල්	සියලුම කලාප	133,898	105,225	79%
	පැපොල්	සියලුම කලාප	22,620	16,260	72%
	පේර	සියලුම කලාප	15,850	11,050	70%
	අනෙකුත් පළතුරු (අඹ, ඩ්‍රැගන්ෆෘට්, අන්නාසි, පැෂන්, තැඹිලි)	සියලුම කලාප	89,940	66,060	73%
3	**එළවළු**	සියලුම කලාප	164,930	134,709	82%

2.1.2. පශු සම්පත් නිෂ්පාදනයේ ප්‍රගතිය

සත්ව පාලනය

- **මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය**

කලාපය	ඉලක්කය (මෙ.ටොා) වාර්ෂික	2023.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටොා)	%
බී	5,500.00	4,670.00	85%
සී	1,500.00	2,751.30	183%
ඩී	1,200.00	1,203.40	100%
ඊ	1,000.00	1,279.50	128%
ජී	500.00	197.00	39%
එච්	3,500.00	2,654.00	76%
එල්	300.00	156.30	52%
හුරුළුවැව	700.00	731.30	104%
රඹකැන්ඔය	1,100.00	1,469.00	134%
උඩවලව	2,200.00	2,316.70	105%
එකතුව	**17,500.00**	**17,428.50**	**100%**

- **කිරි නිෂ්පාදනය**

කලාපය	ඉලක්කය (ලිටර් මිලියන) වාර්ෂික	2023.12.31 දිනට ප්‍රගතිය (ලිටර් මිලියන)	%
බී	08.50	10.51	124%
සී	07.70	08.56	111%
ඩී	05.70	05.01	88%
ඊ	02.00	01.44	72%
ජී	00.70	00.44	63%
එච්	13.00	16.10	124%
එල්	02.50	01.36	54%
හුරුළුවැව	05.30	03.79	72%
රඹකැන්ඔය	08.60	04.36	51%
උඩවලව	06.00	05.38	90%
එකතුව	**60.00**	**56.95**	**95%**

- **බිත්තර නිෂ්පාදනය**

කලාපය	ඉලක්කය (මිලියන) වාර්ෂික	2023.12.31 දිනට ප්‍රගතිය (මිලියන)	%
බී	29.00	18.07	62%
සී	11.00	06.22	57%
ඩී	10.50	07.19	68%
ඊ	03.50	04.29	123%
ජී	03.00	01.09	36%
එච්	08.50	06.75	79%
එල්	05.50	03.57	65%
හුරුළුවැව	05.50	01.81	33%
රඹකැන්ඔය	07.50	07.93	106%
උඩවලව	16.00	06.99	44%
එකතුව	**100.00**	**63.91**	**64%**

- **විසිතුරු මසුන් වගාව**

කලාපය	ඉලක්කය (මිලියන) වාර්ෂික	2023.12.31 දිනට ප්‍රගතිය (මිලියන)	%
බී	28.00	28.17	101%
සී	02.00	02.10	105%
ඩී	01.50	01.53	102%
ඊ	00.50	00.67	134%
ජී	00.30	00.46	153%
එච්	05.00	05.07	101%
එල්	00.20	00.41	205%
හුරුළුවැව	02.00	02.02	101%
රඹකැන්ඔය	01.50	01.01	67%
උඩවලව	02.00	02.04	102%
එකතුව	**43.00**	**43.48**	**101%**

- **පශු සම්පත් හා සීවර අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්**

ප්‍රධාන ක්‍රියාකාරකම	ඒකකය	ක්‍රියාත්මක වූ කලාප	ඉලක්කය 2023	ප්‍රගතිය (2023.12.31)
කිරි ගව සංවර්ධනය				
ගොවිපල සැලසුම් සැකසීම හා කිරි ගොවීන් පුහුණු කිරීම	කිරි ගොවි පවුල්	කලාප 10	1101	731
ගව නිවාස හා උපාංග ලබාදීම	නිවාස හා උපාංග	කලාප 10	2170	1435
විසිතුරු මත්ස්‍ය වගාව				
අභිජනන ගොවිපල සංවර්ධනය	ගොවීන්	කලාප 10	125	85
මඩ පොකුණු/ නිරෝධායන පොකුණු ලබාදීම/ යටිතල පහසුකම් සංවර්ධනය	ගෘහ	සී, ඊ, එච්, එල්කලාප	21	11
කුකුළු නිෂ්පාදන ප්‍රවර්ධනය				
මසක් වයසැති පැටවුන් ලබාදීම	වැඩසටහන්	කලාප 10	54,627	28,454
කුකුළ් කූඩු හා වෙනත් උපකරණ ලබා දීම	කුකුළ් කූඩු හා උපකරණ	කලාප 10	286	224
පුහුණු වැඩසටහන් පැවැත්වීම	ගොවි පවුල්	කලාප 10	108	70
මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය				
මත්ස්‍ය ඇඟිල්ලන්	මිලියන	කලාප 10	08	05
මත්ස්‍ය ඇසිත්තන්	මිලියන	කලාප 10	18	09
මිරිදිය ඉස්සන්	මිලියන	කලාප 10	04	02
දැල්කූඩු ලබාදීම	කූඩු	ඊ කලාපය	05	05

2.2 ආයතන සංවර්ධන අංශයේ හා ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

ප්‍රධාන සංරචකය	ක්‍රියාත්මක වූ කලාප	ඉලක්කය	ප්‍රගතිය	%
වෘත්තීය පුහුණුව ලත් රැකියා විරහිත තරුණයින් රැකියා සඳහා යොමු කිරීම (තරුණයින්)	බී,සී,ඩී,ඊ,ජී,එල්,වල ව, හුරුළුවැව, රඹකැන්ඔය	1000	590	59%

ප්‍රධාන සංරචකය	ක්‍රියාත්මක වූ කලාප	ඉලක්කය	ප්‍රගතිය	%
අඩුආදායම් ලාභී පවුල් වලින් තෝරාගත් ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ හා දැනුවත් කිරීමේවැඩසටහන් පැවැත්වීම(වැඩසටහන්)	බී, සී, ඩී, ඊ, ජී, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, එච්	10	12	120%
මහවැලි කලාප තුළ සිටින දක්ෂ ක්‍රීඩකයින් හඳුනා ගැනීම හා ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම (ක්‍රීඩක ක්‍රීඩිකාවන්)	බී, සී, ඩී, ඊ, ජී, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, එච්	2050	2050	100%
මහවැලි කලාපවල දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම (ක්‍රීඩක ක්‍රීඩිකාවන්)	බී, සී, ඩී, ඊ, ජී, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, එච්	10	5	50%
කබඩි (පිරිමි/කාන්තා) හා නෙට්බෝල් අංශ සඳහා ජාතික පුහුණුකරුවන් යටතේ පුහුණුව ලබා දීම (ක්‍රීඩක ක්‍රීඩිකාවන්)	බී, සී, ඩී, ඊ, ජී, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, එච්	78	78	100%
මහවැලි සවිය ණය යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට ණය පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීම (ප්‍රතිලාභීන්)	බී, සී, ඩී, ඊ, ජී, එච්, එල්, හුරුළුවැව, වලව	500	470	97%
මොරගහකන්ද අත්වැල ණය යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට ණය පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීම (ප්‍රතිලාභීන්)	මොරගහකන්ද කලාපය	20	16	80%

2.3 ඉඩම් ලබාදීම

ශ්‍රීලංකා මහවැලි අධිකාරිය මගින් ප්‍රදාන නිකුත්කි රීමේ ප්‍රගතිය

කලාප	ඉලක්කය	2023.12.31 දිනට ලබාදුන් ඔප්පු පිළිබඳ ප්‍රගතිය
බී	8,415	3,335
සී	7,846	1,073
ඩී	1,084	182
ඊ	6,582	1,661
ජී	3,640	1,197
එච්	1,304	89
එල්	2,233	777
හුරුළුවැව	3,128	1,533
රඹකැන්ඔය	11,393	4,481
වලව	2,045	417
එකතුව	**47,670**	**14,745**

2.4 පරිසර සංරක්ෂණය

පරිසර සංරක්ෂණ වැඩසටහනේ ප්‍රගතිය

ප්‍රධාන සංරචකය	ඒකකය	ක්‍රියාත්මක වූ කලාප	ඉලක්කය 2023	ප්‍රගතිය 2023.12.31
පැළ නිෂ්පාදනය (මහවැලි තවාන්, පාසල් ළමුන් හා ගොවීන් මගින්)	පැළ	ඩී, ඊ, කොත්මලේ පරිසර අංශය	250,000	41,710
ඉහළ ජලාධාර හා පහළ නිම්න ප්‍රදේශ ආශ්‍රිත රුක්රෝපණය	පැළ	බී, සී, ඩී, ඊ, උඩවලව, මොරගහකන්ද, එච්, හුරුළුවැව, රඹකැන්ඔය, එල්, කොත්මලේ පරිසර අංශය	69,800	207,244
ඉහළ ජලාධාර ප්‍රදේශ ආශ්‍රිත පාංශු සංරක්ෂණ වැඩසටහන	මීටර	කොත්මලේ පරිසර අංශය	18,000	7,642
පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන	වැඩසටහන්	සී, කොත්මලේ පරිසර අංශය	66	15
පාරිසරික බලපෑම් අධ්‍යයනය	ව්‍යාපෘති	බී, එල්, උඩවලව	5	5
ඉහළ ජලාධාර ප්‍රදේශ ආශ්‍රිත ජල තත්ව හා ජල විද්‍යා අධ්‍යයනය	ස්ථාන	වික්ටෝරියා/ කොත්මලේ පරිසර අංශය	28	28

ප්‍රධාන සංරචකය	ඒකකය	ක්‍රියාත්මක වූ කලාප	ඉලක්කය 2023	ප්‍රගතිය 2023.12.31
පටක රෝපිත පැළ නිෂ්පාදනය	පැළ	කොත්මලේ පරිසර අංශය	300,000	88,000
අලිමිනිස් ගැටුම අවම කිරීම (අලිවෙඩි, එනජයිසර් ආදිය) හා ජීව වැට නඩත්තුව	කි.මී	ඩී, ඊ,උඩවලව	66	24
ආක්‍රමණශීලී ආගන්තුක ජලජ ශාක ඉවත්කිරීම	හෙක්ටයාර	කොත්මලේ පරිසර අංශය	1	1

වාරිමාර්ග කළමනාකරණ අංශය (IMD)

වාරිමාර්ග කළමනාකරණ අංශය ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන (INMAS) ක්‍රියාත්මක කිරීම සඳහා 1984 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.මෙම අංශය විසින් හෙක්ටයාර 400ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54ක සහභාගීත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ දැක්ම වනුයේ ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ස්වයං කළමනාකරණය සඳහා, ආත්ම විශ්වාසය පදනම් කරගත් වාරිමාර්ග ජනාවාස ආශ්‍රිත ශක්තිමත් ගොවි ප්‍රජාවක් බිහි කිරිමයි. ගොවි සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන ආයතන යන පාර්ශවයන්ගේ සහභාගිත්වය සහ දායකත්වය තුළින් මහා වාරිමාර්ග ව්‍යාපාරවල ජල ඒකකයක හා ඉඩම් ඒකකයක ඵලදායීතාවය ඉහළ නංවමින් ඒකාබද්ධ හා කාර්යක්ෂම ජල කළමනාකරණය තුළින් ගොවි ජනතාවගේ තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

මහා වාරිමාර්ග බල ප්‍රදේශවල විධිමත් කළමනාකරණයක් හරහා නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීමේ අරමුණෙන් ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම, යහපාලනය තහවුරු කිරීම සහ සක්‍රීයව හා තිරසර ලෙස පවත්වාගෙන යාම, වාරිමාර්ග උප පද්ධතියේ මෙහෙයුම් නඩත්තු කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන මෙහෙයවීම හා පෙළඹවීම, කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ජල ඒකකයක හා ඉඩම් ඒකකයක ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ආයතන සම්බන්ධීකරණය, ගොවි පවුලේ ආර්ථික සංවර්ධනය සඳහා සම්බන්ධීකරණය හා පහසුකරණය,ගොවීන්ගේ හා ගොවි සංවිධාන නිළධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම සඳහා පහසුකරණය මෙම අංශයේ වගකීම වේ.

- **දැක්ම**

  මහා වාරිමාර්ග ආශ්‍රිතව සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් බිහි කිරීම

- **මෙහෙවර**

  සංවිධිත ගොවි ප්‍රජාවක් තුළින් සහයෙදවුම් හා සේවා සැපයුම් ආයතන සම්බන්ධීකරණයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය හා වාරි ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නැංවීම

- **අරමුණු**

  i. වාරිමාර්ග ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් ලබන ආර්ථික වාසි උපරිම කිරීම

  ii. වාරිමාර්ග ජලය සාධාරණව හා සමානාත්මකව ගොවීන් අතර බෙදා ගැනීම සඳහා පහසුකරණය

  iii. වාරිමාර්ග ආශ්‍රිත සම්පත් කළමනාකරණයට ගොවීන් සහභාගී කරගැනිම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය සකස් කිරීම, ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම

  iv. වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා පසුබිම සැකසිම හා පහසුකරණය

  v. ප්‍රතිලාභීන් හා රජය මෙන්ම පෞද්ගලික ආයතන අතර මනා සම්බන්ධීකරණය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

  vi. ගොවි ප්‍රජාවගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම තුළින් සුභවාදී ආකල්ප ඇති කිරීම

  vii. කෘෂිකාර්මික සහාය සේවාවන් ශක්තිමත් කිරීම

  viii. ගොවි පවුල්වල ආර්ථික හා සමාජ සංවර්ධනය

2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය

1. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා බලගැන්වීම

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54හි ගොවි සංවිධාන 900ක් පිහිටුවාඇති අතර, එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කර ඒවායේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරුකිරීම හා සක්‍රීය මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

ඒ අනුව ගොවි සංවිධාන වල ගිණුම් කටයුතු යථාවත් කිරීම (861), අවසන් ගිණුම් සැකසීම (756), ගිණුම් බාහිර විගණනය (581), නිළවරණ පැවැත්වීම (258), මහා සභා රැස්වීම්පැවැත්වීම (1,614) සහ මාසික කමිටු රැස්වීම්පැවැත්වීම(6,609ක්) සිදුකර ඇත.

එසේම ගොවි සංවිධානවල ව්‍යවස්ථාව සංශෝධනය (60), සම්මත හා කාර්ය පරිපාටි හඳුන්වාදීම සහ ඒවා භාවිතය තහවුරු කිරීම (108ක්) සහ ගොවි සංවිධාන 70 ක් ආදර්ශ ලෙස සංවර්ධනය කිරීමත්, ගොවි සංවිධාන අරමුදල රු. මිලියන 62 දක්වා වර්ධනය කිරීමත් සිදුකරන ලදී.

2. වාරිමාර්ග කළමනාකරණය

ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් හා සේවා කලට වෙලාවට සැපයීම තහවුරු කිරීම සඳහා 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනත ප්‍රකාරව නියමිත වේලාවට පෙර කන්න රැස්වීම් පවත්වා කන්න රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය කිරීම සහ කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාරිමාර්ග කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා මාසිකව ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදුකරන ලදී.

ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් 438ක් ද, පෙර කන්න රැස්වීම් 194ක් ද, කන්න රැස්වීම් 170ක් ද පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය සකසා ඇත.

3. සහභාගීත්ව නඩත්තුව හා ජල කළමනාකරණ වැඩසටහන

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග බලප්‍රදේශ 54 හි වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇළ හා කෙත් ඇළ) මෙහෙයුම් හා නඩත්තු කටයුතු ගොවි සංවිධානවලට භාර දී ඔවුන් මගින් ඉටු කරවා ගනු ලබයි. මෙම කාර්යය ගුණාත්මයෙන් යුක්තව ඉටු කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙයවීම, මගපෙන්වීම, පහසුකරණය සහ ඒ සඳහා ගොවි සංවිධාන නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

ඒ අනුව බෙදුම් ඇළ දිග කි.මී. 2,775සහ කෙත් ඇළ දිග කි.මී. 5,631ක ඇළ සහ පාර දෙපස තණකොළ මට්ටමකට කැපීම සහ රොන් මඩ ඉවත් කිරීම, කෘෂි මංමාවත් දිග කි.මී. 108ක් නඩත්තු කිරීම, දියබස්නා ඇළවල් කි.මී.388ක් නඩත්තු කිරීම, වාරිමාර්ග නිර්මිත හා උපාංග නඩත්තුව සිදුකර ඇත.

එයට අමතරව සහභාගීත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩසටහන ප්‍රවර්ධනය සඳහා ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් 20ක් සැකසීම සහ සැළසුම් 311 ක් යථාවත් කිරීම , බෙදුම් ඇළ දිග කි.මී.218 හා කෙත් ඇළ දිග කි.මී. 960 ක රක්ෂිත මායිම් සලකුණු කිරීම සහ රක්ෂිතමායිම් සංරක්ෂණය කිරීම උදෙසා රක්ෂිත මායිම්වල ගල්කණු 3590 ක්ද, පැල 11,415 ක් ද සිටුවීම සිදු කරන ලදි. වාරි සංස්කෘතිකාංග ආරක්ෂා කිරීම සඳහාජලය ආශ්‍රිත පුජා කර්ම / චාරිත්‍ර වාරිත්‍ර ප්‍රවර්ධනය සඳහාගොවි සංවිධාන මට්ටමින් වැඩසටහන් 488 ක් සහ සිරි දළදා යල් අස්වනු පුජාව අටවෙනි වරට ශ්‍රී දළදා මාලිගාවේ දී පැවැත්වීම සිදුකර ඇත. එසේම කන්න රැස්වීම් තීරණ මත පදනම්ව, වාරිමාර්ග උප පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා ගොවීන් විසින් ගොවි සංවිධාන වල අරමුදල් වර්ධනය සඳහාලබා දී ඇති මුදල රුපියල් මිලියන 171ක් වේ.

4. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

මෙම අංශයේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග ව්‍යාපාර 54හි කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

විශේෂිත දර්ශක	2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය				
	ඒකකය	2022/23 මහ	2023 යල	2023/24 මහ	එකතුව
වී වගා කළ බිම් ප්‍රමාණය	හෙක්.	150,740	129,952	123,029	403,721
එළවළු හා වෙනත් ආහාර බෝග	හෙක්	5,451	13,952	1580	20,983
බහු වාර්ෂික බෝග වගාව(කෙසෙල්, උක්, ගස්ලබු)	හෙක්	4,600	4,150	203.5+1932	10,885.5
මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්.	160,791	148,054	126744.5	435,589.5
මුළු වී නිෂ්පාදනය	ටොන් මිලියන	0.536	0.544		1.08

5. ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ වැඩසටහන්

- හෙක්ටයාර 13628.2ක 3 වන කන්නයේ මුං වගාව ව්‍යාප්ත කිරීම (රිදිබැදිඇළ/ හක්වටුනාඔය/ බතලගොඩ/ මීඔය/ ඉඟිණිමිටිය/ තඹබෝව/ නීලබැම්ම/ රාජාංගනය/ පදවිය/ නුවරවැව/ කවුඩුවවැව / දේවහූව/ බත්මැඩිල්ල/ නාගදීප/ මුතුකණ්ඩිය/ වේලිඔය/ කිරිදිඔය/ රිදියගම/ ගල්ඔය වම් ඉවුර/ අක්කරපත්තුව/ දමන /කන්තලේ/ මහා වාරිමාර්ග ව්‍යාපාරවල)

- කාබනික පොහොර මෙ.ටො. 8,868.31ක් නිෂ්පාදනය (රිදිබැඳි ඇළ/ බතලගොඩ/ හක්වටුනා ඔය/ තඹබෝව රාජාංගනය/ පදවිය/ මහකනදරාව/ නුවර වැව/ තිසා වැව/ වාහල්කඩ/ ගිරිතලේ/ මිනිපේ/ මුරපොල ඇළ/ බත්මැඩිල්ල/ මුතුකණ්ඩිය/ රිදියගම/ දමන/ මොරවැව/ මහදිවුල් වැව මහා වාරිමාර්ග ව්‍යාපාර බල ප්‍රදේශ)

- කාබනික ද්‍රව්‍යක් ලෙස ග්ලිරිසීඩියා දඬු 61,090ක වගා කිරීම (රිදිබැදිඇළ, හක්වටුනාඔය, පදවිය, මහකනදරාව, නුවරවැව, මුතුකණ්ඩිය, රිදියගම, කන්තලේ ව්‍යාපාරවල).

- 2022/23 මහ සහ 2023 යල කන්න තුළ කාබනික පොහොර භාවිතා කර හෙක්ටයාර 69,914.5ක් වගා කිරීම

- කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි ගවයින් 35ක්, ගවගාල් 23ක්, හෙක්ටයාර 11.5ක CO3 තෘණ වගා කිරීම හා බැංකු මගින් රු.මිලි.4.21ක මූල්‍ය පහසුකම් ලබා දීමට අවශ්‍ය පහසුකරණය හා සම්බන්ධීකරණය කිරීම

- ගොවි සංවිධාන අරමුදල්වලින් ප්‍රතිලාභීන් 5128 දෙනෙකුට රුපියල් මිලියන 55ක වගාණය ලබා දීම සහ ප්‍රතිලාභීන් 145 දෙනෙකුට රු. මිලියන 16ක් ව්‍යාපෘති ණය ලබා දීම

- ලෝක පරිසර දිනය සහ ලෝක ජල දිනය තේමා කර ගනිමින් වාරිමාර්ග රක්ෂිතවල පිළිවෙලින් වන පැළ 5880ක් සහ 3700ක් ගොවි සංවිධානවල දායකත්වය ඇතුව රෝපණය කරන ලදී.

- වාරි පුබුදුව චක්‍රීය ණය වැඩසටහන යටතේ වයඹ සංවර්ධන බැංකුව හා රජරට සංවර්ධන බැංකුව එක්ව ආදායම් උත්පාදන කටයුතු සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත.

- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- වන අලින්ගේ චර්යා රටා හා හැසිරීම් රටා හඳුනාගෙන වනඅලි ගැටලුවට විසඳුම් සෙවීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම

- පහළ උමා ඔය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කරන ලදි.

6. වැය ශීර්ෂය 198-2-3-0-2509

- ❖ ඉල්ලුම් කළ ප්‍රතිපාදන - රු. මි. 27.5
- ❖ 2023.12.31 දක්වා වියදම - රු. 1,753,936.60

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB)

පිහිටුවන ලද වර්ෂය - 1973

මූලික ව්‍යාපාර - ඉංජිනේරු සහ වාස්තු විද්‍යාත්මක උපදේශන සේවා


දැක්ම

ලෝක තත්ත්වයේ ඉංජිනේරු ආයතනයක් වීම.

මෙහෙවර

මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රශස්ත ශුභ සිද්ධිය සඳහා සම්පත් උපරිම අයුරින් පරිහරණය කිරීම උදෙසාදක්වන ලදායකත්වය වෙනුවෙන් අගයනු ලැබූ, ඉහළඅභිප්‍රේරණයක් සහිතපුහුණු හා දක්ෂ ශ්‍රම බලකායක් සමඟින්නූතන තාක්ෂණ විධික්‍රම යොදා ගනිමින් ඉංජිනේරුමය කාර්යයන්හි, ගෘහ නිර්මාණ සහ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය අත්පත් කර ගනිමින් ලෝක මට්ටමේ ඉංජිනේරුමය ආයතනයක් කරා ගමන් කිරීම.

CECB සමූහයෙහි ප්‍රධාන අංශය



ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) හි මූලික ව්‍යාපාරහා ඉංජිනේරු සේවා අංශ

- ජල විදුලිය සහ බලශක්තිය
- බලශක්ති සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම
- ගොඩනැගිලි සහ නාගරික යටිතල පහසුකම්
- වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධනය
- මාර්ග, දුම්රිය මාර්ග සහ පාලම්
- ගුවන් තොටුපළ සංවර්ධනය
- වරාය/ වෙරළ සහ සමුද්‍ර කටයුතු
- විදුලි හා යාන්ත්‍රික වැඩ
- ජල සම්පාදන, මලාපවහන සහ ජලාපවහන
- තොරතුරු තාක්ෂණය (IT)
- ශක්‍යතා සහ පාරිසරික අධ්‍යයනය සහ ආපදා අවදානම් කළමනාකරණය
- තාක්ෂණික විගණනය / බලශක්ති විගණනය / වේලි ආරක්ෂාව
- භූ-තාක්ෂණික විමර්ශනය, සමීක්ෂණය සහ රසායනාගාර සේවා

	උපදේශන සේවා ව්‍යාපෘති - 2023	**ඇස්තමේන්තුගත මුදල (රු.මිලියන)**	**2023.12.31 දිනට සේවා සැපයීමේ ප්‍රගතිය (%)**
1	අකුරගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (DHQC) (වාස්තු විද්‍යාත්මක, ඉංජිනේරු සහ ප්‍රමාණාත්මක මැනුම් කටයුතු)	60,886	77 %
2	කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - යටිතල පහසුකම් සහ භූමි නිර්මාණ	223,870	72.4 %
3	SLPA සඳහා යෝජිත සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය	1,090	90%
4	නාවික ජැටිය ඉදිකිරීම - ත්‍රිකුණාමලය	3,429	37%
5	මාහෝ සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම	15,880	49%
6	හෘද සැත්කම් සංකීර්ණය ඉදිකිරීම, ළමා රෝහල, බොරැල්ල	2,631	71.94%
7	පවතින පරිශ්‍රයේ හෙද පීඨය (I අදියර) ඉදිකිරීම,හෙද අභ්‍යාස විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර	5,869	65.48%
8	කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් සහ දෝෂ නිවැරදි කිරීම	2,623	47.6 %
9	අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - ගාල්ල (අදියර II)	900	74.9%
10	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය	47,450	22 %
11	බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය.	30,450	99.75 %
12	පොම්ප ගබඩා ජලවිදුලි ව්‍යාපෘතිය - මහනුවර	452,266.10	12.15%
13	අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - රත්නපුරය	1,800	86.2 %
14	දෙමු මාවත ජාත්‍යන්තර මැණික් ගොඩනැගිල්ල ඉදිකිරීම - රත්නපුරය	388	95%
15	යෝජිත මධ්‍යම වෙළඳපල ගොඩනැගීමේ අදියර -III, නුවරඑළිය	212.96	80%

	ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති - 2023	**ඇස්තමේන්තුගත මුදල (රු. මිලියන)**	**2023.12.31 දිනට සේවා සැපයීමේ ප්‍රගතිය (%)**
1	තාක්ෂණ විෂයධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරුපුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම – KOICA ව්‍යාපෘතිය, නාරංගල්ල, කුලියාපිටිය	2,793.33	29.54%
2	ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණයකිරීම, කොළඹ 12	1,144.77	74.16%
3	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ මධ්‍යම වායු සිසිලනය, ගිනි ආරක්ෂණ සහ උසස් ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම	861.78	50.87%

	ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති - 2023	ඇස්තමේන්තුගත මුදල (රු. මිලියන)	2023.12.31 දිනට සේවා සැපයීමේ ප්‍රගතිය (%)
4	විශේෂිත මාතෘ මධ්‍යස්ථානය ඉදිකිරීම - ද සොයිසා කාන්තා රෝහල, කොළඹ, බොරැල්ල	217.2	82%
5	බණ්ඩාරවෙල, කිනිගම ක්‍රීඩාපිටියේ උෂ්ව පළාත් ගෘහස්ත ක්‍රීඩාංගනය ඉදිකිරීම.	229.93	85.07%
6	රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහක ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, පැවරීම, නිමකිරීම සහ නඩත්තු කිරීම.	1,091.57	27.46%
7	අම්පාර දිස්ත්‍රික්කය මහ රෝහලේ හදිසි අනතුරු සහ ඉංජිනේරු සත්කාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම	608.36	44.87%
8	රේඛීය ඇක්සලරේටර් - මහා රෝහල බදුල්ල.	162.41	51%
9	හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - II අදියර යාපනය	1,224	71.65%
10	බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ ඒකාබද්ධජල සම්පාදන ව්‍යාපෘතිය.	530.04	79.50%
11	යෝජිත පිළිකා ප්‍රතිකාර ඒකකයේ ශේෂ වැඩ සැලසුම් කිරීම සහ ඉදිකිරීම - මහනුවර ශික්ෂණ රෝහල (අදියර 2)	1,351.3	54%

CECB සඳහා දැනට පවතින අභියෝග

- ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස, රාජ්‍ය ආයතනවලින් නොගෙවන ණය හේතුවෙන් සංවිධානය පවත්වාගෙන යාම ඉතා අපහසුය.
    - දිගු කාලීන ණයගැතියන් රු. මිලියන 5,100.00
- CECB බොහෝදුරට රජයේ ව්‍යාපෘති මත රඳාපවතින අතර තරහකාරී ලංසු තැබීමේ ව්‍යාපෘති සඳහාද දේශීය හා ජාත්‍යන්තර වශයෙන්යොමු වී පවතී. ඇතැම් රජයේ ව්‍යාපෘති අත්හිටුවා ඇත.
- CESL සහ CECB සඳහා මසකට රු.මි. 300ක සාමාන්‍ය පුනරාවර්තන වියදම් සපුරාලීම අභියෝගයක්ව පවතී.
- පළපුරුදු කාර්ය මණ්ඩලය අඛන්ඩව ආයතනය හැරයාම නිසා ව්‍යාපෘති සාර්ථකව නිමකිරීමට අපහසුය.
- රාජ්‍ය ආයතනවලින් ලැබෙන අස්ථාවර මුදල් ප්‍රවාහය ව්‍යාපෘති ප්‍රගතිය තවත් අඩාල කරයි

2024 වර්ෂය සඳහා වූ වැඩසටහන

- ඉහත ලැයිස්තුගත කරඇති බොහෝ ව්‍යාපෘති 2024 වර්ෂයේදී දිගටම කරගෙන යනු ඇත.
- CECB ආයතනය විදේශයන්හි ව්‍යාපෘති ලබාගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී.
- දැනටමත් ලෝක බැංකුව සහ ADB අරමුදල් සහිත ව්‍යාපෘති යටතේ ඇන්ගෝලාව, බංගලාදේශය, කාම්බෝජය, නැගෙනහිර සහ දකුණු අප්‍රිකාව, ඉතියෝපියාව, ෆීජී, ගැම්බියාව, ඝානාව, නේපාලය, ඉන්දියාව, ඉන්දුනීසියාව, කෙන්යාව, කිරිබති, ලයිබීරියාව, මලාවි, මාලදිවයින, මයික්‍රොනීසියාව, නේපාලය, නයිජීරියාව, පකිස්ථානය, සෝමාලියාව, දකුණු සුඩානය, ටජිකිස්තානය, ටැන්සානියාව, ටිමෝර්-ලෙස්ටේ, තුර්කිය, උගන්ඩාව, උස්බෙකිස්තානය සහ සැම්බියාව සඳහා EOI 165ක් ඉදිරිපත් කර ඇත.
- ඉදිරිපත් කරන ලද EOI වලින් RFP ඉදිරිපත් කිරීමට EOI 11ක් කෙටි ලැයිස්තුගත ක රඇත.
- CECB ආයතනය අනෙකුත් පාර්ශ්ව සමඟ අවබෝධතා ගිවිසුම් 13 ක් අත්සන් කර ඇත. දකුණු සුඩානය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම නිසා ‘‘දකුණු සුඩානයේ ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධති ඉංජිනේරු විද්‍යාව සඳහා සැලසුම් නියෝජිතයන් සැපයීම’’ ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත.
    - මෙම ක්‍රියාවලිය 2024 වර්ෂයේදී පුළුල් කර අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම (CESL)

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ (CECB) පූර්ණ හිමිකාරිත්වය දරණ සමාගමක් වන අතර, 1982 දෙසැම්බර් 17 වන දින සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කර 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2009 නොවැම්බර් මාසයේ දී නැවත ලියාපදිංචි කර ඇත.

මෙම කාලසීමාව තුළ ඉදිකිරීම් සේවා සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම නිසා ඇති වූ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම සඳහා 2011 වර්ෂය ආරම්භයේ දී මෙම ආයතනය සක්‍රීය ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී. ගොඩනැගිලි, මාර්ග, පාලම්, වාරිමාර්ග ව්‍යුහයන් සහ වෙනත් විශේෂ ව්‍යාපෘති ඉදිකිරීම මත මූලික ව්‍යාපාරය කේන්ද්‍රගත වී ඇත. සිය ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් හා ඇස්ෆාල්ට් නිෂ්පාදනය කිරීමෙහි ද සමාගම නිරතව සිටී.

මේ මඟින් රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවාදායකයන්ට සේවා ලබාදෙයි.

2023 වසරේ ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති

- සිදු කරමින් පවතින මුළු ව්‍යාපෘති - 42

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම විසින් සිදුකරමින් පවතින ප්‍රධාන ව්‍යාපෘති (මිලියන 500ටවැඩි)

අංකය	විස්තරය/ ව්‍යාපෘතියේ නම	සංශෝධිත කොන්ත්‍රත්මුදල (රු.මි.)	ප්‍රගතිය (%)
1	තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය නාරංගල්ලේ දී ඉදිකිරීම - MOE විෂය පථය	964.13	12.98%
2	වයඹ විශ්ව විද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ යෝජිත ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීම.	3,024.52	57.95%
3	මහනුවර ශික්ෂණ රෝහලේ ඇට මිදුළු බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම	1,463.21	32.50%
4	යාපනය රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය (II අදියර) සහ ඉගැන්වීමේ ඒකකය ඉදිකිරීම.	1,291.18	60.93%
5	යාපනයේ යෝජිත නගර ශාලාව ඉදිකිරීම	2,122.09	61.79%
6	රුහුණු විශ්ව විද්‍යාලය, කරාපිටිය, ගාල්ල, වෛද්‍ය පීඨය සඳහා වන මහල් 12 ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, කොමිස් කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම.	1,091.57	48.53%
7	ගාල්ල කරාපිටිය, රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ නව මහාචාර්යවරයාගේ දස මහල් වාට්ටු සංකීර්ණය සැලසුම්කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, කොමිස් කිරීම, නිමකිරීම සහ නඩත්තු කිරීම.	1,366.46	56.82%
8	තාක්ෂණික විෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය නාරංගොල්ල - KOICA විෂය පථය	2,793.33	28.25%
9	කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ සැලසුම්, ඉදිකිරීම් සහ දෝෂ නිවැරදි කිරීම	3,378.43	38.55%
10	කොළඹ 12 ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම	945.25	72.98%
11	යෝජිත පවුල් වෛද්‍ය සහ අතරමැදි සත්කාර ඒකකය - ලුනාව ප්‍රාදේශීය රෝහල	849.60	20.17%

වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය කොත්මලේ (KITI)

වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳජාත්‍යන්තර පුහුණු ආයතනය - කොත්මලේ (KITI.IWM) යනු තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි පුහුණු ආයතනයක් වන අතර වාරිමාර්ග තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HND) පැවැත්වීම සඳහා TVEC විසින් ප්‍රතීතනය කර ඇත. NVQ 5 සහ NVQ 6 ට සමාන පාඨමාලා පැවැත්වීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2013 සැප්තැම්බර් 12 වැනි දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් තීරණය අනුව KITI පිහිටුවන ලදී. එමගින් වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල දැනට පවතින ඉංජිනේරු සහකාර සහ කාර්මික නිලධාරීන්ගේ හිඟය සපුරාලීම සඳහා NVQ 6 මට්ටමේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි. ඒ අනුව වාරිමාර්ග ඉදිකිරීම් ස්ථාන සහ ජල කළමනාකරණය සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අංශයේ ඉංජිනේරු සහකාරවරුන් සහ කාර්මික සහකාරවරුන් පුහුණු කිරීමට අපේක්ෂා කෙරේ.

මෙයට අමතරව පුරාණ ශ්‍රී ලංකාවේ වාරි පද්ධති සහ ඓතිහාසික උරුමයන් පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පවත්වමින් KITI.IWM හි විෂය පථය පුළුල් කර ඇත. තවද, KITI.IWM ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයේ (SLITAD) අනුබද්ධ ආයතනය ලෙස පිළිගෙන ඇති අතර වාරි තාක්ෂණය පිළිබඳ HND පාඨමාලාව, ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL) විසින් එහි ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමේ සුදුසුකමක් ලෙස පිළිගෙන ඇත.

දැක්ම

ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය සපයන ආයතන අතර ප්‍රමුඛයා වීම.

මෙහෙවර

රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා වෙනස්වන තාක්ෂණික හා සාමාජීය අවශ්‍යතාවයන්ට සරිලන ලෙස තරුණ ප්‍රජාවගේ දැනුම, කුසලතා හා පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

අරමුණු

1. සෑම වසරකම TVEC අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම.
2. ISO 9001: 2008 තත්ත්ව කළමනාකරණ පද්ධතිය වාර්ෂිකව යාවත්කාලීන කිරීම.
3. කාර්මික ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා දිගුකාලීන හා කෙටි කාලීන වැඩසටහන් සැලසුම් කිරීම සහ පැවැත් වීම.
4. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ තිරසාර පද්ධතියක් පවත්වාගෙන යාම.
5. 2025 වන විට ISO 14001:20015 පාරිසරික කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

6. 2025 වන විට මලාපවහන බැහැර කිරීමේ පද්ධතිය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
7. KITI-IWM හි ස්වභාවික පරිසරය භාවිතා කරමින් ආදර්ශ වාරිමාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම
8. වසර පුරා ඉංජිනේරුවන් සඳහා සිවිල් ඉදිකිරීම් පිළිබඳ සේවාස්ථ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
9. ඉදිරි වසර 3 තුළ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම.
10. වාර්ෂිකව රැකියා වෙළඳපළ සමඟ පුද්ගලික සහ රාජ්‍ය අංශයේ හවුල්කාරිත්වය (PPP) ස්ථාපිත කිරීම
11. රැකියා වෙළඳපළ අවශ්‍යතාවයන්ට ගැලපෙන, ප්‍රජාව සඳහා හඳුනාගත් පහසුකම් හා සේවා සැපයීම
12. රැකියා වෙළඳපළ හා ගැලපෙන ආයතන සමඟ සම්මන්ත්‍රණපැවැත්වීම
13. උසස් අධ්‍යාපන මාර්ග සඳහා පහසුකම් සැලසීම

KITI.IWM පහත සඳහන් සේවාවන් සපයයි

1. ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ සහ වාරි තාක්ෂණය පිළිබඳ NVQ 5 සහ NVQ 6 ජාතික ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම
   - ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (NVQ 5)
   - ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (NVQ 6)
   - වාරි තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (NVQ 6)

ඒවාට අමතරව පහත සඳහන් පාඨමාලා ද පවත්වනු ලබයි.

- පරිගණක යෙදවුම් සහාය සඳහා සහතිකය
- පරිගණක යෙදවුම් පිළිබඳ සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීමේ පාඨමාලාව)
- වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ සහතිකය (මූලික වෘත්තීය පුහුණුව)
- භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීමේ පාඨමාලාව)
- Auto CAD හි සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීමේ පාඨමාලාව)
- ඉංජිනේරු සමීක්ෂණ පිළිබඳ සහතිකය (මූලික වෘත්තීය පුහුණුව)
- ඉදිකිරීම් සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීමේ පාඨමාලාව)

KITI.IWM හි සිසුන් කණ්ඩායම් දෙකක් වාරි තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හදාරණු ලබයි.

2. පුරාණ ශ්‍රී ලංකාවේ වාරිමාර්ග පද්ධතිවල උරුමය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම.

දැනට KITI.IWM හි ජාත්‍යන්තර මට්ටමේ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පවත්වනු නොලබන අතර ජාත්‍යන්තර මට්ටමේ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පිරිනමන කීර්තිමත් විශ්ව විද්‍යාල සමඟ අනුබද්ධ වීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා සහ යෝජනා සකස් කරමින් සිටී.

3. අනෙකුත් රේඛීය සංවිධානවල කාර්ය මණ්ඩලය සඳහා වාරි ඉංජිනේරු විද්‍යාව සහ අදාළ තාක්ෂණික විෂයයන් පිළිබඳ දේශීය පුහුණුව (සේවාස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම).
   වාරි තාක්ෂණය සහ ඒ ආශ්‍රිත තාක්ෂණික විෂයයන්, කෙටි කාලීන න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවෙහි නියැලී සිටින වාරිමාර්ග සහ අනෙකුත් රේඛීය ආයතනවල සේවකයින් සඳහා සේවා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

4. ඉල්ලුම මත උසස් අධ්‍යාපන ආයතන සඳහා වාරිමාර්ග ආශ්‍රිත විෂයයන් පිළිබඳ කෙටිකාලීන න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

5. ඉල්ලුම මත ඕනෑම රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක නේවාසික සහ නේවාසික නොවන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL)

01. අභියාචන මණ්ඩලය හා ඉංජිනේරුවරුන්ගේ වෘත්තියට අදාළ වෘත්තීය විෂමාචාර සඳහා වන නියෝග පිළිවෙළින් අංක 2319/17 හා 2319/36 දරණ ගැසට් නිවේදන මගින් 2023 පෙබරවාරි 14 දින ප්‍රකාශයට පත් පත්කරන ලදී. 2017 අංක 4 දරණ ශ්‍රීලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 38(a) වගන්තිය අනුව එම ගැසට් නිවේදන පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට අදාළ ලිපිය විෂයභාර ඇමතිතුමාගේ අනුමැතියට යවා ඇත.

02. ඉංජිනේරු වෘත්තිකයන්ගේ කාර්යභාරය, වගකීම් හා නිපුණතා සම්බන්ධයෙන් තීරණය කිරීමට අදාල සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

03. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මගින් පවත්වන පුහුණු පාඨමාලා හදාරා NVQ 4 වන මට්ටමේ සුදුසුකම් ලබන විදුලි කාර්මික ශිල්පීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරගෙන යනු ලැබේ.

04. ශ්‍රී ලංකා ඔටෝමෝටිව් ඉංජිනේරු ආයතනයේ සාමාජිකයින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් එම ආයතනය සමඟ සාකච්ඡා කරගෙන යනු ලැබේ.

05. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය අනුව අන්තර්ජාලය මත පදනම්වන ලිපි ලේඛන කළමනාකරණය කිරීමේ පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

06. ආයෝජන මණ්ඩලය අනුමත සමාගම්වල විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී. අයදුම්පත් පරීක්ෂා කර ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කිරීමට අනුකමිටුවක් පත් කරන ලදී.

07. විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.

08. ඉංජිනේරු හා විද්‍යාත්මක තත්ත්ව සම්පාදනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

09. ඉංජිනේරු කාර්මිකයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් දැනට පවතින ගැටලු අධ්‍යයනය කොට ඊට විසඳුම් සභාවට යෝජනා කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.

10. පහත සඳහන් කරුණු අධ්‍යයනය කර සභාවට වාර්තා කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.
    - ඉංජිනේරු උපාධි ඇගයීම පිළිබඳ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ක්‍රමවේදය.
    - තුන් වසරක හා සිව් වසරක ඉංජිනේරු උපාධි පාඨමාලා හැදෑරූ අයගේ සුදුසුකම් ඇගයීමේ ක්‍රමවේදය.
    - වරලත් ඉංජිනේරුවරුන්හට ලියාපදිංචි වීම සඳහා පවතින ගැටලු.

11. ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනයට අදාළ වෘත්තික කාණ්ඩවල ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පවතින ගැටලු සමථයකට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉංජිනේරු සභාවට යෝජනා කිරීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.

12. දේශීය විශ්ව විද්‍යාලවල ඉංජිනේරු කාර්මික ශිල්පය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා හැදෑරූ අය ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් සකස් කිරීමට අනු කමිටුවක් පත් කරන ලදී.

13. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව යන ත්‍රිවිධ හමුදා නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ත්‍රිවිධ හමුදාවල සේවයේ නියුතු විදුලි කාර්මික ශිල්පීන් ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත.

14. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව වගඋත්තරකරු කරමින් පවරා ඇති නඩු 8 ක් (අභියාචනාධිකරණයේ නඩු 6 ක් හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 2 ක්) විභාග වෙමින් පවතින අතර ඊට අදාළ නීතිමය කටයුතු සිදුකරමින් පවතී.

15. ලංකා විදුලි බල සමාගම(LECO), ශ්‍රී ලංකා ටෙලිකොම්(SLT), මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), ලංකා විදුලිබල මණ්ඩලය (CEB), ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය(NWS&DB) සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව යන ආයතන වල ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ රැස්වීම් පවත්වා ඇත.

16. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පී හා ඉදිකිරීම් අංශවල පාර්ශවකරුවන්ගේ උපදේශන රැස්වීම් සඳහා සහභාගිවිය.

17. 2023 දෙසැම්බර් 31 වන විට වසරේ ලියාපදිංචි කිරීම්වල ප්‍රගතිය පහත දැක්වේ.

- වරලත් ඉංජිනේරු - 5,137
- ආශ්‍රිත ඉංජිනේරු - 8,821
- අනුබද්ධ ඉංජිනේරු - 88
- සංස්ථාගත ඉංජිනේරු - 487
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් - 1,577
- ඉංජිනේරු කාර්මික - 785
- විදේශීය ඉංජිනේරු - 59
- **මුළු සංඛ්‍යාව** **- 16,954**

18. ක්‍රියාකාරී කණ්ඩායම්

ක්‍රියාකාරී කණ්ඩායම් මගින් වෘත්තිකයන්, කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයින්, නිෂ්පාදකයින්, අධ්‍යයන, පර්යේෂණ හා සංවර්ධන කටයුතු වල යෙදී සිටින හා ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පුද්ගලයින් හා සංවිධාන වල අය සඳහා ඉංජිනේරු වෘත්තිමය තත්ත්වයන් පවත්වාගෙන යෑමට හා එමගින් රටේ සමාජ හා ආර්ථික දියුණුවට දායක වීමට වේදිකාවක් සපයයි. ක්‍රියාකාරී සම්බන්ධ වීම හා දැනුම බෙදාගැනීම මගින් ඉංජිනේරු ප්‍රජාව හා ඉන් ඔබ්බට විශාල වෙනසක් ඇති කිරීම මේ මගින් ඉලක්ක කරගෙන තිබේ.

ඒ අනුව විදුලි ක්‍රියාකාරී කණ්ඩායම, යාන්ත්‍රික ක්‍රියාකාරී කණ්ඩායම, සිවිල් ඉංජිනේරු ක්‍රියාකාරී කණ්ඩායම, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරී කණ්ඩායම සහ කාර්මිකයින්ගේ සමාජය යන ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවා ඇත. ක්‍රියාකාරී කමිටු කළමනාකරණය කිරීම සඳහා අනුකමිටුවක් පත් කරනලදී. ක්‍රියාකාරී කමිටුවල විෂය පථයන්ද කොන්දේසි හා බලතල ද එමගින් සාදා අවසන් කරඇත.

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (MCB)

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (MCB) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරී පනත යටතේ රාජ්‍ය සහ ජාත්‍යන්තර ගනුදෙනුකරුවන් සඳහා සේවා සැපයීමේ මූලික පරමාර්ථය යටතේ විධිමත් ලෙස ස්ථාපිත කරන ලදී. 2020 දී MCBහි ඵලදායිතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් වාරිමාර්ග අමාත්‍යාංශයට පවරා ගන්නා ලදී.

මහවැලි උපදේශක සේවා කාර්යාංශය, ගනුදෙනුකරුවන් සඳහා පුළුල් සේවා මාලාවක් පිරිනමයි. මෙම සේවාවන්ට මිනිස් බල සැපයුම, බලපෑම් තක්සේරු කිරීම්, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම්, ශක්‍යතා අධ්‍යයනයන්, වැඩමුළු සඳහා පහසුකම් සැලසීම, පුහුණුව ලබා දීම, ධාරිතාව වැඩි දියුණු කිරීම, සමාජ බලමුලු ගැන්වීමේ උත්සාහයන් මෙන්ම විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා ආධාරක සේවා සැපයීම ඇතුළත් වේ. ශ්‍රී ලංකාව තුළ මෙන්ම ගෝලීය තලයේ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් වෙනුවෙන් මෙම කටයුතු සිදු කර ඇත.

2023 දී සිදු කරන ලද ව්‍යාපෘති.

- **පාරිසරික බලපෑම් ඇගයීම (EIA): මාඔය දෝණියේ යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය -95%**
  නැවත පදිංචි කිරීම් ස්ථාන අලුතින් හඳුනා ගැනීම සහ අදාල ඉඩම් හිමියන්ගෙන් කැමැත්ත ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය (NWSDB)වගකීම දරයි. මෙය සම්පූර්ණ වූ පසු, අවසාන වාර්තාවට අතිරේකය සකසා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ හැකිය.

- **පාරිසරික බලපෑම් තක්සේරුව: යෝජිත ගිං - නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය -87%**
  මෑතකදී ලැබුණු TRC අදහස් අනුව පාරිසරික බලපෑම් ඇගයීම් අවසාන වාර්තාව සකස් කරමින් පවතී.

- **මූලික පාරිසරික පරීක්ෂණවාර්තාව: අම්පාර දිස්ත්‍රික්කයේ යෝජිත ගලගේකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය -87%**
  IEE අවසන් වාර්තාව (අනුවාදය 01), TRC අදහස් සඳහා පිළිතුරු සමඟ සකස් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

- **"වියළි කලාපීය ගොවීන් සඳහා කාලගුණ උපදේශන පද්ධතිය ස්ථාපිත කිරීමට සහාය වීම සඳහා ඩිජිටල් පද්ධතිය ශක්තිමත් කිරීම" සඳහා උපකාරක සේවා - 70%**
  1 වන සහ 2 වන වාර්තා වල අවසාන අනුවාදය ඉදිරිපත් කර ඇත. 3 වන වාර්තාව ඉක්මනින් ඉදිරිපත් කරනු ඇති අතර මේ සඳහා නිර්මාණය වන වෙබ් අඩවියේ කටයුතු සිදුවෙමින් පවතී.

- **භූගෝලීය දත්ත සමුදාය සහ ජංගම යෙදුම් සැකසීම - 60%**
  ජංගම යෙදුම සහ අවකාශීය දත්ත සමුදාය නිර්මාණය වෙමින් පවතී. සේවාදායකයාගෙන් දත්ත ලැබීමේ ප්‍රමාදයක් ඇති බැවින් එම කටයුතු ප්‍රමාද වෙමින් පවතී.

2.1.2. අභියෝග

මුහුණපෑමට සිදු වූ ආර්ථික අර්බුදය හමුවේ ඉන්ධන මිල ගණන් ඉහළ යාමත්ද්‍රව්‍යවල මිල ගණන් වැඩිවීමත් හේතුවෙන් වාරිමාර්ග ක්ෂේත්‍රයට 2023 වර්ෂය ඉතා අභියෝගාත්මක වසරක් විය.

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ කමිටුවේ (RAMP) කමිටු නිර්දේශය අනුව වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පැවති ව්‍යාපෘති 39න් 13ක් පමණක් ක්‍රියාත්මක කොට ඉතිරි ව්‍යාපෘති තාවකාලිකව නැවැත්වීම, විෂය පථය වෙනස් කොට පිරිවැය අඩු කිරීම හෝ ප්‍රතිපාදන ලැබුණු පසු නැවත ක්‍රියාවට නැංවීම සිදු කරන ලෙස නිර්දේශ කෙරිණි .

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ කෘෂිකාර්මික ඉඩම් පැවරීම සහ කෘෂිකාර්මික ඉඩම් අහිමි වූ ගොවීන් නැවත පදිංචි කිරීම අභියෝගාත්මක කරුණක් බවට පත්ව තිබේ. වෙන් කළ ඉඩම් අනවසර වගා කරුවන් ආක්‍රමණය කිරීම හා විසඳීමට ගත් උත්සාහයන් අසාර්ථක වීම මත වැල්ලවාය ප්‍රාදේශීය ලේකම්වරයාගේ මැදිහත්වීම මත ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කරමින් සිටී. මෙම ගැටලුව විසඳීම සඳහා වෙනම කමිටුවක් පත් කිරීමට වාරිමාර්ග අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇත. එසේම බදුල්ල-වැලිමඩ මාර්ගයේ ඉතිරි මීටර් 250ක සීමාව දුෂ්කර භූමි භාගයක පිහිටා ඇති හෙයින් හා මාර්ගයේ පස් ලිස්සායාමට ලක් වන බැවින් ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමේ දැඩි අභියෝගයකට මුහුණ දී ඇත.

2.1.3. ඉදිරි ඉලක්ක

	වැඩසටහන / ව්‍යාපෘතිය	2024 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2024 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2024 ඉලක්ක
01.	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)	25,370.00	45%	80%	• මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ 35%ක් භෞතිකව අවසන් කිරීම (MWSIP)
i.	මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය	1,430.00	98%	100%	• MLBCRP-ICB-1 පැකේජය 100% ක් භෞතිකව අවසන් කිරීම. • MLBCRP ව්‍යාපෘතිය යටතේ වේරගන්තොට - රන්දෙණිගල පාර (B474) 21 කණුව අසලින් බලපෑමට ලක් වූ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 100% ක් භෞතිකව අවසන් කිරීම. • MLBCRP ව්‍යාපෘතිය යටතේ රන්ටැඹේ ලං.වි.ම. කඳවුරේ බලපෑමට ලක්වූ පොම්පාගාරය සහ නල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම 100% ක් භෞතිකව අවසන් කිරීම. • MLBCR-ICB-6 පැකේජය 60% ක් භෞතිකව අවසන් කිරීම.
ii.	වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය	3,286.00	42%	99%	• NWPC-ICB-2 පැකේජය 100% ක් භෞතිකව අවසන් කිරීම.
iii.	උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය	15,743.00	34%	72%	• UEC-ICB-2B පැකේජය 100% ක් භෞතිකව අවසන් කිරීම. • UEC-ICB-2A පැකේජයේ වැඩ 68% කින් භෞතිකව අවසන් කිරීම
iv.	කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම	1,750.00	20%	80%	• කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමේ කටයුතු 60%කින් භෞතිකව අවසන් කිරීම.
02	උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	3,600.00	99.66%	100%	• ව්‍යාපෘතිය අවසන් කිරීමේ කටයුතු නිම කිරීම

	වැඩසටහන / ව්‍යාපෘතිය	2024 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2024 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2024 ඉලක්ක
03.	මොරගහකන්ද සහ කළුගඟ ජලාශ	1,372.00	99.88%	100%	• ව්‍යාපෘතියට අදාළ පහත කාර්යයන් හැර අනෙකුත් සියළුම කාර්යයන් 2023 දෙසැම්බර් මස වනවිට අවසන් කර ඇත. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඉතිරි කාර්යයන් - 2023 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීම - ඉඩම් අත්පත්කර ගැනීමේ කාර්යයන් හැර ව්‍යාපෘතියේ අනෙකුත් කාර්යයන් අවසන් කර ඇත. ඉඩම් අත්පත් කරගැනීමට අදාළ ඉදිරි කාර්යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය - බකමූණ සහ නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලය - මැදිරිගිරිය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ලග්ගල, නාඋල, ඇළහැර සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මැදිරිගිරිය සමඟ ඒකාබද්ධව සිදුකරනු ලැබේ.
04.	දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA)	7,119.00	25.6%	96%	• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ(DOM) ජල කාලගුණ විද්‍යා පද්ධතිය නවීකරණය කිරීම සඳහා උපදේශක සමාගමක් බඳවා ගැනීම අවසන් කිරීම. • කාලගුණ විද්‍යා පද්ධතිය නවීකරණය කිරීමේ මාර්ග සිතියම පිළියෙල කිරීම, තාක්ෂණික පිරිවිතර සකස් කිරීම සහ ටෙන්ඩර් ලේඛන සැකසීම අවසන් කිරීම. • DOM හි ජල කාලගුණ විද්‍යා පද්ධතිය සැපයුම, ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම සහ ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් බඳවා ගැනීම ආරම්භ කෙරේ. • කාලගුණ පුරෝකථන හැකියාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් කාලගුණ කාර්යාල පිළිසකර කිරීම, අවශ්‍ය උපකරණ ලබාදීම. • ආපදා කළමනාකරණ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන වල කාලගුණ, ගංවතුර සහ නායයාම් සම්බන්ධ මෙහෙයුම් මැදිරි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් බඳවා ගැනීම අවසන් කෙරේ.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2024 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2024 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2024 ඉලක්ක
					• අඔතලේ ලවණතා බාධකය ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් පිළියෙළ කිරීම අවසන් කිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරාගැනීම අවසන් කිරීම. • ලවණතා බාධක ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලැසුම සකස් කිරීම අවසන් කිරීම • වී ඔය ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම සඳහා කොන්ත්‍රාතුව ප්‍රදානය කිරීම. • වී ඔය ජලාශය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සකස් කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම . • පවතින ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ අවදානම් සහිත ප්‍රජාවන් සඳහා සෘජු ප්‍රතිලාභ සහ කෙටි කාලීන රැකියා උත්පාදනය සහතික කිරීම සඳහා ප්‍රධාන, මධ්‍යම සහ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවවල හදිසි සහ තීරණාත්මක පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම අවසන් කරනු ලැබේ.
05	ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	4,397.00	38.6%	50.0%	වැඩ, භාණ්ඩ සහ උපදේශන සේවා, උපදේශන නොවන සේවා ආශ්‍රිත ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්වල ඉලක්ක පහත පරිදිවේ. • වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ID) වැඩ කොන්ත්‍රාත්තු - ඇළ සහ වේලි ප්‍රතිසංස්කරණ ඇතුළත් මුළු පැකේජ 10. පැකේජ 7ක් සම්පූර්ණ කිරීමට ඉලක්ක කර ඇත. ඉදිකිරීම් අදියර යටතේ පැකේජ 1ක් පිරිනැමිය යුතුය. එක් පැකේජයක් දැනටමත් සම්පූර්ණ කර ඇත • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) වැඩ කොන්ත්‍රාත්තු - ඇළ සහ වේලි ප්‍රතිසංස්කරණ ඇතුළත් සම්පූර්ණ පැකේජ 9. පැකේජ 3ක් සම්පූර්ණ කළ යුතුය. පැකේජ 3ක් දැනටමත් අවසන් කර ඇත.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2024 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2024 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2024 ඉලක්ක
					නැවත ටෙන්ඩර් කළ පැකේජ 4ක් පිරිනැමීමට නියමිතය. පැකේජ 2ක් සැලකිය යුතු ලෙස නිම කර ඇත. • උතුරු පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව (NPC) වැඩ කොන්ත්‍රාත්තු - ඇළ සහ වේලි ප්‍රතිසංස්කරණ ඇතුළත් සම්පූර්ණ පැකේජ 9. වැඩ කොන්ත්‍රාත්තු 4 ක් සම්පූර්ණ කිරීමට නියමිතය. කොන්ත්‍රාත්තු 2 ක් ප්‍රදානය කෙරේ. පැකේජ 3ක් දැනටමත් අවසන් කර ඇත. • නැගෙනහිර පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව (EPC) වැඩ කොන්ත්‍රාත්තු - ඇළ සහ වේලි ප්‍රතිසංස්කරණ ඇතුළත් සම්පූර්ණ පැකේජ 7. ප්‍රදානය කිරීමට ඉලක්ක කරගත් වැඩ කොන්ත්‍රාත්තු 7කි. • ජල සම්පත් මණ්ඩලය (WRB) වැඩ කොන්ත්‍රාත්තු - භූගත ජල කළමනාකරණ ඒකක පුළුල් කිරීම ඇතුළත් ව මුළු කොන්ත්‍රාත්තු 2 කි. පැකේජ 1ක් පිරිනැමීම නියමිතය. පැකේජ 1ක් සම්පූර්ණ කිරීමට නියමිතය. • 10 Mn නැවත සකස් කිරීමේ වැඩ ක්‍රියාකාරකම් - මුළු පැකේජය 653, කුඩා හා කුඩා වේලි සහ ඇළ ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළත් වේ පැකේජ 580ක් සම්පූර්ණ කිරීමට නියමිතය. පැකේජ 73ක් දැනටමත් අවසන් කර ඇත. • උපදේශන සේවා - මුළු උපදේශන සේවා 21 පැකේජ 8 ක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර සම්පූර්ණ කිරීමට නියමිතය. පැකේජ 2ක් පිරිනැමීමට සහ සම්පූර්ණ කිරීමත් පැකේජ 4ක් පිරිනැමීමට සහ උපදේශන සේවාව දිගටම කරගෙන යාමටත් ඇත. උපදේශන පැකේජ 7ක් දැනටමත් අවසන් කර ඇත. • භාණ්ඩ කොන්ත්‍රාත්තු - සම්පූර්ණ පැකේජ 9

	වැඩසටහන / ව්‍යාපෘතිය	2024 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2024 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2024 ඉලක්ක
					• පැකේජ 4ක් පිරිනැමීමට සහ සම්පූර්ණ කිරීමට ඇති අතර පැකේජ 5ක් දැනටමත් අවසන් කර ඇත • උපදේශන නොවන සේවා - මුළු පැකේජ 3 පැකේජ 2ක් සම්පූර්ණ කිරීමට ඉලක්ක කර ඇත. එක් පැකේජයක් ක්‍රියාත්මක වෙමින් පවතී.
06.	ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)	2,531.00	82%	95%	• සුළු වාරි පද්ධති 32ක ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම සහ පෙර වසරේ ආරම්භ කරන ලද 43ක උඩු ගං සංවර්ධනය නිමා කිරීම • සුළු වාරි පද්ධති 160ක යටි ගං සංවර්ධනය සිදු කිරීම • වැව් 42 ක් සඳහා නඩත්තු උපකරණ ලබා දීම (වීල් බැරෝ, තෘණ කපන, සෑන්ඩ් පෑන්, සවල, ඇස් කණ්ණාඩි ආදිය) සැපයීම. • කාන්තාවන් මූලික කොට දේශගුණික සුහුරු කෘෂිකාර්මික වැඩසටහන ක්‍රියාත්මක කිරීම; මූලික වශයෙන් ආහාර සුරක්ෂිතතා ගෙවතු 100ක් පිහිටුවීම; වාණිජ මට්ටම ගොවිපළ ඒකක 3400ක් පිහිටුවීම; ගෙවතු 700 ක පාරිසරික සහතිකකරණය; වැව් 15ක ජල කලමණාකරණ මොඩල පිහිටුවීම; පාරිසරික කෘෂිකර්ම නිෂ්පාදන අලෙවිකරණ මධ්‍යස්ථාන ඒකක (2750) ශක්තිමත් කිරීම; වාණිජ මට්ටමේ ගොවීන්/ වෙළෙන්දන්/ ව්‍යවසායකයින්ගේ ධාරිතා සංවර්ධනය (212); බීජ බැංකු 07ක් පිහිටුවීම • දැනට පවතින RWS පද්ධති 10ක් සඳහා ජල පිරිපහදු සහ පිරිසිදු කිරීමේ පද්ධති ඉදිකිරීම • පාසල් සහ රෝහල් සඳහා කුඩා ජල පිරිපහදු සහ පවිත්‍රකරණ පද්ධති 29 ක් ස්ථාපනය කිරීම. • දැනට ස්ථාපනය කර ඇති කෘෂි කාලගුණ උපකරණ මගින් දත්ත රැස් කිරීම සහ ජල කළමනාකරණ උපදේශන බෙදා හැරීම. • ව්‍යාපෘතිය මගින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය ජල මට්ටම් මාපක 23ක් සඳහා පෝස්ට්

	වැඩසටහන / ව්‍යාපෘතිය	2024 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2024 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2024 ඉලක්ක
					ගේජ් සවි කිරීම සහ වක්‍ර ඇඳීම සහ ගංඟා තුනේ ද්‍රෝණියේ, ගංවතුර සහ ජල කළමනාකරණයට සහාය වීම සඳහා දත්ත හුවමාරු යාන්ත්‍රණය ස්ථාපනය කිරීම. • කෘෂිකාර්මික තොරතුරු සහ උපදේශන ලබා ගැනීම සඳහා ගොවි සංවිධාන සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන (ASCs)/ කෘෂිකර්ම කලාප කාර්යාලය (AZO) හරහා ප්‍රජාවන් සංවේදී කිරීම.
07.	නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) GCF Knuckles	1,400.00	1%	15%	• මූලික සමීක්ෂණය (baseline survey) සම්පූර්ණකිරීම • මෙහෙයුම් අත්පොත සම්පූර්ණ කිරීම • ප්‍රධාන කාර්ය මණ්ඩල තනතුරු සහිත PMU පිහිටුවීම • මාර්ග ඔස්සේ ඇළ දොළ ආරක්ෂාව සහ ජලාපවහන කළමනාකරණය • ඇළ දොළ ප්‍රදේශ ආරක්ෂාව (හෙක්ටයාර 70) • ග්‍රාමීය වැව්, පොකුණු සහ වාරිමාර්ග ජාල (වාරි පද්ධති 15) ප්‍රතිසංස්කරණය කිරීම සහ ස්ථාපිත කිරීම. • අලිවැට ඉදි කිරීම • වනාන්තර මොසෙයික් භූ දර්ශන ප්‍රතිසංස්කරණය කිරීම (හෙක්ටයාර 70) • යටි ගං ප්‍රදේශවල (හෙක්ටයාර 400) වාරි ජලය සපයන කුඹුරුවල බෝග තීව්‍රතාවය වැඩි කිරීම • තිරසාර කුඩා වතු හිමියන්ගේ නිෂ්පාදනය තීව්‍ර කිරීම • තිරසාර නිෂ්පාදන ගම්මාන වැඩසටහන • උඩරට කුඩා වතු හිමියන් සඳහා හරිත වර්ධන අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යවසාය සහ ආයතනික සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය ලබාදීම. • දේශගුණික සුහුරු කෘෂිකර්මයේ නියැලී සිටින කුඩා වතුහිමියන් සහ යැපුම් ගොවීන් සඳහා අගය දාම වැඩිදියුණු කිරීමේ විකල්ප හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම

- උමාඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන ජෙනරේටරය සක්‍රිය කොට ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 60ක විදුලි ධාරිතාවක් 2024 වර්ෂයේ මාර්තු මස අවසන් වීමට ප්‍රථමව එක් කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන ඉලක්කයකි.

- මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනට අදාල කළුගඟ මොරගහකන්ද, වයඹ ඇළ වැඩ අවසන් කර මොරගහකන්ද සිට කළුගඟට ජලය සැපයීම අප අමාත්‍යාංශයේ තවත් ඉලක්කයකි. 2024 වසර අවසානයේ මුල්‍ය ආයතන සමඟ සාකච්ඡා කර මෙම වැඩසටහනට අදාළව උතුරු මැද පළාතේ ඉතිරි වැඩ කටයුතු 2025 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා ණය මුදලක් ලබා ගැනීමට ද ණය මුදලෙහි තුන්වන වාරිකය සක්‍රිය කර ගැනීමටද අදහස් කෙරේ.

.....

අධ්‍යක්ෂ ජනාරල් (ක්‍රමසම්පාදන)

සැලසුම් හා මෙහෙයුම් අංශය

ඩී.එච්. ලාලත් ප්‍රියදාස
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම සම්පාදන)
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක: 11, ජාවත්ත පාර,
කොළඹ 05.

.....

ලේකම්

වාරිමාර්ග අමාත්‍යාංශය

සමන් දර්ශන පාඩිකෝරාල
ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක: 500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

03. පරිච්ඡේදය- 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ - එෆ්

2023.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය (2023)		සටහන්	තත්‍ය (2023)	2022	
-	**ආදායම් ලැබීම්**		-	59,974,294	
	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවාමත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	3	-	-	
-	බදු නොවන ආදායම් හාවෙනත්	4	853,731,252	59,974,294	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		**853,731,252**	**59,974,294**	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		11,131,086,544	10,127,303,770	ඒසිඒ-3
-	තැන්පතු		3,382,229,642	1,558,852,762	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		20,225,928	20,429,028	ඒසිඒ-5/5(අ)
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවනලැබීම්(ආ)**		**14,533,542,114**	**11,706,585,560**	
-	**මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		15,387,273,366	11,766,599,854	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		273,537,918	-	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)**		**15,113,735,448**	**11,766,599,854**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
	වැටුප්, වේතන සහඅනෙකුත්		417,499,614	331,526,098	
-	සේවක ප්‍රතිලාභ	5			
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	178,953,676	121,820,765	ඒසිඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,473,173,371	3,126,882,322	
-	පොළී ගෙවීම්	8			
-	වෙනත් පුනරාවර්තනවියදම්	9	326,508	168,845	
-	**මුළු පුනරාවර්තනවියදම් (ඊ)**		**4,069,953,169**	**3,580,398,029**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම්පුනරුත්ථාපනය		30,242,648		
-	භාවැඩිදියුණු කිරීම්	10		31,859,761	
-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	917,387	13,683,012	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	3,452,089,284	15,980,144,344	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම	13		-	
-	හැකියා වර්ධනය	14	6,687,494	7,693,769	
-	වෙනත් මූලධන වියදම්	15	33,689,363,421	29,783,719,167	
-	**මුළු මූලධන වියදම් (උ)**		**37,179,300,235**	**45,817,100,054**	
	තැන්පතු ගෙවීම්		3,278,897,638	1,559,445,276	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		31,551,464	24,421,672	ඒසිඒ-5/5(අ)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		3,310,449,102	1,583,866,948	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**44,559,707,506**	**50,981,365,031**	
-	දෙසැම්බර් 31 දිනට ශේෂයඒ=(ඉ-එ)		(29,445,967,058)	(39,214,805,178)	
-					
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		(29,445,967,058)	(39,214,805,178)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2023.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය — ඒසීඒ - පී

	සටහන	2023	2022
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	ඒසීඒ-6	20,669,523,152	20,669,473,891
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	53,823,202	42,497,667
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		20,723,346,355	20,711,971,558
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		(73,862,075)	18,144,393
දේපළ පිරියන හා උපකරණ සංචිතය		20,669,523,152	20,669,473,891
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ප්‍රංගම් වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	127,685,278	24,353,274
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		20,723,346,355	20,711,971,558

පිටු අංක 01 සිට 46 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 47 සිට 71 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපෘතිකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට එරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ඩී.එම්.සූ. සරත් කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
වාරිමාර්ග අමාත්‍යාංශය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2024/02/27	දිනය : 2024/02/27	දිනය : 2024/02/27
සමන් දර්ශන පාඩිකෝරාළ	සමන් දර්ශන පාඩිකෝරාළ	
ලේකම්	ලේකම්	
වාරිමාර්ග අමාත්‍යාංශය	වාරිමාර්ග අමාත්‍යාංශය	
අංක 500, ටී.බී. ජයා මාවත,	අංක 500, ටී.බී. ජයා මාවත,	
කොළඹ 10.	කොළඹ 02	

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - සී

2023.12.31 දිනෙන් අවසන් කල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2023 (රු.)	**2022 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂවෙනුවෙන් එකතු කරන ලද ආදායම්	81,198,279	121,019,478
අග්‍රිම ලැබීම්	11,131,086,544	10,127,303,770
අත්තිකාරම් අයකර ගැනීම්	15,698,018	29,367,950
තැන්පතු ලැබීම්	3,382,229,642	1,546,761,535
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**14,610,212,483**	**11,824,452,734**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	559,223,664	383,414,462
සහනාධාරසහ මාරුකිරීම්	47,847,358	32,890,405
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම	79,781,217	79,781,217
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	31,054,149	27,178,145
තැන්පතු ගෙවීම්	3,277,904,038	1,559,127,446
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**4,189,567,127**	**2,082,391,675**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**10,420,645,357**	**9,742,061,059**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම්අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්	10,420,645,357	9,742,061,059
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**10,420,645,357**	**9,742,061,059**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(10,420,645,357)**	**(9,742,061,059)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්	-	-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1. වාර්තාකරණකාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණපදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම්හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ..

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියතහාඋපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල්හාමුදල්සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ% ලෙස
2003.08.00	ජල විදුලිය විකිණීම	1,275,355.00	1,275,000.00	1,275,000.00	99.97%

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	4,676,000.00	4,676,000.00	4,069,953.16	87.04%
ප්‍රාග්ධන	64,541,000.00	64,550,100.00	37,179,300.23	57.60%

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	පරිසර අමාත්‍යාංශය	Farab කොන්ත්‍රාත් ආයතනයේ ගෙවීම් සඳහා	162,000.00	162,000.00	142,323.93	87.95%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**2023.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2023.12.31** දිනය මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	60,322.95	60,322.95		
9152	යන්ත්‍රෝපකරණ	415,596.51	415,596.51		
9153	ඉඩම්	2,019,292.24	2,019,292.24		
9154	අස්පෘශ්‍ය වත්කම්	311.44	311.44		
9155	ජීව විද්‍යාත්මත වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම III ලෙස අමුණා ඇත.

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිතනිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	75% - 89%	50% - 74%	05% - 49%
මොරගහකන්ද සිට හුරුලුවැව, මාන්නක්කට්ටිය, ඒරුවැවසහ මහකනදරාව දක්වා උතුරු මැද පළාත් ඇළ (ඉහළ ඇළහැර ඇළ) නිම කිරීම		✓		
වයඹපළාත් ඇළ ව්‍යාපෘතිය නිම කිරීම		✓		
මිනිපේවම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය නිම කිරීම	✓			
උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය නිම කිරීම	✓			
මොරගහකන්ද කළුගඟ සංවර්ධනව්‍යාපෘතිය	✓			
දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන(CResMPA)				✓
ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින්ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)		✓		
ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)				✓
නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල GCF Knuckles)				✓

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1.හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50 - 74	75 - 100
අරමුණු: 1 සෑම දෙසකම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිමා කිරීම **අරමුණු: 2.1** සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුක්ත, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම. **අරමුණු: 2.2** අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටිවීම සහ ක්ෂය වීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ළඟාකරගැනීම ද ඇතුළත්ව සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්ත්වයන් තුරන් කිරීම සහ නවයොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවයන්ට විසඳුම් ලබා දීම.	**ඉලක්ක: 01** කෘෂිකාර්මික ඉඩම්වල ජලය භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.	**දර්ශක: 01** වාරිමාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ප්‍රතිශතය , වැඩි දියුණු කළ වාරි තාක්ෂණය සමඟ වාරි ඉඩම් වල ජල භාවිතය අඩු වීමේ ප්‍රතිශතය	√		
	ඉලක්ක: 02 ප්‍රධාන හා මධ්‍යම ප්‍රමාණයේ ජලාශවල ජලය ගබඩා කිරීමේ ධාරිතාවය ඉහළ නැංවීම සහ කාලගුණික විපර්යාස බලපෑම කළමනාකරණය කිරීම සඳහා ජලය රැස්කරන ස්ථාන ඉදිකිරීම.	**දර්ශක: 02** නියං කාලය තුළ පද්ධතියේ නම්‍යශීලීත්වය ඉහළ නැංවීමේ ප්‍රතිශතය, ගංවතුර හේතුවෙන් වන හානිය අවම වන ප්‍රතිශතය		√	
	ඉලක්ක: 03 ප්‍රධාන හා මධ්‍යම ප්‍රමාණයේ වාරි ව්‍යාපාර යටතේ ඇති ඉඩම් වල බෝග තීව්‍රතාවය ඉහළ නැංවීම.	**දර්ශක: 03** ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය සහ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම උදෙසා ගොවි ප්‍රජාව සවිබල ගැන්වීමේ ප්‍රතිශතය		√	

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50 - 74	75 - 100
අරමුණු: 2.3 කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායීතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මගින් දෙගුණ කිරීම **අරමුණු: 6.4** සියලුම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම, තිරසර අන්දමින් ජලය ලබා ගැනීම සහ සැපයීම, ජලය හිඟකම මගහැරවීමසහ ජලය හිඟකමින් පීඩා විඳින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රාමාණික ලෙස අවම කිරීම. **අරමුණු: 6.5** දේශ සීමා හරහා වූ සහයෝගය සුදුසු අන්දමින් උපයෝගී කරගනිමින්ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණයක් සියලුම මට්ටම්වල ක්‍රියාවට නැංවීම.	**ඉලක්ක: 04** දේශගුණික විපර්යාසය නිසා ඇතිවන වාර්ෂික ගංවතුර හානිය අවම කිරීම.	**දර්ශක: 04** ජල පෝෂක ප්‍රදේශය කළමනාකරණය කිරීම සඳහා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම, ජලය ගබඩා කිරීමේ ස්ථාන වැඩි වීමේ ප්‍රතිශතය, ගංවතුර සමබන්ධයෙන් ආරක්ෂණ පියවර අනුගමනය කිරීමේ ප්‍රතිශතය	√		
	ඉලක්ක: 05 රටේ පානීය, කෘෂිකාර්මික කර්මාන්ත සහ අනෙකුත් අරමුණු සඳහා අතිරේක ජල සම්පත් වශයෙන් ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව භූගත ජල සම්පත් පවතින බවට තහවුරු කරගැනීම.	**දර්ශක: 05** භූගත ජල සම්පත් පිළිබඳ අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විශ්වාසනීයත්වය (%)	√		
	ඉලක්ක: 06 සමස්ථ ජල සම්පත් කළමනාකරණය සඳහා භූගත ජල සම්පත් කළමනාකරණ යාන්ත්‍රණයක් සකස්කිරීම.	**දර්ශක: 06** රට තුළ ඇති භූගත ජල සම්පත් තක්සේරු කිරීම, සංරක්ෂණය කිරීම, ප්‍රයෝජනයට ගැනීම සහ සංවර්ධනය කිරීම වැඩිදියුණු කිරීම (%)	√		

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50 - 74	75 - 100
අරමුණු: 9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. **අරමුණු: 9.4** යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම. කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කරගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන් පියවර ගැනීම. **අරමුණු: 12.2** ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම.	**ඉලක්ක: 07** ගොවි ප්‍රජාව සම්බන්ධීකරණය සහ සංවිධානය හරහා වාරි ජලයේ කෘෂි නිෂ්පාදන ඒකකයක ඵලදායිතාවය වැඩි දියුණු කිරීම.	**දර්ශක: 07** අක්කර අඩි 4.4ක් යල කන්නය තුළ සහ අක්කර අඩි 3.09ක් මහ කන්නය තුළ ජලය භාවිතය පවත්වාගෙන යාම සඳහා ඉඩම් සකස් කිරීමට වැසි ජලය භාවිතා කිරීම සහ වාරි ජල භාවිතය අවම කිරීම.	√		

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50 - 74	75 - 100
අරමුණු: 13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.					
අරමුණු: 6.1 සියලුදෙනාට සමානාත්මතාවයෙන්යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිළකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම.	**ඉලක්ක:01** ප්‍රතිවර්තන ආස්‍රැතික (Reverse Osmosis) පැළ සහ වැසි ජලය ලබාගැනීමේ යාන්ත්‍රණයක් ප්‍රතිස්ථාපනය කිරීම.	**දර්ශක: 01**	√		
අරමුණු: 6.6 කඳු, වනගහන, තෙත්බිම්, ගංගාවන්, භූගත ජලය, සහ විල් ඇතුළුව ජලය සම්බන්ධ ජීව පද්ධති ආරක්ෂා කිරීම සහ නැවත ස්ථාපිත කිරීම.	**ඉලක්ක:01** ජලයෙන් යටවන ඉඩම්වල වන්දි වශයෙන් පැළ සිටුවීම, ඉහළ ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය	**දර්ශක: 01** ඉහළ ජල පෝෂක ප්‍රදේශ වැඩි දියුණු කිරීම හා ආරක්ෂා කිරීම, නැවත වන වගාව, පාංශු බාදනය පාලනය, ජලාශවල රොන්මඩ තැන්පත් වීම අවම කිරීම (%).	√		
අරමුණු: 7.1 සියලු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකිබව තහවුරු කිරීම. **අරමුණු: 7.2** ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්තීන්හි කොටස ඉහළ නැංවීම. **අරමුණු: 7.3** ලෝක බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අනුපාතිකය දෙගුණයක් කිරීම.	**ඉලක්ක:01** වාරිමාර්ග පද්ධතිය තුළ ජල විදුලි බලාගාර හඳුන්වාදීම.	**දර්ශක: 01** ජල විදුලි බලය එක්වීම නිසා ප්‍රධාන විදුලිබල පද්ධතියට එක්වන විදුලිබල ප්‍රමාණය (ගිගා වොට් පැය).	√		

5.2.නිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- පවතින ආර්ථික අර්බුදය හමුවේ සැලසුම් කළ පරිදි අරමුදල් නොමැතිවීම නිසා 2023 වර්ෂය තුළ සැලසුම්ගත අභිමතාර්ථ වලට ළඟාවීමට අපහසුවීම.

- අත්දැකීම් සහ දැනුමැති තාක්ෂණික කාර්ය මණ්ඩලය විදේශ රටවලට සංක්‍රමණය වීම නිසා ඇතිවූ කාර්යමණ්ඩල හිඟය.

- රක්ෂිත සහ ඉහළ ජලපෝෂක ප්‍රදේශවල ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් නීතිමය ප්‍රතිපත්ති නොමැතිවීම.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	61	41	20
තෘතියික	5	2	3
ද්විතියික	306	267	39
ප්‍රාථමික	59	43	16
එකතුව	**431**	**353**	**78**

6.2. ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බෙහෙවින් බලපාන අතර, මානව සම්පත් හිඟය ආයතනයේ කටයුතු විධිමත්ව හා ඵලදායීව සිදු කිරීම සඳහා ගැටළුවක්ව පවතී.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය	නිමවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යය භාරය හා වගකීම	02	දින 01	95.00		දේශීය	
ව්‍යාපෘති කළමනාකරණ වෘත්තිය	01	දින 01	28.90		දේශීය	

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය	නිමවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම.	01	දින 02	9.50		දේශීය	
ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ මාර්ගගත පුහුණුව	01	දින 02	7.50		දේශීය	
විනය පටිපාටි පිළිබඳ වැඩමුළුව	01	දින 02	9.50		දේශීය	
විනය හා කාර්යාල ආචාර විධි පිළිබඳ පුහුණුව	04	දින 02	38.00		දේශීය	
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	02	දින 02	20.00		දේශීය	
කළමනාකරණ මූල්‍ය නියාමනය	07	දින 02	70.00		දේශීය	
ගොනු කිරීමේ ක්‍රියා පිළිවෙල	07	දින 01	35.00		දේශීය	
මු.රෙ. 104’ යටතේ පාඩු සහ හානි පිළිබඳ විමසීම්	03	දින 01	15.00		දේශීය	
වෘත්තීය සංවර්ධනය ඉහළ නැංවීම	06	දින 02	57.00		දේශීය	
ගුණාත්මක සේවා පරිසරයක් සඳහා රියදුරන්ගේ කාර්යාල සහයක කුසලතා වර්ධනය කිරීම	03	දින 01	15.00		දේශීය	
රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීමේ ක්‍රියා පටිපාටිය	02	දින 01	10.00		දේශීය	
රජයේ වාහන නඩත්තුව	01	දින 02	10.00		දේශීය	
ආයතන සංග්‍රහ විධි විධාන පටිපාටික භාවිතය	02	දින 02	19.00		දේශීය	
විනය කාර්යය පටිපාටිය	01	දින 02	9.50		දේශීය	
තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය	01	දින 02	9.50		දේශීය	
ප්‍රවාහන කළමණාකරණය	01	දින01	6.00		දේශීය	
කැබිනට් පත්‍රිකා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම	01	දින 01	6.00		දේශීය	

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය	නිමවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ආයතන සංග්‍රහ විධි විධාන පටිපාටික භාවිතය	05	දින 02	65.00		දේශීය	
වැටුප් පරිවර්තන	03	දින 02	39.00		දේශීය	
ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා නීති	02	දින 02	1.90		දේශීය	
කම්කරු නීතිය සහ කාර්යාල පරිපාලනක්‍රියා පටිපාටිය	01	දින 02	9.50		දේශීය	
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යය භාරය	01	දින 02	9.50		දේශීය	

*ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

එමගින් ආයතනයේ ඵලදායීතාව වැඩි දියුණු කර ගත හැක.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	වෙනත්			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන්දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	ව්‍යාපෘති සඳහා නිකුත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු එම ව්‍යාපෘතිය මගින් ගෙන්වා ගත යුතු බැවින් ඒ සඳහා	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
			දින 07ක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කළ නොහැකිවේ.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	නිකුත් කළ විගණන වාර්තා වලින් 75%කට පමණ මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා නොමැත.	පිළිතුරු ගෙන්වා ගැනීමට - සිහි කැඳවීම් ලිපි යැවීම - විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණ කමිටු**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	2023 වර්ෂයේ වත්කම් අපහරණය කර නොතිබුණි.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	2023 වර්ෂයේ ගර්හිත භාණ්ඩ අපහරණය කර නොතිබුණි.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මේ වනවිට අපහරණ කටයුතු මුල් අදියරේ පවතී.	-

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙනයාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වාරිමාර්ග කළමනාකරණ අංශයේ හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	දැනට සම්පාදනය කරමින් පවතී.	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	දැනට සම්පාදනය කරමින් පවතී.	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	දැනට සම්පාදනය කරමින් පවතී.	-

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව බඳවාගැනීම් පටිපාටියේ සේවා ව්‍යාවස්ථා වලට අනුකූලව පුහුණුවීම් පමණක් සිදුකෙරේ.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

நீர்ப்பாசன அமைச்சின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்

Projects Implemented under the Ministry of Irrigation

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන/ மகாவலி நீர் பாதுகாப்பு முதலீட்டு நிகழ்ச்சித் திட்டம்/ Mahaweli Water Security Investment Program (MIWSIP)





වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட மேல்மாகாண கால்வாய் கருத்திட்டம்/ North Western Province Canal Project (NWPCP





උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட மத்திய மாகாண கால்வாய்/ North Central Province Canal Project (NCPCP)





මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය/ மினிபே இடக் கரை கால்வாய் மறு சீரமைப்பு /Minipe Left Bank Canal Rehabilitation Project (MLBCRP)

2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය/ உமா ஓய பல் நோக்கு அபிவிருத்தி கருத்திட்டம்/ Uma Oya Multipurpose Development Project



පුහුල්පොල වේල්ල / புஹுல்பொல அணைக்கட்டு / Puhulpola Dam



ඩයරබා ජලාශය/ டயரபா அணைக்கட்டு / Dyaraba Dam



පෙරආර උමඟ /பெற அரா சுரங்கப்பாதை/Headrace Tunnel



භූගත බලාගාරය/நிலத்தடி மின் நிலையம் /Underground power house

3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය/ மொரகஹகந்த களு கங்கை நீர்த்தேக்க கருத்திட்டம்/ Moragahakanda Kaluganga Reservoir Project



මොරගහකන්ද ජලාශය/ மொரகஹகந்த நீர்த்தேக்கம்/ Moragahakanda Reservoir



කළුගඟ ජලාශය/களு கங்கை நீர்த்தேக்கம்/ Kaluganga Reservoir




ගුරුවෙල නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය/ **குருவெல முள்குடியேற்ற பிரதேசம்**/ Guruwela resettlement area

4. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය /ஒருங்கிணைந்த நீரேந்து மற்றும் நீர்வளங்கள் முகாமைத்துவ கருத்திட்டம் / Integrated Watershed and Water Resource Management Project (IWWRMP)



කල්මඩු යෝජනා ක්‍රමයේ ප්‍රතිසංස්කරණය කිරීම් - මූලස්ථායි / **கல்மடு திட்டத்தில் சீர்திருத்தங்கள் - மூலஸ்தை** / Rehabilitation of Kalmadu Scheme Headworks



මුහදන්කුලම් යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම / **முகத்தான்குளம் திட்டத்தை சீரமைத்தல்** / Rehabilitation of Muhathankulam Scheme




අකදිමුරිප්පු වැව ප්‍රතිසංස්කරණය කිරීම **/ அகத்திமுறிப்பு ஏரியை புனரமைத்தல் /** Rehabilitation of Akathimurippu Tank



බතලගොඩ යෝජනා ක්‍රමයේ D1, D2, D4 ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම / படலகொட திட்டத்தில் D1, D2, D4 கால்வாய்களை புனரமைத்தல் / Rehabilitation of D1, D2, D4 canals in Bathalagoda Scheme



දේවහුව යෝජනා ක්‍රමය ඇළ මාර්ගයේ ඉදිකිරීම් - දඹුල්ල / தேவாஹுவா திட்டத்தின் கால்வாய் நிர்மாணம் / Canal Construction of Dewahuwa Scheme






Rip Rap ඉදිකිරීම් කටයුතු / Rip Rap கட்டுமான பணிகள் - அம்பாறை / Rip Rap Construction works – Ampara

5. දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය/கால நிலை மாற்றங்களுக்கு இயைபாக்கமடைவதற்கான ஒருங்கிணைந்த நீர் முகாமைத்துவ கருத்திட்டம்/Climate Resilient Integrated Water Management Project (CRIWMP)





ආඩියාපුලියන්කුම ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය - වවුනියාව දිස්ත්‍රික්කය/ ஆடியன்குளம் கிராமிய நீர் விநியோக திட்டம் - வவுனியா மாவட்டம் / Andiyapuliyankulam Rural Water Supply System (RWSS)



අනුරාධපුර මැදවච්චිය අළුත් හල්මිල්ලෑව එල්ලංගා පද්ධතියේ අතරමැදි කන්න වගාව / **அநுராதபுரம் மெதவாச்சிய அலுத் ஹல்மில்லேவ எல்லங்க முறைக்கு இடைப்பட்ட பயிர் செய்கை** / Anuradhapura Medavachchia Aluth Halmillewa Ellanga system inter-season cropping



සුභාවිත කෙසෙල් පරඬැල් ආශ්‍රිත අත්කම් නිෂ්පාදන වන්නි ග්‍රීන් ගොවි වෙළඳපොළ ආශ්‍රිත කර්මාන්තය / **இயற்கை வாழை இலை கைவினைப்பொருட்கள் வன்னி பசுமை உழவர் சந்தை தொடர்பான தொழில்கள்** / Natural Banana Leaf Handicrafts Vanni Green Farmers Market Related industries



වැසිජල ටැංකි පද්ධති සවි කිරීම සහ නඩත්තු පුහුණු පැවැත්වීම / **மழைநீர் தொட்டி அமைப்பு நிறுவுதல் மற்றும் பராமரிப்பு பயிற்சி நடத்துதல்** / Installation of Rain water Harvesting tanks and conducting O & M Trainings



පොළොන්නරුව ගල්ඔය සත්ත්ව අහාර සැකසුම් හා විකුණුම් මධ්‍යස්ථානය / **பொலன்னறுவை கலோயா விலங்கு உணவு பதப்படுத்துதல் மற்றும் விற்பனை நிலையம்** / Polonnaruwa Galoya Animal Food Processing and Sales Centre

6. පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය / தாழ் மல்வத்து ஓய பல்நோக்குஅபிவிருத்தி கருத்திட்டம்/ Lower MalwathuOya Multi Sector DevelopmentProject





පස් වේලි ඉදිකිරීම් කටයුතු/ மண்வேலைகளின் கட்டுமானம் / Construction of Earthen Embankment Works



නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල මාර්ග ඉදිකිරීමේ කටයුතු / மீள்குடியேற்ற பகுதிகளில் வீதி நிர்மாண நடவடிக்கைகள் /Road Construction works for Resettlement Area



දකුණු සොරොව්වෙහි ඉදිකිරීම් කටයුතු /மண் வேலைகளின் கட்டுமானம்/ Construction of RB Sluice Works

7. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය / தல்பிட்டிகல நீர்த்தேக்க கருத்திட்டம் / Thalpitigala Reservoir Project





වේල්ල ප්‍රවේශ මාර්ගය /அணை அணுகல் சாலை/ Dam Access Road

8. නුවරඑළියේ බැරක්තැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම/நுவரெலியா பெரெக்தென்ன குளத்தை மறு சீரமைத்தல் / Restoration of Barrack Plain Tank in NuwaraEliya





බැරක්ප්ලේන් වැව සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු/ பெரெக்ப்லேன் ஏரியின் கட்டுமானம்/ Construction of Barrack Plane lake

ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන්
செயற்படும் நிறுவனத்தின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்/ நிகழ்ச்சிகள்
Projects / Programmes Implemented under the Implementing Institutions

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசன திணைக்களம்
Irrigation Department

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය/யான் ஓயா நீர்த்தேக்கத் திட்டம்/ Yan Oya Reservoir Project



යාන් ඔය පහල නිම්නයේ ජයන්ති වැව ප්‍රධාන ඇළ වැඩිදියුණු කිරීම / ஜயன்திவாவியின் பிரதான கால்வாய் மேம்படுத்தல் / Yan Oya Downstream Jayantiwewa Main canal Improvements



ඉස්සන් වැව 2023/2024 මහ කන්නයේ නව කුඹුරු ඉඩම් / இஸ்ஸன்வெவ புதிய வயற்காணிகள் / Issanwewa new paddy Lots 2023/2024 Maha



යාන් ඔය පහල නිම්නයේ ජයන්ති වැව D ඇල වැඩිදියුණු කිරීම / ஜயன்திவாவியின் கீழ் நீரோட்டத்தின் D கால்வாய் மேம்படுத்தல் / Yan Oya Downstream Jayantiwewa D canal Improvements



ඉස්සන්වැව ජලාශය / இஸ்ஸன்வெவ நீர்த்தேக்கம் / Issanwewa tank

2. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය/கீழ் ஊவா திட்டம்/ Lower Uva Project





දෙබර ආර පෝෂිත ඇළ ඉදි කිරීම/ டெபரா அரா ஊட்டி கால்வாய் அமைத்தல்/ Construction of Debaraara feeder canal

3. මොරාණ ජලාශය/ மொரான நீர்த்தேக்கம்/ Morana Reservoir



ප්‍රධාන ඇළ බැම්ම මාර්ගයෙහි සංවර්ධන කටයුතු/ பிரதான அணைக்கரை பாதையின் அபிவிருத்தி பணிகள் / Development of road along Main canal



මොරාණ ජලාශ ව්‍යාපෘතිය/ மொரான நீர்த்தேக்கதிட்டம்/ Morana Reservoir Project

4. ඇල්ල වැව ජලාශය/ எல்ல வாவி நீர்த்தேக்கம்/ Ella Wewa Reservoir



සොරොව්ව සහ ප්‍රධාන බැම්මෙහි දකුණු ඉවුර ඉදිකිරීම/பிரதான கரையின் மதகு மற்றும் வலது கரை கட்டுதல்/Sluice structure and Right Bank of Main Bund



ප්‍රධාන බැම්මෙහි වම් ඉවුර ඉදිකිරීම/ பிரதான கரையின் வலது கரையைக் கட்டுதல் / Construction of Left Bank of Main Bund

5. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය) / **மொனராகலை மாவட்டத்தில் துரிதப்படுத்தப்பட்ட நீர்ப்பாசன அபிவிருத்தி கருத்திட்டம -வெல்லஸ்ஸ நவோதய / Accelerated Irrigation Development Project in Monaragala District (WellassaNavodaya)**





වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය යටතේ සිදුකරන ඉදිකිරීම්/ வெல்லஸ்ஸ நவோதய திட்டத்தின் கீழ்கட்டுமானப்பணிகள்/ Construction works under Wellassa Navodaya Project

6. කැළණි ගඟ ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය/ **களனி நதி அணைக்கட்டு பாதுகாப்பு/ Kelani River Bund Protection Project**



කැළණි උතුරු බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම /களனி வடக்கு கரை புனரமைப்பு/ Kelani North bund rehabilitation



සුළු ගංවතුර ආරක්ෂණ නිර්මිතයන් වැඩිදියුණු කිරීම / கட்டமைப்பினைமேம்படுத்தல் / Improvements to MFP Structures / MFP

7. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම/ **கொடிகமுவ குளத்தின் அபிவிருத்தி மற்றும் மேம்பாடுகள்/ Development and improvement of Godigamuwa Tank**





පිටවානෙහි ඉදිකිරීම් කටයුතු/ கசிவு கட்டுமானம்/ Construction of Spill

8. කැළණි, මුන්දෙනි ආරු, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය/ **களனி, முண்டேனியாறு, களு, நில்வல மற்றும் ஜின்கங்கைப்படுகைகளில் வெள்ளத்தணிப்புத் திட்டங்கள்/ Flood Mitigtion Projects in Kelani , Mundeniaru, Kalu, Nilwala& Gin Ganga basin**



තල්ගහගොඩ පොම්පාගාරය වැඩිදියුණු කිරීමේ කටයුතු / தல்கஹகொட நீரிரைப்பு நிலையமேம்படுத்தல் பணிகள் / Improvements work – Thalgahagoda Pump House



කැපූ ඇල වැඩිදියුණු කිරීම / கெபு எல கால்வாய் மேம்படுத்தல் / Improvements to Kepu ela

9. මා ඔය අත්තනගලු හා බෙන්තර ගඟ යන ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය/ **மாஓயா, அத்தனகலு ஓயா மற்றும் பெந்தர கங்கையில் வெள்ளப் பாதுகாப்பு அமைப்புகளை மேம்படுத்துதல் / Mitigate floods in Maoya , Aththanagaluoya and Bentara Ganga**



බෙන්තර ගඟ දකුණු ඉවුර ව්‍යාපාරයේ ඇලවල් පවිත්‍ර කිරීම / பெந்தர கங்கையின் வலதுகரைத் திட்டத்தினை சுத்தப்படுத்தல் / Canal clearing at Bentara RB scheme



මහ ඔය බාදන වාරක ඉදිකිරීම / மகா ஓயாவின் groynes ஐ நிர்மாணித்தல் / Construction of groynes in Maha oya

10. උමාඔය පහළ නිම්න සංවර්ධනය **/உமா ஓய பல்நோக்கு அபிவிருத்தி / Uma Oya Downstream Development**









උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘති කටයුතු / உமா ஓயா கீழ்நிலை அபிவிருத்தித்திட்டம்/ Uma Oya Downstream Development Project

11. හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය/ ஹிம்பிலியகட நீர்ப்பாசன உட்கட்டமைப்பு அபிவிருத்தித்திட்டம்/ Himbiliyakada Irrigation Infrastructure Development Project





හිඹිලියාකඩ වැව හා වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම/ஹிம்பிலியகடகுளம்மற்றும்குளக்கரையைபுனரமைத்தல்/ Rehabilitation of Himbiliyakada tank and tank bund

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
Irrigation Management Division

2022/23 මහ කන්න රැස්වීම / 2022/23 சீசன் மீட்டிங் / 2022/23 Maha Seasonal Meeting



රාජාංගනය ව්‍යාපාරය / ராஜாங்கனா திட்டம் / Rajanganaya Project



පදවිය ව්‍යාපාරය / பதவியா திட்டம் / Padaviya Project

නිරන්තර නඩත්තු වැඩසටහන / **நீர்ப்பாசன துணை அமைப்பின் வழக்கமான பராமரிப்பு** / Regular maintenance of Irrigation sub system



කෘෂි නිෂ්පාදනය/ **விவசாய உற்பத்தி** / Agricultural Production



රාජාංගනය ව්‍යාපාරය / **ராஜாங்கனை திட்டம்** / Rajanganaya Project

3වන කන්නයේ මුං වගාව - රාජාංගනය ව්‍යාපාරය සහ බදුළුඔය / බත්මැඩිල්ල ව්‍යාපාරය / **3வது பருவ பயறு வளர்ப்பு - ராஜாங்கனை மற்றும் பதுலுஓயா / பத்மடில்லா திட்டம்** 3rd Season Green Gram cultivation – Rajanganaya Project and Badulu Oya / Bathmedilla Project

වාරි සංස්කෘතිකාංග / **நீர்ப்பாசன கலாச்சாரத்தின் அம்சங்கள்** / Irrigation Cultural Activities



“සිරි දළදා යල් අස්වනු පූජාව” / “**ஸ்ரீ தலதா யல் அஸ்வானு பூஜை**” / “Siri Daladha Yal Aswanu Pujawa”



වාරි බල ප්‍රදේශ මට්ටමින් යල් අස්වනු පූජාව / **பாசனப் பகுதி அளவில் யல் அஸ்வானு பூஜை** / Yal Aswanu Puja irrigation sector wise


ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

இலங்கை மகாவலி அதிகாரசபை

Mahaweli Authority of Sri Lanka

මහවැලි කලාපවල අතහැර දැමූ ඉඩම් ප්‍රයෝජනයට ගනිමින් කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන **10**ක් පිහිටුවීම / மகாவலி வலயங்களில் கைவிடப்பட்ட காணிகளைப் பயன்படுத்திய வண்ணம் விவசாயத் தொழில் முனைவு தொடர்பாக 10 கிராமங்களை நிலை நாட்டுதல் / **Establishment of 10 Agro-entrepreneurship villages, utilizing abandoned lands in Mahaweli Zones**

ඇඹුල් කෙසෙල් නිෂ්පාදන ගම්මානය - වලව කලාපය / புளி வாழை உற்பத்திக் கிராமம் - **வளவ அமைப்பு** / **Embul Banana Production Village – System Walawa**















ඉහළ වටිනාකමකින් යුත් භෝග නිෂ්පාදන ගම්මානයක් (ආරක්ෂිත නිවස යටතේ) පිහිටුවීම
வැඩසටහනේ ප්‍රගතිය-කලාපය එච් /உயர் மதிப்பு பயிர் உற்பத்தி கிராமத்தை (பாதுகாக்கப்பட்ட வீட்டின் கீழ்) நிறுவுதல் திட்டத்தின் முன்னேற்றம்-அமைப்பு H /
Establishment of High value crop production village (under Protected House) program progress-System H

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
மத்திய பொறியியல் ஆலோசனைப் பணியகம்
Central Engineering Consultancy Bureau (CECB)






බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය /**பிராட்லேண்ட்ஸ் நீர்மின் திட்டம்**/Broadlands hydropower project



නාවික ජැටිය ඉදිකිරීම - ත්‍රිකුණාමලය / **ஜட்டி கட்டுமானம் - திருகோணமலை** / Construction of Navel Jatty - Trincomalee



වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය / **கொழும்பு துறைமுக நகர அபிவிருத்தி திட்டம்** / Colombo Port City development project

මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම
மத்திய பொறியியல் சேவைகள் தனியார் நிறுவனம்
Central Engineering Services (Pvt) Ltd



රත්නපුර අධිකරණ සංකීර්ණයඉදිකිරීම /**இரத்தினபுரியில் நீதிமன்ற வளாகம் கட்டுதல்**/ Construction of Court Complex at Rathnapura



රත්නපුර මහ රෝහලේ රේඛීය ඇක්සලරේටර් කාමරය සහ විකිරණ චිකිත්සක දෙපාර්තමේන්තුව / **இரத்தினபுரி பொதுவைத்தியசாலையின்லீனியர்ஆக்சிலரேட்டர்அறை மற்றும் கதிரியக்கசிகிச்சைப்பிரிவு** / Linear Accelerator Room & Radiotherapy Department at General Hospital, Rathnapura

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්එම්/ඒ/එම්අයි/එෆ්ජ්/2023 } ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 09 දින

ලේකම්

වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එම්.ඩී. සුදර්ශනී අමරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්එම්/ඒ/එමඅයි/එෆ්ඒ/2023 මගෙ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 07 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
වාරිමාර්ග අමාත්‍යාංශය

ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ නොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
3.8 කළමනාකරණ දුර්වලතා	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කර, වසර 13 ක් තුළ ක්‍රියාත්මක	3.5 කළමනාකරණ දුර්වලතා

කිරීමක් නොකිරීමට හේතු වූ කරුණු, වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ එම කාල සීමාව තුළ සිදු වී ඇති අවභාවිතයන් පිළිබඳ තක්සේරුවක් සමඟ රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත වාර්තා කළ යුතුය

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

ඒසිඒ-1(ii) ආකෘතියේ මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතාව පැහැදිලි කිරීම පිළිබඳ ප්‍රකාශයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ලෙස රු. 1,335,900,000 ක් සටහන් කල යුතු වුවද, එහි මූලික ආදායම් ඇස්තමේන්තුව වූ රු. 1,275,355,000 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ලෙසද සටහන් කර තිබුණි. මේ හේතුවෙන් ආකෘතියේ "වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස" සහ "වෙනස්කම්වලට හේතු" දක්වා නොතිබූ අතර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. 60,545,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

වැය විෂය අංක 198-2-3-2506 යටතේ වැයකර තිබූ රු. 33,582,127,928 න් රු.25,897,281,327 ක් එනම් සියයට 77 ක්, වෙනත් වැය ශීර්ෂ 07 ක ගණන්දීමේ නිළධාරීන් විසින් වැයකර මාසික ගිණුම් සාරාංශ මගින් වාර්තාකර තිබුණි. ඊට අදාල වියදම් මු.රෙ.146(අ), (ආ) ප්‍රකාරව වෙනත් ගණන්දීමේ නිලධාරීන් විසින් සිදුකර ඇති බව සහතික කිරීමට අදාල තොරුතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා සැලසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය වූ රු.මිලියන 69,217 යටතේ රු. මිලියන 30,587 ක් වැය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සැලසුම් කර වරින් වර භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණද ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනය රු. මිලියන 11,131 ක් එනම්, ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 36 ක් පමණක් වීම නිසා රු. මිලියන 19,456 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

2.2 ආදායම් කළමනාකරණය

(අ) මොරගකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අදියර I, II හා III මගින් උත්පාදිත විදුලිය වෙනුවෙන් 2021 – 2023 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් රු.3,697,431,708 ක ඉන්වොයිස්පත් ඉදිරිපත් කර තිබූ නමුත් ඉන් සියයට 23 ක් හෙවත් රු.853,731,252 ක් පමණක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවා තිබුණි. 2021 වර්ෂයේ සිට ඉදිරිපත්කල ඉන්වොයිස්පත්වලින් අය නොවූ රු. 2,843,700,456 ක වටිනාකම අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අයවිය යුතු ආදායම් අයකර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස්පත් සඳහා ගෙවීම් කල යුතු දිනය නියම කර, ප්‍රමාණවත් ගෙවීම් කාලයක් ලබාදී අනතුරුව පොළී අයකල හැකිවන පරිදි ගිවිසුම්ගතව නොතිබීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයෙන් අදාළ මුදල් සහ පොළිය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.3 වියදම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම, සැළසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලධන වියදම් වැය විෂය 2 ක් සහ පුනරාවර්තන වියදම් වැය විෂය 2 ක් සඳහා වෙන්කරන ලද පිළිවෙලින් රු.1,500,000 ක් සහ රු.800,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි.

(ආ) වැය විෂයයන් 36 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු. 63,765,110,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු.27,507,066,366 ක් හෙවත් සියයට 43 ක් ඉතිරි වී තිබුණි. එහිදී වැය විෂයයන් 36 ක් සඳහා ඉතිරිය සියයට 28 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය

වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646	ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ස්වකීය දෙපාර්මේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත එවිය යුතුවේ. වාරිමාර්ග අමාත්‍යාංශයේ සංචිත වාහන 46 ක් පැවතුනද, 2023 වර්ෂයේ එක් වාහනයක පමණක් ධාවන සටහන් ඉදිරිපත් කර තිබූ අතර වාහන 03 කට අදාලව 2023 මැයි මාසය දක්වා ධාවන සටහන් හා තවත් එක් වාහනයක 2023 ජනවාරි මාසයේ ධාවන සටහන් පමණක් ඉදිරිපත් කර තිබුණි. අනෙකුත් වාහන 41 ට අදාල ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) ඡේදය	සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් එකතුව රු.472,184ක ණය මුදලක් අය විය යුතුව තිබුණු අතර ඉන් එක් නිලධාරියකුගෙන් අය විය යුතු රු.73,062ක් වූ ණය මුදල වර්ෂ 10කටත් වඩා පැරණි විය. එම ණය මුදල් ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් ආපසු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.
(ඇ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය	වර්ෂ 5කට වැඩි කාලයක් තිස්සේ හඳුනානොගත් රු.434,066ක ණයගැනි ශේෂ 2023 මැයි වන විටත් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

(අ) මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා තීරුබදු සහන යටතේ ආනයනය කර වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් නමින් ලියාපදිංචි කරන ලද වාහන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරේ.

(i) මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සිදුකල ඉල්ලීම් මත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද තීරුබදු සහන බලපත්‍ර යටතේ වාහන 180 ක් හා යන්ත්‍රෝපකරණ 182 ක් ආනයනය කර තිබුණි. 2013 හා 2014 වර්ෂවලදී ආනයනය කර ඇති මෙම වත්කම් සඳහා නිකුත්කර ඇති ආනයන බලපත්‍රවල වලංගු කාලය වසර 1 ත් 2 ත් අතර පරාසයක පැවති අතර 2018 අප්‍රේල් 26 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබූ නමුත් ඊට අනුරූපීව බදු නිදහස් ආනයන බලපත්‍රයන්හි කාලසීමාව දීර්ඝ කරගෙන නොතිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුහට ආනයන බලපත්‍ර කොන්දේසි කඩකර අදාල භාණ්ඩ පරිහරණයට ඉඩකඩ සලසා තිබුණි.

(ii) ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ප්‍රති අපනයන පදනම මත උක්ත වාහන ආනයනය කර තිබූ අතර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තුමේන්තුව විසින් නිකුත්කර තිබූ බලපත්‍ර කොන්දේසි අනුව අදාළ කාලය අවසානයේ ඒවා ප්‍රති අපනයනය හෝ විනාශ කිරීම සිදු කළ යුතු වුවත් ප්‍රති අපනයනයට හෝ විනාශ කිරීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව ප්‍රති අපනයනය නොකරන්නේනම් ඒවා රජයට පවරා ගැනීමට හැකියාව පැවතියද ඒ සඳහා ද කටයුතු කර නොතිබුණි.

(iii) මෙම වාහන හා යන්ත්‍රෝපකරණ අයිතිය කොන්ත්‍රාත්කරු වෙත පවරා දීමට අදාළව ගිවිසුමේ ප්‍රතිපාදන නොතිබියදී වාහන වල අයිතිය කොන්ත්‍රාත්කරු වෙත පවරා දීමට කටයුතු කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද වාහන 58 ක්, 76 ක් හා භාණ්ඩ අයිතම 182 ක් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි පවරා දීමට වාරිමාර්ග අමාත්‍යාංශයේ විරෝධතාවයක් නොමැතිබව වාරිමාර්ග අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ අංක PREV/2020/00095/CCR/01331 දරන 2022 ඔක්තෝබර් 20 දිනැති ලිපිය හා මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකගේ අංක MKDP/PD/ENG/38/VO1 XXXXXX1/2019/5093 දරන 2019 ජූලි 31 දිනැති ලිපිය මගින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි.

(iv) මීට අමතරව වාහන 16 ක් කොන්ත්‍රාත් සමාගම විසින් භාවිතා කරන බවත් ඉතිරි වාහන 30 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් භාවිතා කරන බවත්, බලපත්‍ර කොන්දේසි උල්ලංගනය කරමින් වාහන භාවිතය පිළිබඳ වූ විමසීමකට අදාළව ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින්

2020 අගෝස්තු 10 දින ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන සහකාර නිවාරන නිලධාරී වෙත දැනුම් දී තිබුණි.

(v) කොන්ත්‍රාත්කරු විසින් භාවිතාකරනු ලබන වාහන 16 අපහරණය කිරීම සඳහා මොරගහකන්ද කළුගහ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂක එකඟතාවය පලකිරීමෙන් අනතුරුව සිදුකළ රේගු පරීක්ෂනයේදී වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ නියෝජිත ලෙස නම් කර තිබූ නිලධාරියා විසින් උක්ත වාහන 16 ට අදාලව Consignee ලෙස කොන්ත්‍රාත් සමාගම පිළිගැනීමට එකඟ වී තිබීම මතභේදයට තුඩු දී තිබුණි. කෙසේ වෙතත් උක්ත එකඟතාවය මත වාහනවල අයිතිය කොන්ත්‍රාත්කරු වෙත පැවරීමට ශ්‍රී ලංකා රේගුවේ විරෝධතාවක් නොමැති බව රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PREV/2020/00095/CCR/0133 දරන 2020 ඔක්තෝබර් 19 දිනැති ලිපි මගින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබූ ප්‍රාඩෝ ජීප් රථ 3 ක් ඇතුළු ජීප් රථ 5 ක් ඩබල් කැබ් රථ 10 ක් හා වෑන් රථ 01 ක් වශයෙන් වූ වාහන 16 ක් රේගු භාරයට ගෙන කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි.

(vi) පරීක්ෂණයෙන් අනතුරුව රේගු ආඥාපනතේ විධි විධාන යටතේ අයකළ හැකි රු.මි. 476 ක දඩය රු.මි. 105 ක් දක්වා අඩුකර 2020 ඔක්තෝබර් 15 දින අයකර තිබුණි.

(vii) මෙකී වාහන 16 ට අදාලව වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් ඇමතූ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FP/R/84/07/66(iii) දරන 2022 පෙබරවාරි 25 දිනැති ලිපිය මගින්, ව්‍යාපෘතිය සඳහා බදු සහන පදනම් මත වාහන ආනයන කිරීමට නිකුත් කරන ලද බලපත්‍රයන්හි පිටපත්, වාහන 16 හි වාහන ලියාපදිංචි සහතික වල පිටපත් හා ව්‍යාපෘතිය අවසානයේ වාහන 16 ක් වාරිමාර්ග අමාත්‍යාංශයට භාර නොදීමට හේතු යන තොරතුරු ඉදිරිපත් කරන ලෙස දැනුම් දී වසර 2 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද එම තොරතුරු මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

(viii) කොන්ත්‍රාත් සමාගම විසින් මෝටර්රථ වල අයිතිය පවරාදීම සඳහා වූ ලිපි ලේඛන හා පැවරුම් ලේඛනයන්හි පිටපත් සහිත ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොකෙරුනි.

(ix) 2020 අගෝස්තු 10 දින ශ්‍රී ලංකා රේගුව වෙත දැනුම් දී තිබූ පරිදි ව්‍යාපෘතිය මගින් බදු සහන බලපත්‍ර යටතේ ආනයනය කර ඇති වාහන අතරින් 30 ක් ව්‍යාපෘති කාර්යාලය මගින් භාවිතා කරනු ලැබුවද එකී වාහන වලට අදාල ආනයන බලපත්‍රවල කාල සීමාව දීර්ඝ කර ගැනීමට හෝ පවරා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) (i) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 49,994 ක් වූ ඵලදායිතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP) සහ තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 2 සඳහා සැලසුම් කළ කාලය මෙන් දෙගුණයකටත් වැඩි කාලයක් ගතවී තිබුණද නිමකර නොතිබුණි. 2017 හා 2014 වර්ෂවල සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා විවිධ අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණ ද එම ප්‍රමාදයන් හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ වාසි සැලසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකි වීම පිළිබඳව විශ්ලේෂණයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද උක්ත ව්‍යාපෘති 2 සඳහා වර්ෂ 9 ක කාල සීමාවක් තුළ දරා ඇති රු. මිලියන 2,354.05ක පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ ආරම්භ කළ ගිං නිල්වලා ව්‍යාපෘතිය සඳහා 2014.09.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව 2014.11.05 වන දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, චීනයේ CAMCE ඉංජිනේරු ආයතනය සමඟ ඇ.ඩො. මිලියන 690ක වටිනාකමකින් යුත් ඉංජිනේරුමය ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) ගණුමය ගිවිසුමක් අත්සන් කරනු ලැබ ඇත. 2017වර්ෂයේ නිම කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘතිය සඳහා රු.4,011,054,982ක සංවලන අත්තිකාරමක් 2014 හා 2015 වර්ෂවල ගෙවා තිබුණු අතර මූලික භූ විද්‍යාත්මක සමීක්ෂණ හා මැනුම් කටයුතු ආරම්භ කළද 2015දී ව්‍යාපෘතිය නතර කරන ලදී. නැවත 2017දී උක්ත කාර්යයන් හා විස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට උක්ත සමාගම සමඟ ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව සිදු කළ ශක්‍යතා අධ්‍යයන වාර්තාව යාවත්කාලීන කළ යුතුව ඇති අතර 2023 වර්ෂයේ සිට කාර්යය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇතත් මේ දක්වා කටයුතු ආරම්භ කර නැත. 2023 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 4,089.54ක් වැය කර ඇතත් කිසිදු ප්‍රතිලාභයක් ආර්ථිකයට ලැබී නොතිබුණි.

(ආ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය ද්‍රෝණියේ සිට ජල ඌණතාවයෙන් පෙළෙන දක්ෂිණ කලාපයේ කිරිඳිඔය ද්‍රෝණියට ජලය සන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කරගෙන ශ්‍රී ලංකා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ෆරාබ් සමාගම 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඊට අදාළ සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක් විය. ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණි. උක්ත ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ සඳහා 2023 දෙසැම්බර් 31

දිනට ඇමරිකානු ඩොලර් මිලියන 504.05 ක් වැඩ සහතික කොට ගෙවා තිබුණි. පහත නිරීක්ෂණ කෙරේ.

(i) ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කිරීමට යටත්ව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2007 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2013 වර්ෂයේදී ඉරානය වෙත පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය මුදල අත්හිටුවා තිබීම හේතුවෙන් විදේශීය ණය ගිවිසුම යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් හෙවත් රු. මිලියන 6,522.85 ක් මූල්‍යනයෙන් අනතුරුව 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ ඇමරිකානු ඩොලර් මිලියන 453.913 ක් හෙවත් රු. මිලියන 67,737.738 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මූල්‍යකරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මගින් ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම තුළින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය වසර 7 ක් තුළ එනම් 2015 නොවැම්බර් 15 දිනට නිම කිරීමට නියමිතව පැවති අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රමාද කාලය වසර 8 කුත් මාසයක් වී තිබුණි. ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභ වූ විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම තුළින් දිනකට විදුලිබල මණ්ඩලයට රු. මිලියන 55 කට නොවැඩි මුදලක් ඉතිරිවන බව ගණන් බලා තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතිය වසර 8 ක් ප්‍රමාදවීම තුළින් සිදුව තිබූ පාඩුව රු.මිලියන 162,250 ක් වී තිබුණි. තවද මෙම ප්‍රමාදය හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කරගෙන යන හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම, පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම, බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සැපයීම යන ප්‍රතිලාභ අත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) උක්ත ප්‍රමාදය කාලය තුළ අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම මගින් සේවායෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව හා ඊට අදාළ ආවස්ථික පිරිවැය ගණනය කොට EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ව්‍යාපෘතියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 71 ක් ඉදිරිපත් කර තිබූ නමුත් එම කිසිදු අවස්ථාවකදී කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 0.01ක් වශයෙන් උපරිමය සියයට 5 ක් දක්වා එනම් ඇ.ඩොලර් මිලියන 26.453 ක් අයකළ හැකි බවට අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. ප්‍රමාද ගාස්තුව

ලෙස අයකරගෙන තිබුණේ ඇ.ඩොලර් 6,631,364ක් පමණක් වූ අතර අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එම මුදලින් ඇ.ඩොලර් 5,305,091 ක් ආපසු කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(iv) මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා 2023 ජනවාරි 08 දින වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා වූ කාලය 2023 ජූනි 30 දින දක්වා යෝජනා කර තිබුණි. ඒ සඳහා මුදල් ඇමතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2023 ජනවාරි 16 දිනැති නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට යටත්ව අනුමැතිය ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය දිගින් දිගටම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද වන දිනක් පාසාම ජාතික විදුලිබල පද්ධතියට දෛනික 120MW විදුලිබල ප්‍රමාණයක් එකතු කිරීමට නොහැකි වන හෙයින් ලංකා විදුලිබල මණ්ඩලයට බාහිර පාර්ශවයෙන් විදුලිය මිලදී ගැනීමට දිනකට රුපියල් මිලියන 100ක් පමණ අමතරව වැය කිරීමට සිදු වන බැවින් කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූනි 30 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට අපොහොසත් වන්නේ නම් 2023 ජූනි 30 දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ ගිවිසුම සකස් විය යුතු බවට මුදල් අමාත්‍යවරයා යෝජනා කර තිබුණි. එසේ වුවද ඊට අනුකූලව ගිවිසුම සකස් කිරීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකාහරිමින් ව්‍යාපෘති කාලය දීර්ඝ කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රජයට අමතර වැය බරක් නොමැතිව දීර්ඝ කරනු ලබන කාලය තුල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කල යුතු බවට නියම කර තිබූ බැවින් EPC කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූලව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් පැන නගින පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු බව හා නියමිත දිනට ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පැන නගින ආවස්ථික පිරිවැය අය කර ගැනීමට සිදු වන බව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිය යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොතිබුණි.

(v) කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූලි මස ඉදිරිපත් කර තිබූ දෙවන හිමිකම්පෑමේ බිල්පත මඟින් කාලය දීර්ඝ කිරීමට අදාළ හේතු 8 ක් සඳහා ඇමරිකානු ඩොලර් 105,159,108 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ තුළ 2020 දෙසැම්බර් සිට 2023 ජූලි දක්වා දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ඇමරිකානු ඩොලර් 56,152,590 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය ඇමරිකානු ඩොලර් 4,555,841 ක් ද 2020 මාර්තු 21 සිට 2020 ජූනි 15 දක්වා දීර්ඝ කල කාලසීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ලෙස ඇමරිකානු ඩොලර් 10,402,273 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය ලෙස ඇමරිකානු ඩොලර් 403,089 ක් ද ඇතුළත්ව පැවතුණි. එහිදී FIDIC අන්තර්ජාතික ගිවිසුම් කොන්දේසි හා අමාත්‍ය මණ්ඩල තීරණයන් මගින් පනවා තිබූ සීමාවන් නොසලකා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු මෙහෙයවා තිබූ අතර මෙම හිමිකම් පෑම පිළිබඳ තොරතුරු හෝ කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම පිළිබඳ උක්ත සංදේශය තුළ දක්වා නොතිබුණි.

(vi) කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුවක් සේවායෝජක වන රජයෙන් ඉල්ලා තිබුණි. මේ පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් නිලධාරීන් 7 දෙනෙකුගෙන් සමන්විත සාකච්ඡා සම්මුති කමිටුවක් (Cabinet Appointed Negotiation Committee) පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ගණනය කර ඉදිරිපත් කරන ලද ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුව වෙනුවට, ඇමරිකානු ඩොලර් 19,517,082 ක ප්‍රමාද ගාස්තුවක් නිර්දේශ කර තිබුණි. එකී ප්‍රමාද ගාස්තු හිමිකමට අමතරව ඉරාන රජයට පනවා තිබූ ආර්ථික සම්බාධක හා වෙනත් දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය බාධාවන් සඳහා සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලයේ කැමත්ත පරිදි, ඇමරිකානු ඩොලර් 19,094,795 ක අමතර ගාස්තුවක් ගෙවීමට ද නිර්දේශ කර තිබුණි. ඒ අනුව ප්‍රමාද ගාස්තුව හා සානුකම්පිත හේතු මත සළකා බැලීමට නිර්දේශ කර තිබූ මුදල එකතු කර ඇ.ඩොලර් මිලියන 38.62 ක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට කමිටුව නිර්දේශ කර අර්ථ ගන්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි.

(vii) මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම එම ක්‍රියාවලියට සම්බන්ධ වූ හා ඒ පිළිබඳ පූර්ණ අවබෝධයෙන් යුතු නිලධාරීන් ඇතුළත් කර නොතිබීමෙන් හා ව්‍යාපෘතියට සෘජුව සම්බන්ධ නොවූ නිලධාරී කණ්ඩායමක් සම්මුති සාකච්ඡා කමිටුව සඳහා පත්කිරීමට යෝජනා කර තිබීමෙන් කමිටුව විසින් අත්‍යවශ්‍ය පාර්ශව සමඟ ප්‍රමාණවත් සන්නිවේදනයක් සිදුකර නොතිබීම, ව්‍යාපෘතියේ කටයුතු මූලික ගිවිසුම්ගත කාලයකට සමාන කාලයකින් ප්‍රමාද වී තිබියදී ඒ මගින් ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව හා ඊට අදාළ ආවස්ථික පිරිවැය EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර අයකර ගැනීමේ හැකියාව පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබීම, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී "රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සියලු ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාර දීම" යන කොන්දේසිය පනවා තිබූ නමුත් එම කොන්දේසිය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම, කමිටු නිර්දේශය තුළ සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලය කැමැත්ත මත ඇමරිකානු ඩොලර් 19,094,795ක අමතර ගාස්තුවක් ගෙවීමට නිශ්චිත නොවූ හා වෘත්තීමය භාවිතයෙන් තොර නිර්දේශ ඇතුළත් කර තිබුණි.

(viii) 2021 නොවැම්බර් 01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර එම අනුමැතිය මත පළමුව සියයට 50 ක වාරිකයක් පමණක් ගෙවීමටත්, ඉතිරිය කොන්ත්‍රාත්කරුගේ වගකීම් කාලය අවසන් වීමෙන් පසුව ගෙවීමටත් යන පදනම මත ලංකා විදුලිබල මණ්ඩලය විසින් පළමු සියයට 50 වාරිකය වන ඇමරිකානු ඩොලර් මිලියන 19.306 න් 2022 වර්ෂයේ ඇමරිකානු

ඩොලර් මිලියන 7.437 ක් ද 2023 වර්ෂයේ ඇමරිකානු ඩොලර් මිලියන 11.521 ක් ද වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 18.96 ක් ගෙවා තිබුණි.

(ix) ව්‍යාපෘතියේ ප්‍රතිස්ථාපන මාර්ගයේ මුල් සැලසුමට ඇතුළත් කර තිබූ පුහුල්පොළ වේල්ල ඉදිකිරීමේ පූර්ව අවශ්‍යතාවයක් වූ පැවති බදුල්ල, වැලිමඩ මාර්ගයේ පවතින පැරණි මාර්ගයේ මීටර් 250 ක් අමතරව දිර්ඝ කර නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් තම විෂය පථයෙන් බැහැරව යමින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කල රු.133,476,320 ක ඇස්තමේන්තුව අනුමත කර තම ඉන්වොයිස් වලින් අඩු කර ගෙවීමට කැමැත්ත පලකර තිබුණි. ඒ අනුව එම මාර්ගය සකස් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට යොජනා කර තිබුණ ද, මාර්ගය සකස් කර නොතිබුණු අතර පුහුල් පොළ වේල්ල වැඩ බිම ප්‍රවේශ මාර්ගය හා නව මාර්ගය සකස් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 1,514,094 ක් ඇස්තමේන්තු කර රු.1,317,248 ක් ගෙවා තිබුණි.

(x) ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණ සමාගමෙන් ඇමරිකානු ඩොලර් 5,000,000 ක වන්දියක් ලබාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.1,931,346,396 ක් ගෙවා තිබූ අතර රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට 2019 මැයි 22 දින ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබූ නමුත් ඉන් රු. මි. 1,124.62 ක් විගණිත දිනය දක්වාම අය කර ගෙන නොතිබුණි. ඔවුන්ගෙන් අයකර ගත් මුදල නැවත ගෙවන ලෙස කොන්ත්‍රාත්කාර සමාගම විසින් ඉල්ලීමක් සිදු කර තිබුණි. තවද බලපෑමට ලක් වූ ජනතාව වෙත ගෙවන ලද වන්දි මුදල් හා පානීය ජලය සැපයීම වෙනුවෙන් සමාගම විසින් දරා ඇති ඇමරිකානු ඩොලර් මිලියන 6.108 ක වියදම ද ලබා දෙන ලෙස සමාගම ව්‍යාපෘතියෙන් ඉල්ලා තිබුණි.

(xi) වාරිමාර්ග අමාත්‍යවරිය විසින් 2024 පෙබරවාරි 05 දින ඉදිරිපත් කර තිබූ අංක අමප/24/0044/623/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතියේ ඇමරිකානු ඩොලර් 514 ක පිරිවැයක් දරා නිම කරන ලද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 මාර්තු 31 දිනට අවසන් කිරීමත් සමඟ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මඟින් ව්‍යාපෘතිය නඩත්තු කරන ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන වෙත එහි මෙහෙයුම් කටයුතු භාර දී වත්කම් හා ලේඛණ භාරදීම සිදු කල යුතුව පැවතුණද අදාල වත්කම් හා ලේඛණ ෆරාබි සමාගමෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය භාර ගෙන අදාළ ආයතන වලට භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාදුරු ඔය දකුණු ඉවුරු ඇලේ ඉදිකිරීම්

මාදුරුඔය දකුණු ඉවුරු ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 38,500.90 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ප්‍රධාන ඇල ඇතුළුව සංවර්ධන කාර්යන් 14 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.

(i) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 සිට 2023 දක්වා රු. 1.689,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.836,104,531 ක් හෙවත් සියයට 50 ක් පමණක් වැයකර තිබුණි. එහිදී සීමිත ප්‍රතිපාදන යටතේ ප්‍රමුඛතා පදනම මත ඉටුකල යුතු කාර්යන් හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක වී නොතිබුණි. එහිදී ප්‍රධාන ඇල මාර්ගය සඳහා ප්‍රමුඛතාවය ලබා දීමකින් තොරව රු.මිලියන 7,475 ක ඇස්තමේන්තු මත පාලම් ඇතුළු ප්‍රධාන වෙලඳපොල මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ යටතේ දම්මින්න සිට වලමන්ඩිය දක්වා මාර්ගය කිලෝමීටර් 0+630 සිට කිලෝමීටර් 4+030 දක්වා කොටස වැඩිදියුණු කිරීම රු. 93,459,575 ක ඇස්තමේන්තුව 2021 ජුලි 30 දින ආරම්භ කර තිබූ අතර 2023 සැප්තැම්බර් වන විට වැටී බදු ඇතුළුව රු. 82,985,198 ක පිරිවැයක් දරා තිබුණි. උක්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී නිසි සැලැස්මකින් තොරව ඇල මාර්ගයේ තැනින් තැන කි.මී. 3.4 ක් කැනීම් කර තිබුණි.

(ii) රු.93,459,575 ක් පිරිවැය යටතේ දම්මින්න වලමණ්ඩිය මාර්ගය කිලෝමීටර් 3+400 ක් කාපට් ඇතිරීමට ඇස්තමේන්තුවක් අනුඥාත කර තිබුණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වැලි කැනීම් බලපත්‍ර ලබාදුන් ස්ථානයන්ට ප්‍රවේශ වීමේ පහසුව අරමුණු කරගෙන මෙම මාර්ගය ඉදිකිරීමට ප්‍රමුඛතාවය ලබාදී තිබුණි. එහිදී දම්මින්න වලමන්ඩිය මාර්ගය කාපට් දමා සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබූ නමුත් එහි ABC දැමීමෙන් පසු කාපට් ඇතිරීමට වෙනුවට තාර ස්ථරයක් දමා ඉදිකිරීම් අතරමග නවතා තිබුණු අතර ඒ වන විට මුළු පිරිවැය රු.45,241,775 ක්වූ වැඩ කොටස් නිම කර නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා අන්‍යෝන්‍ය එකඟතාවය මත ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර තිබුණි.

(iii) රු. 82,985,198 ක් වැයකර කිලෝමීටර් 3.4 ක් වූ මෙම මාර්ගය ABC අතුරා අතරමග වැඩ නවතා තිබූ මාර්ග වසරකට අඩු කාලයක් තුල තැනින් තැන පලුදු වී තිබුණි. එසේ වුවද හානි පුනරුත්ථාපනය සඳහා තැන්පතුවක් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගෙන නොතිබූ අතර හානිය අයකරගෙන හෝ මාර්ගය ප්‍රතිසංස්කරණය කරද නොතිබුණි.

(iv) මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමේදී රු.7,258,698 ක අමතර වැඩ, රු. 13,948,399 ක අතිරේක වැඩ හා රු. 12,067,706 ක මිල වැඩිවීම් සඳහා ද විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම්ද කර තිබුණි.

(ඇ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, ජන පදිකයින් නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ යටිතල පහසුකම් සැපයීම, අවතැන්වූවන් සහ හානියට පත් නිවාස වෙනුවෙන් වන්දි ගෙවීම ඇතුළු ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට අනුශාංගික වූ ඇතැම් කාර්යයන් සිදුකිරීම සඳහා ව්‍යාපෘතිය සමග බදුල්ල දිස්ත්‍රික්කයේ උඟවපරණගම, ඇල්ල, වැලිමඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 සෘජුව සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වී තිබුණි. ව්‍යාපෘතියේ උක්ත කටයුතු වලට අදාල සියලු වියදම් සිදුකිරීම සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කරනු ලැබූ අරමුදල් වලින්, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කිරීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක එකතුව රු.2,209,455 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තැන්පත් ගිණුම්වල තැන්පත් කර තිබුණි.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2020 අගෝස්තු 28 දින නිකුත් කරතිබූ අංක 2/2020 දරන චක්‍රලේඛයේ 10.2 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශ අංක 14 ප්‍රකාරව එහි සඳහන් ආකෘතිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කළ යුතුව පැවතුණි. වාරිමාර්ග අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 2023 වර්ෂය තුල ක්‍රියාත්මක කල වැඩසටහන් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේදී ව්‍යාපෘතිය යටතේ ඉටුකරන ලද කාර්යයන් සහ එම එක් එක් කාර්යයන් සඳහා දරන ලද වියදම් සහ සමුච්චිත වියදම් වෙනවෙනම නිරීක්ෂණය වන පරිදි අදාල තොරතුරු නිශ්චිතව ඇතුළත් කිරීම වඩාත් යෝග්‍ය වුවත්, 2023 වර්ෂය තුල ක්‍රියාත්මක කල වැඩසටහන් පිළිබඳ එම තොරතුරු නිශ්චිතව දක්වා නොතිබුණි.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

3.2.1 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 01

(අ) මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ වූ උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතියේ එක් කොන්ත්‍රාත්තුවක්ද, වයඹ මහ ඇළ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් 03 ක්ද, මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් 06 ක්ද, 2015 – 2019 කාලය තුළ නිම කිරීමට යෝජිත විය. එසේ වුවද කොන්ත්‍රාත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ ප්‍රමාදයන්, සැලසුම් කල කාලය තුළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නොහැකි වීම, ඉදිකිරීම් නිසි ලෙස සැලසුම් නොකිරීම ඉඩම් අත්පත් කර ගැනීමේදී සිදු වූ ප්‍රමාද වීම් හා කොන්ත්‍රාත්කරුවන් නියමිත කාලය තුළ කොන්ත්‍රාත් නිම

නොකිරීම හේතුවෙන් අතිරේක වැඩ හා ප්‍රමාණ වෙනස් වීම් ඇතිවී තිබුණි. මෙකී හේතු මත 2022 ජූනි 30 දක්වාත් පසුව 2024 ජූනි 30 දක්වාත් ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

(ආ) (i) මිණිපේ වම් ඉවුර හා දකුණු ඉවුර ඇළ මාර්ග සඳහා ජල පාලන හා මිනුම් පහසුකම් සහිතව මිණිපේ අමුණ එසවීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 1,864.80 ක බදු රහිත වටිනාකමට විදේශ සමාගමකට 2018 ජනවාරි 05 දින භාර දී තිබූ අතර, එය 2020 නොවැම්බර් 12 දින අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද විවිධ හේතු මත දින 243ක දින දීර්ඝ ලබා දී කොන්ත්‍රාත් කාලය 2021 ජූලි 13 දින දක්වා දීර්ඝ කර තිබුණි. යෝජිත මිණිපේ අමුණ මධ්‍යයේ රොන්මඩ ඉවත් කිරීමේ දොරටුවක් සවි කිරීමට සැලසුම් කර තිබී, එය සවිකිරීම තුළින් පසුකාලීනව දොරටුව ක්‍රියාත්මක කිරීමේදී හා නඩත්තු කිරීමේදී ප්‍රායෝගික ගැටළු ඇතිවිය හැකි බවට හඳුනා ගැනීමෙන් පසු එම වැඩ විෂයය ඉවත් කිරීම සඳහා දින 134 ක් ලබාදී තිබීම මතභේදයට තුඩුදී තිබුණි.

(ii) අනතුරුව මෙම කොන්ත්‍රාත්තුව දින දීර්ඝ කිරීමෙන් තොරව වසර 02 කට ආසන්න කාලයක් පවත්වාගෙන ගොස් තිබූ අතර, මෙම කාලය තුළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 22 ක් විය. මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 2,912.85 දක්වා වැඩිකර ඉතිරි වැඩ මුල් කොන්ත්‍රාත්කරු මඟින් ඉටු කරවා ගැනීමට සංශෝධිත ගිවිසුම් අංක 02 අත්සන් කිරීමටත්, කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් 21 දින දක්වා වැඩි කිරීමටත් 2023 ජූනි 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුමේ කොන්ත්‍රාත්තු වටිනාකම ඇතුලත් නොකර ගිවිසුම අත්සන් කර තිබුණු අතර වැඩිකර තිබූ කොන්ත්‍රාත් වටිනාකම වූ රු. මිලියන 1,048.05 තුළ රු. මිලියන 996.10 ක්ම මිල විවලනයන් විය.

(ඇ) මොරගහකන්ද ජලාශයේ සිට කි.මී. 6.225 ක් දුරට ඉදිකරන ඇළ මාර්ගයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 64 ක්ව තිබියදී කොන්ත්‍රාත්කරුට ඇති වූ මූල්‍ය අවහිරතා මත කොන්ත්‍රාත්තුව තවදුරටත් කරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් 2021 ජූලි 13 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන සුරක්ෂණය මුදල් කර අලාභය අයකර ගැනීමට උත්සාහ දැරීමේදී කොන්ත්‍රාත්කරු පැවරූ නඩුවක් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව ලබා දුන් අත්තිකාරම් සුරක්ෂණයෙන් රු. මිලියන 185.89 ක්ද කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම වූ රු. මිලියන 390.51 ක්ද මේ දක්වා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) (i) වයඹ ඇළ මාර්ගයේ නෑබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා කි.මී. 17+050 ක ඇළ ඉදිකරන විදේශ සමාගම විසින් අදාළ කොන්ත්‍රාත්තුව 2018-2021 කාලය තුළ

නිම කළ යුතු වුවත් ඉදිකිරීම් සිදු කරන ප්‍රදේශවල ඉඩම් කොටස් පවරා ගෙන භූමියේ අයිතිය නිරවුල් කර භාරදීමට වසර 2½ ක කාලයක් ප්‍රමාද වීම නිසා 2023 දෙසැම්බර් 05 දක්වා අවස්ථා 04 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

(ii) මෙම ප්‍රමාද වීම හේතුවෙන් වැටි බදු සහිතව රු. මිලියන 7,226.62 කට ලබා දී තිබූ කොන්ත්‍රාත්තුව රු. මිලියන 15,154.74 දක්වා රු. මිලියන 7,928.12 කින් එනම්, සියයට 110 කින් වැඩි වී තිබුණි. 2022 වර්ෂයේ සිට ඇති වූ ආර්ථික හා මූල්‍ය අවපාතය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම හේතු ලෙස දක්වමින් වෙන් කර තිබූ රු. මිලියන 162 ක මිල විචලනය රු. මිලියන 5,827.7 දක්වා වැඩි කර තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුවේ අතිරේක වැඩ හා ප්‍රමාණ වෙනස් වීම් සඳහා රු. මිලියන 540 ක් වෙන්කර තිබුණද එය රු.මිලියන 2,024.9 දක්වා රු. 1,484.9 කින් වැඩි කර තිබුණි. එහිදී මීටර් 13 ක් පළලට විවෘතව සකස් කිරීමට සැලසුම් කර තිබූ ඇළ මාර්ගය පසුව උපදේශක සමාගම විසින් මීටර් 10 ක් පළල ඇළ මාර්ග 02 ක් ලෙසට සංවෘතව කොන්ක්‍රීට් යොදා සකස් කිරීමට තීරණය කර ඒ අනුව සැලසුම් වෙනස් කිරීම හේතුවෙන් කොන්ක්‍රීට් සන මීටර් 45,425 ක් අතිරේකව යෙදීමට සිදුව තිබීම නිසා රු. මිලියන 1,245.54 ක් අතිරේකව වැය කිරීමට සිදුව තිබුණි. මෙහිදී උපදේශක සමාගමේ නිර්මාණ සැලසුම් කිරීම අභියෝගයට ලක්ව තිබුණි.

(iv) මෙම කොන්ත්‍රාත්තුව යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දේවහූව ඉංජිනේරු කාර්යාලය අළුත්වැඩියාව සහ නවීකරණය කිරීම සඳහා රු. මිලියන 10 ක මුදලක් වෙන් කර තිබූ අතර, එය ගුවු පොකර එම මුදලින් රු. මිලියන 9.6 ක් වැයකර ව්‍යාපෘතියේ උපදේශක සමාගම සඳහා දෙමහල් නිවසක් කුලී පදනම මත ලබාගෙන තිබුණි.

(v) 2023 දෙසැම්බර් 05 දක්වා පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණත්, 2023 දෙසැම්බර් 31 දිනටද කොන්ත්‍රාත්තුව නිමකර නොතිබූ අතර එදිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 91.4 ක් විය.

(ඉ) වැඩසටහන සඳහා උපදේශන සේවා ලබාගැනීම සම්බන්ධව පහත නිරීක්ෂණ කෙරේ.

(i) මෙම වැඩසටහන සූදානම් කිරීමේ තාක්ෂණ සහාය (PPTA) සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්කළ කණ්ඩායමේ ප්‍රධානියා පසුව මෙම වැඩසටහනේ උපදේශන සමාගමේ සේවයට බැඳී ව්‍යාපෘතියේ Team Leader & Chief Design Engineer ලෙස වසර 07 ක කාලයක් සේවය කරමින් පැවතුණි. ඒ සඳහා මසකට යුරෝ 26,000 ක

(රු.මිලියන 8.5) වැටුපක් ගෙවමින් පැවතුණු අතර, 2023 ජූනි වනවිට රු. මිලියන 702.18 ක් වැටුප් වශයෙන් ඔහුට ගෙවා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩසටහන සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට සහාය වූ පුද්ගලයෙකු වැඩසටහනේ උපදේශන සමාගමේ සේවය කිරීම තුළින් වැඩසටහන් සුපරීක්ෂණයේ ස්වාධීනත්වය අභියෝගයකට ලක්ව තිබුණි. මෙම උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කල උපදේශකවරුන් යොදා ගැනීම සඳහා වූ අත්පොතෙහි 1.11 ඡේදයටද පටහැණි විය.

(i) සිදුකිරීමට යෝජිත ඉදිකිරීම් කොන්ත්‍රාත් වල විෂයය පථය (Define the scope output and the length of the services) කොන්ත්‍රාත්වල කාර්යසාධනය පදනම් කරගෙන තීරණය කළ හැකි බැවින් ඒ මත උපදේශන ගාස්තු ගෙවීම කලයුතු වුවත්, කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවීම සඳහා 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයකට ඇ.ඩො. මිලියන 22.09 ක වටිනාකමකට උපදේශන කොන්ත්‍රාත්තු ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වල ඇති වූ ප්‍රමාදය නිසා ව්‍යාපෘති කාලය දීර්ඝ වී තිබූ නිසා මෙම දීර්ඝ වූ කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තුද ගෙවීමට සිදුවීමෙන් 2024 ජූනි 30 දක්වා අවස්ථා 06 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර පිරිවැය ඇ.ඩොලර් මිලියන 41.56 දක්වා වැඩිකර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් අදියර 01 සහ 02 සඳහා උපදේශන ගාස්තු ගෙවීමට වෙන්කර තිබුණේ ඇ.ඩො. මිලියන 25.93 ක් බැවින්, අනිකුත් වියදම් සඳහා වෙන්කළ මුදලින් වැඩි වූ උපදේශක ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය ආරම්භයේදී විදේශිකයින් 34 දෙනෙකු උපදේශන කටයුතු සඳහා බඳවා ගෙන තිබූ අතර, වර්තමානයේ විදේශිකයන් 08 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. විදේශීය පුද්ගලයෙකුට මසකට යුරෝ 16,000 සිට 26,000 (රු. මිලියන 5.5 සිට රු. මිලියන 9) දක්වා පරාසයක වැටුප් ද, යුරෝ 110 සිට 70 අතර පරාසයක දෛනික යැපීම් දීමනා ද ගෙවමින් පැවතුණි. මෙම විදේශීය පුද්ගලයන් වෙත 2023 ජූනි 30 දිනට යුරෝ 12,843,998 (රු.මිලියන 4,341) ක වැටුප්ද යුරෝ 1,068,599 (රු.මිලියන 361.18) ක යැපීම් දීමනා ද ගෙවා තිබුණි.

(iv) ව්‍යාපෘතියේ කටයුතු සඳහා විදේශීය උපදේශන සමාගම විසින් එයට අනුබද්ධ දේශීය සමාගම් 02 ක් හරහා දේශීය සේවකයන් 161 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, දැනට එයින් 110 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. මෙම කාර්ය මණ්ඩලයට අමතරව කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සහ කොන්ත්‍රාත් ක්‍රියාත්මක වන ප්‍රදේශවල පිහිටා ඇති වැඩබිම් කාර්යාල 08 ක සේවය කරන 48 ක කාර්ය මණ්ඩලයක් සඳහාද කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවමින් පැවතුණි.

(v) ව්‍යාපෘතියට අයත් වාහන 14 ක්, යතුරු පැදි 03 ක් උපදේශන සමාගම වෙත ලබා දී තිබූ අතර 2023 ජූනි 30 දිනට ඒවායේ මෙහෙයුම් හා නඩත්තුව සඳහා රු. මිලියන 67 ක වියදම් ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.

(vi) උපදේශන සමාගම භාවිතා කරන ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම සඳහා රු. මිලියන 9.65 ක්ද, විවිධ ස්ථානවල පවත්වාගෙන උපදේශන සමාගමට අයත් කාර්යාල පිහිටුවීම සඳහා රු. මිලියන 13.47 ක්ද, ඒවා නඩත්තු කිරීම සඳහා රු. මිලියන 84.83 ක්ද 2023 ජූනි 30 දිනට වැය කර තිබුණි.

(ඊ) ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කළ, බැංකුව සහ එහි ණයගන්නන් විසින් උපදේශකවරුන් යොදවා ගැනීමේ මග පෙන්වීම් අත්පොතෙහි 1.11 (b) සහ (c) ඡේද අනුව උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගන්නා සමාගම හෝ සමාගම් අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත් (උදා:- නිර්මාණ සැලසුම් සකස් කිරීම, පාරිසරික ඇගයීම්) කලින් සිදුකර තිබෙනම් උපදේශන කටයුතු සඳහා එම සමාගම් නැවත පත්කර නොගත යුතු අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ණය ගන්නා (වාරිමාර්ග අමාත්‍යාංශය) ආයතනවල සේවකයින් සමඟ පවුල් හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන්ද උපදේශන කටයුතු සඳහා දායක කර නොගත යුතු වේ. එසේ වුවද, මෙම වැඩසටහනේ උතුරු මැද හා වයඹ ඇළවල් ඉදිකිරීම සහ මිණිපේ ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල නිර්මාණ සැලසුම්, පාරිසරික ඇගයීම් වාර්තා, ශක්‍යතා අධ්‍යනය වාර්තා හා නවීකරණ වාර්තා සකස් කර ඒ සඳහා රු. මිලියන 102.98 ක මුදලක් මහවැලි උපදේශක කාර්යාංශ සමාගම හරහා ලබාගත් සමාගම පසුව මෙම වැඩසටහනේ ප්‍රධාන උපදේශක සමාගමේ ශ්‍රී ලංකා නියෝජිත සමාගම ලෙස 2015 වර්ෂයේ සිට කටයුතු කරමින් පැවතුණි. තවද එම නියෝජිත සමාගමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ණය ගැනුම්කරු වූ වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල විශ්‍රාමලත් නිලධාරින්ගෙන් සමන්විත විය.

(උ) (i) මහකිතුල උමං මාර්ගය, මහකිතුල හා මහකිරුල ජලාශ 02 හා එම ජලාශ 02 අතර ඇළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2020 – 2024 කාලය තුළ රු. මිලියන 9,978.48 ක වටිනාකමකට ඉදිකිරීමට භාරගත් සමාගමට ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් සහ ඉදිකිරීම් උපකරණ නොමැති වීම, දුර්වල වැඩබිම් කළමනාකරණය යන හේතු මත සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රගතිය පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2023 මැයි 26 අවලංගු කර තිබූ අතර, ඒ වනවිට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක් විය.

(ii) මෙම ඉදිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු යාන් ඔය ව්‍යාපෘතියේද ඉදිකිරීම් සිදුකර තිබූ අතර, එම ව්‍යාපෘතිය සඳහා බදු සහන සහිතව ගෙන එන ලද යන්ත්‍ර සූත්‍ර

උපකරණ සහ වාහන 143 ක් සඳහා ගෙවිය යුතු රේගු බදු ගෙවීම් කර මෙම ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කිරීමට 2021 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම නිසා මෙම යන්ත්‍ර සූත්‍ර කොන්ත්‍රාත්කරු ඉවත් කරගෙන ගොස් තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු හා උපදේශක සමාගමේ භාවිතයට අමානෝ තහඩු යොදා ඉදිකළ තාවකාලික ගොඩනැගිලි 02 ක් සහ උපදේශක සමාගම විසින් පාවිච්චි කළ ආපන ශාලාවක් ව්‍යාපෘතියට භාර දී තිබුණි. මෙම භාරගත් ගොඩනැගිලි ස්වාධීන කමිටුවක් යොදා තක්සේරු කර භාරගෙන නොතිබූ අතර, භාරගත් ගොඩනැගිලි 2023 සැප්තැම්බර් 01 දින සිට මාස 06 ක් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂණ සමාගමක සේවය ලබා ගැනීම වෙනුවෙන් රු. මිලියන 3.57 ක් වැයකර තිබුණි.

(iv) සියයට 2.97 ක ඉදිරිකිරීම් ප්‍රගතියක් පමණක් වාර්තා කර තිබූ කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණද මහකිතුල හා මහකිරුල ජලාශ ඉදිකිරීම සහ ඒ අතර පිහිටි මහදඹේ ජලාශය වැඩි දියුණු කිරීම සඳහා අක්කර 778 ක කැලෑ ප්‍රදේශයක පිහිටි ගස් 47,552 ක් රාජ්‍ය දැව සංස්ථාව විසින් කපා ඉවත් කර තිබුණි.

(v) කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වනවිට මහකිතුල ජලාශයේ වැව් බැම්ම සකස් කිරීම සඳහා අත්තිවාරම් කපා මැටි දමා අදාළ වැව් බැම්මේ සියයට 1.5 ක වැඩ නිමකර තිබූ අතර ඒ සඳහා රු. මිලියන 58.2 ක වියදමක් දරා තිබුණි. එම රු. මිලියන 58.2 ක ඉදිකිරීම් අධීක්ෂණය වෙනුවෙන් උපදේශන සමාගමේ කාර්ය මණ්ඩල වැටුප්, කාර්යාල වියදම් හා වාහන නඩත්තුව සඳහා රු. මිලියන 139 ක් වැයකර තිබුණි.

(vi) මේ වන විට ඉදිකිරීම් අතරමහ නතරව ඇති කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට සැලසුම් සකස් කර නොතිබුණු අතර මහකිතුල පිවිසුම් උමඟ හා අනුබද්ධ ඇළ මාර්ගය පමණක් රු. මිලියන 2,742 ක දේශීය අරමුදල් යොදවා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ සිදු කිරීමට 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර, වැඩසටහනේ අදියර 03 සඳහා ණය ගිවිසුම් අත්සන් කිරීමට 2024 මැයි 31 දින දක්වා කටයුතු කර නොමැති අතර 2019 – 2023 කාලය තුළ නිමකල යුතු වයඹ ඇළ ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත් 03 ක් මේ දක්වා ආරම්භ කිරීමට හෝ නොහැකි වී තිබුණි.

(ඒ) 2024 දෙවන කාර්තුවේ අදියර 03 සඳහා ලබා දීමට යෝජිත ඇ. ඩොලර් මිලියන 93 ක මුදල යොදවා උතුරු මැද පළාත් ඇළෙහි උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදවා ගෙන සිදුකරන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව, මහවැලි කලාප වල ගොවීන් සඳහා කෘෂිකාර්මික යෙදවුම් ලබා දීම සහ මෙහෙයුම් වියදම් දැරීම පමණක් සිදු කිරීමට යෝජිතව ඇත. ඒ අනුව, මෙම වැඩසටහනේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට කාලවකවානු තීරණය කර හෝ ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිළිබඳ නිශ්චිත සැලසුමක් සකස් කර නොමැති වීම නිසා ශ්‍රී ලාංකීය ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

3.2.2 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන අදියර 02

(අ) උතුරු මැද පළාත් ඇළෙහි කෝඳුරුවාව සිට නාමල්පුර දක්වා කි.මී, 27.7 දිග උමං ඇළ ඉදිකිරීම.

(i) උක්ත ඉදිකිරීමේදී මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය, සීගිරිය අභය භූමිය, මින්නේරිය ජාතික උද්‍යානය හා හුරුළු වැව රක්ෂිතය තුළදී ඇළ ඉදිකිරීම පොළව ඇතුලතින් පමණක් Cut & Cover, double Conduit හෝ tunnel යන ක්‍රමවේද යොදාගෙන ඉදිකරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. එසේ වුවද මෙහිදී තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන ක්‍රමවේදය ලෙස පිරිවැය අධික ක්‍රමයක් වූ උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදාගෙන කැණීම් කිරීමේ ක්‍රමවේදය තෝරා ගෙන තිබුණි.

(ii) කැණීම් සඳහා අවශ්‍ය 1 වන උමං විදුම් යන්ත්‍රය චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක එකඟ වූ සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමලය වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 2,155.97 ක් වී තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය සිට නාමල්පුර දක්වා යන්ත්‍රය ප්‍රවාහනය කර එකලස් කිරීම ලාභය වෙනුවෙන් රු. මිලියන 4,535ක විශාල මුදලක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වසර 2½ ක් ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2027 මාර්තු 10 දක්වා දීර්ඝ වී තිබුණු අතර 2025 ජූනි මාසයේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට Drill & Blasting ක්‍රමය යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ කි.මී. 10.4 ක් වූ දුර ඉදිකිරීම සඳහා දෙවන උමං විදුම් යන්ත්‍රයක් යොදවා ගෙන තිබුණි.

(iv) උපදේශන සමාගම විසින් උමං විදුම් යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, වැඩබිම වෙත ප්‍රවාහනය කර සවි කිරීම සඳහා පිරිවැය ලෙස රු. මිලියන 7,255.40 ක් ඇස්තමේන්තු කර තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු. මිලියන 6,690.97 ක මිලක් ඉදිරිපත් කර තිබුණි. මෙම යන්ත්‍ර 2 ආනයනය කිරීමේදී ව්‍යාපෘතිය වෙත ඉදිරිපත්

කර තිබූ ඉන්වොයිස් පත්‍ර 2 අනුව එම යන්ත්‍ර 02 හි CIF වටිනාකම් පිළිවෙළින් ඇ.ඩො. 10,581,673 (රු.මිලියන 2,147.97) ක් සහ ඇ.ඩො. 9,476,342 (රු. මිලියන 3,523.61) ක් එනම් එකතු වටිනාකම රු. මිලියන 5,671.58 ක් විය. ඒ අනුව උපදේශක සමාගම විසින් ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී මෙවැනි යන්ත්‍රයක වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබා නොගෙන මෙම අයිතමය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(v) 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කළ තාක්ෂණ ඇගයීම් කමිටුවම නිර්දේශ කර නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම් විසින් විශේෂ තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් යෝජනාවේ ශක්‍යතාවය සැක සහිත වන බවත් කොන්ත්‍රාත්තුව සඳහා අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබිය දී එම කමිටුවේ තීරණය පිළිගැනීමට කටයුතු කර නොතිබූ අතර නැවත පත්කළ විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට නිර්දේශය ලබා ගෙන තිබුණි. එහිදී කමිටු 2ක් මිලදිගැනීම ප්‍රතික්ෂේප කළ බව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.

(vi) 02 වන උමං විදුම් යන්ත්‍රයද චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟව 2024 මාර්තු 15 වනවිට එයින්, රු. මිලියන 6,021.87 ක් ගෙවා තිබුණි. උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමල වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 3,635.61 ක් වී තිබුණි. ඒ අනුව, ත්‍රිකුණාමලය සිට කෝදුරුවාව දක්වා යන්ත්‍ර ප්‍රවාහනය කර එකලස් කිරීම වෙනුවෙන් රු. මිලියන 3,055.36 ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.

(vii) කොන්ත්‍රාත්තුව අවසානයේ විදුම් යන්ත්‍ර 2 ගලවා වරාය දක්වා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. මිලියන 179.99 ක් ප්‍රමාණ පත්‍රයට ඇතුල් කර තිබුණි. ඒ අනුව රු. මිලියන 13,381.94 ක් වටිනා යන්ත්‍ර 2 වෙනුවෙන් වැයකළ පිරිවැයෙන් කොටසක් හෝ මුදලක් තක්සේරු කර නැවත ලබා ගැනීමට ගිවිසුම් මඟින් එකඟ වී නොතිබූ අතර යන්ත්‍ර 2 කිසිදු අයකිරීමක් රහිතව මෙරටින් රැගෙන යාමට එකඟ වී තිබුණි.

(viii) කි.මී. 27.7 දිග උමං ඇල මාර්ගය කැණීම් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට 21% ක් විය. කොන්ත්‍රාත්තුවේ සිදුවන මිල විචලන සඳහා ගෙවීමට රු. මිලියන 3,001.79 ක් වෙන් කර තිබුණත් 2023 ජූනි 30 වන විටත් එයින් රු. මිලියන 2,592.14 ක් වැය කර තිබුණි.

(ix) 2022 නොවැම්බර් 22 ආනයනය කරන ලද 2 වන උමං විදුම් යන්ත්‍රය 2023 මාර්තු සිට 2024 මාර්තු දක්වා තාවකාලිකව ක්‍රියාත්මක නොකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණි. යන්ත්‍රය සවිකිරීමෙන් පසු 2023 මාර්තු සිට මාස 8 ක කාලයක් නිෂ්කාර්යව තිබී 2023 නොවැම්බර් 23 සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු අතර, එදින සිට 2024 පෙබරවාරි 29 දින දක්වා මාස 3 ක කාලයකට ප්‍රගතිය මීටර් 399.91 ක අවම මට්ටමක තිබුණි.

(x) උමං මාර්ගයේ දුර්වල පාෂාණ තිබෙන ස්ථාන වලට කොන්ක්‍රීට් වළලු (Ring) යෙදීම සඳහා එම වළලු සකස් කිරීමේ කම්හලක් හා ගබඩාවක් ඉදිකිරීමට පිළිවෙළින් රු. මිලියන 928.72 ක් රු. මිලියන 149.82 ක්ද සහ එම වළලු සකස් කිරීමට රු. මිලියන 2,892.3 ක් ද වන පරිදි ගිවිසුම්ගත වී තිබුණි. මෙම කම්හලේ නිෂ්පාදනය කර 2024 ජනවාරි 31 දිනට උමං මාර්ගයේ සවිකරන ලද කොන්ක්‍රීට් වළලු 2,967 න් වළලු 1,298 ක් එනම් සියයට 44 ක් විවිධ ස්ථාන වලින් පුපුරා තිබුණු බවට හඳුනාගෙන තිබුණි.

(xi) උතුරු මැද පළාත් ඇල ඉදිකිරීම මඟින් මහකනදරාව ජලාශයට ලබා ගන්නා ජලයෙන් රඹෑව, මැදවච්චිය ප්‍රදේශයට පානීය ජලය සැපයීම සඳහා රු. මිලියන 11,515ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජ්‍යායතන ආධාර මත අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර එහි වැඩ කටයුතු නිම වීමට ආසන්න මට්ටමක පැවතුණද, උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නියමිත කාලය තුල ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ ජලය මහකනදරාව ජලාශයට ලැබෙන තෙක් මෙම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි මට්ටමක පැවතුණි.

(xii) උතුරු මැද පළාත් ඇළ ඉදිකිරීමට පවරාගත් ඉඩම් සඳහා වන්දි ගෙවා තිබූ අතර තවදුරටත්, ඉඩම් කට්ටි 259 ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 40ක් පවරා ගත යුතුව පැවතුණි. තවද, වන්දි ගෙවන ලද ඉඩම් කට්ටි 385 ක ඉඩමේ හුක්තිය ඉඩම් හිමියන්ගෙන් භාර ගෙන වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පවරා ගැනීම මේ දක්වා සිදු කර නොතිබුණි.

(xiii) මොරගහකන්ද ජලාශයේ සිට කන්දරා ඔය දක්වා කි.මී. 96 ක් දුරට ගමන් කරන උතුරු මැද පළාත් ඇළෙහි කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය පමණක් 2025 වර්ෂයේ වැඩසටහන අවසන් වනවිට නිම කිරීමට මේ වන විට සැලසුම් කර ඇත. මේ නිසා කි.මී. 68.3 වූ ඉතිරි ඇල මාර්ගය ඉදිකර එහි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් විගණිත දිනය වන තුරු ඉදිරිපත්ව නොතිබුණි.

(ආ) 2018 වර්ෂයේදී රු. මිලියන 7,146.91 ක වටිනාකමට පිරිනමා තිබූ කළුගඟ - මොරගහකන්ද යා කරන උමං ඇළ මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2021 සැප්තැම්බර් 10 දින නිමකල යුතු වුවත්

නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වීම නිසා 2023 දෙසැම්බර් 21 දක්වා දීර්ඝ කර තිබුණි. නමුත්, එදිනට ද ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් විය.

(ඇ) ව්‍යාපෘතිය විසින් 2022 වර්ෂයේ මිලදී ගත් පොහොර තොගයක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පොහොර සමාගම් 02 කට භාරදී තිබූ අතර එහිදී රු.මිලියන 55.23 ක් වටිනා පොහොර මෙට්‍රික් ටොන් 161.5 (බෑග් 3,230) ක ඌණතාවයක් ඇති වී තිබුණි. මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ පරීක්ෂණ කමිටුවක් මඟින් වරාය අධිකාරියේ වාර්තා නැවත නිවැරදි කර එම නිවැරදි වාර්තා පදනම් කරගෙන සැපයුම්කාර සමාගමෙන් ඌණතාවය අයකර ගැනීමට නිර්දේශ කර තිබුණත්, එම අලාභය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) දේශීය කෘෂිකාර්මික භෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ මහවැලි කලාප 5 ක හා හුරුළු වැව ප්‍රදේශවල ගොවීන්ට දෙමුහුම් මිරිස් බීජ දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා Poly Tunnel ඒකක 50 ක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතියක් රු.මිලියන 91.57 ක කොන්ත්‍රාත් වටිනාකමකට ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු Poly Tunnel සකස් කිරීම සම්බන්ධ පෙර පළපුරුද්දක් ලබා නොතිබුණු අතර, 2018-2020 කාලය තුල අලාභ ලබා 2021 කාලය තුල පමණක් ලාභයක් ලැබූ සමාගමක් විය. 2023 මැයි 15 දිනට වැඩ නිම කිරීමට එකඟ වී තිබුණද 2024 අප්‍රේල් 30 දින වන විටත් Poly Tunnel 42 ක් පමණක් සවිකර තිබුණ අතර 2024 මැයි 31 දක්වා අවස්ථා තුනකදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

වාරිමාර්ග අමාත්‍යාංශය නමින් වාහන 654 ක් ලියාපදිංචි වී තිබුණද අමාත්‍යාංශයේ වාහන ලේඛනය අනුව අමාත්‍යාංශයට අයත් හා පරිහරණය කරනු ලබන වාහන සංඛ්‍යාව 74 ක් විය.

(i) ඒ අනුව අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වූ වාහන 580 ක් විගණිත දින වන විට අමාත්‍යාංශය භාරයේ නොපැවතුණි.

(ii) ප්‍රවාහන අංශයේ පාලනය හා මෙහෙයවීම යටතේ පවතින වාහන 74 අතරින් වාහන 46 ක් සංචිත වාහන ලෙස හා 28 ක් නිළ වාහන ලෙස වෙන් කර තිබුණි. ඉන් සංචිත වාහන 28 ක 2023 දෙසැම්බර් 31 දිනට මයිලෝමීටරයේ පාඨාංක සඳහන් කර නොතිබුණු අතර ඇතැම් සංචිත වාහන සඳහා රියදුරෙකු ස්ථිරව අනුයුක්ත කරද නොතිබුණි. ඒ අනුව වාහන පාලනයේදී මු.රෙ. 1645 හා 1646 විධිවිධානයන්ට අනුකූලව කටයුතු කර නොතිබුනු අතර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි 654 ක් වූ වාහන හා ලියාපදිංචිය අත්‍යාවශ්‍ය නොවන යන්ත්‍රෝපකරණ පිළිබඳ නඩත්තුව, අළුත්වැඩියාවන්, භූවමාරුව, ඉන්ධන භාවිතය, තාවකාලික මාරුකිරීම, භාරයේ පැවතීම ආදී

තොරතුරුද ඇතුලත් පරිගණක ගත දත්ත පද්ධතියක් හා නිසි කළමණාකරණයක් සහිත ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iii) අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු නොලබන වාහන 580 අතරින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත වාහන 43ක්, මහවැලි අධිකාරිය වෙත වාහන 253ක්, බලශක්ති අමාත්‍යාංශය වෙත වාහන 04ක්, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත වාහන 28 ක් නිදහස් කර දිගු කාලසීමාවක් ගතවී තිබුණද ඒවායේ අයිතිය එම ආයතන වෙත පැවරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද එම ආයතන භාරයේ පවතින බවට වාර්ෂිකව සනාථ කර ගැනීමක්ද කර නොතිබුණි.

(iv) මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබූ වාහන 253 න් වාහන 16 ක් මහවැලි අධිකාරිය භාරයේ නොපැවතුනු අතර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ලේඛන ගතකිරීමකින් තොරව වාහන විවිධ අංශය විසින් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඩබල් කැබ් රථ 11ක් DSDP/තණමල්විල MASL වෙත ලබා දී තිබුණද මහවැලි අධිකාරියේ සංවිධාන ව්‍යුහය තුල එවැනි කලාප කාර්යාලයක් තණමල්විල පිහිටා නොතිබුණි, ඒ අනුව එම ඩබල් කැබ් රථ 11 කවරෙකු භාරයේ පවතීද යන්න තහවුරු නොවුණි.

(v) අමාත්‍යාංශ ලේකම් නමින් පැවති අංක 56–8184 දරන කැබ් රථය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මහවැලි අධිකාරිය විසින් 2023 වර්ෂයේදී වෙන්දේසි කර තිබූ අතර එහි ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කරද නොතිබුණි.

(vi) වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ වාහන 43 අතරින් අංක PB-7563 දරන ඩබල් කැබ් රථය වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරයේ නොපවතින බව එම දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ අනාවරනය කර තිබුණි.

3.4 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති වාහන අනතුරු 2 කට අදාළව එකතුව රු.10,561,210 ක් ශේෂයක් වූ අතර, ඉන් අංක WPPG 0456 දරන වාහනයේ සිදුවූ අනතුරට අදාළව සිදුව තිබූ අලාභය රු. 10,482,500ක් 2023 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. අනතුර සිදු වන අවස්ථාවේදී රියදුරු මත්පැන් පානය කර වාහනය ධාවනය කර තිබූ බැවින් රක්ෂණ ආයතනය හිමිකම ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ අතර මු.රෙ.104 පරීක්ෂණයෙන් වගකිවයුතු පාර්ශවය වූ රියදුරු වෙතින් අලාභය අයකර ගැනීම නිර්දේශ කර තිබුණි. ඒසේ වුවද එම අලාභය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පටිපාටිය, මුදල් රෙගුලාසි 135 ප්‍රකාර මූල්‍ය පාලනය සම්බන්ධව කාර්යයන් පැවරීමට අනුකූල නොවන බැවින් එම පටිපාටිය නිවැරදි කරන ලෙස 2011 මාර්තු 22 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට නියෝග කර වසර 13ක් ගත වී තිබුණද 2024 මැයි 31 වන විටත් නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ජපාන රජයේ ආධාර යටතේ 2003–2013 කාලසීමාව තුල ක්‍රියාත්මක කර තිබූ නිවත්කම් දනන් බලගැන්වීමේ (PEACE) ව්‍යාපෘතියේ 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව නිකුත් කර වසර 10ක් ගතවී ඇතත් ඒ මගින් පෙන්වා දී ඇති වත්කම් පරිපාලනයේ පැවති දුර්වලතා පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. එම නිරීක්ෂණ සම්බන්ධව JICA ආයතනය විසින් නිරවුල් කිරීමේ සහතිකපත් ඉල්ලා වසරක් ගතවී ඇතත් ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජල බවුසර්, කැබ් රථ හා ශීතකරණ කැබ් රථයේ පැවැත්ම හා භාවිතය පිළිබඳ විශ්වාසනීය තොරතුරු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් අදාල නිරවුල් කිරීමේ සහතික නිකුත්කිරීමට නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් ජපාන රජයේ ණය ආධාර මුදල් එකවර පියවීමට ශ්‍රී ලංකා රජයට සිදුවන තත්වයක් නිර්මාණය වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සම්පත් භෝජනා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව සමාගම් රාජ්‍ය පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂයන් කැඳවීමට 2022 පෙබරවාරි 28 දින 2022/338/5117 අංක දරන තීරණය මඟින් අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. අදාල ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව 2024 අප්‍රේල් 22 දින වනවිට සුදුසු ව්‍යාපෘති තෝරා ගතයුතු වුවත්, එම කටයුතු නිමකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ද ඇවර කිරීමට තීරණය කර තිබුණද, විගණිත දින වූ 2024 මැයි 31 වන විටද ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

වාරිමාර්ග අමාත්‍යාංශයට 2018 වර්ෂයේදී අනුයුක්ත කර තිබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III පන්තියේ නිලධාරියෙකු වෙත අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන), අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) වශයෙන් අමාත්‍යාංශයේ තනතුරු දෙකක්ද, ඒ යටතේ පවතින සමාගමක ප්‍රධාන විධායක නිලධාරි හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහ අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘතියක ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස වශයෙන් තනතුරු 4 ක වගකීම් පවරා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා උක්ත නිලධාරියා 2018 සැප්තැම්බර් 15 දින සිට පත්කර තිබුණද ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(ii) කළමණාකරණ සේවා වක්‍රලේඛ අංක 01/2019 හි 2:3:2 වගන්තිය අනුව ව්‍යාපෘතියක, ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා පූර්ණකාලීන පදනම් මත නිලධාරියෙකු පත් කළ යුතු වුවද දේශගුණ විපර්යාසයන්ට අනුගුරුවීමේ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා 2020 සැප්තැම්බර් 29 දින සිට වැඩ බැලීමේ පදනම් උක්ත නිලධාරියා පත්කර තිබුණි.

(iii) අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සමාගමක් ලෙස මහවැලි උපදේශන කාර්යාංශය ස්ථාපනය කර තිබුණි. රජයේ සේවයේ තනතුරක සිටියදීම එවැනි ආයතනයක තනතුරක් දැරීම සඳහා ප්‍රතිපාදන නොමැති අතර රාජ්‍ය සේවා කොමිසම් සභා කාර්ය පටිපාටි රීති ප්‍රකාරව එවැනි ආයතනයක සේවයට රජයේ නිලධාරියෙක් තාවකාලිකව හෝ ස්ථිරව හෝ රජයේ සේවයෙන් මුදාහැරිය යුතුවේ. කෙසේ නමුත් මෙම නිලධාරියා රජයේ සේවයේ තනතුරක සිටියදීම මහවැලි උපදේශන කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස පත් කර තිබුණි.

එම්.ඩී.සුදර්ශනී අමරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.